**2017 වර්ෂය සඳහා**
**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ**
**කාර්ය සාධන වාර්තාව**

**ආචාර්ය ඒ.ජේ. සතරසිංහ**
**අධ්‍යක්ෂ ජනරාල්**

தொகைமதிப்பு புள்ளிவிபரத் திணைக்களத்தின்
**2017** ஆம் ஆண்டுக்கான
செயலாற்றுகை அறிக்கை

கலாநிதி ஏ.ஜே. சத்தரசிங்க
பணிப்பாளர் நாயகம்

# PERFORMANCE REPORT
# OF THE
# DEPARTMENT OF CENSUS AND STATISTICS
# FOR THE YEAR 2017

**Dr. A.J. Satharasinghe**
**DIRECTOR GENERAL**

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ ජාතික සංඛ්‍යාන ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වන්නේ රජයට සහ වෙනත් දත්ත භාවිතා කරන්නන් හට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාලේඛන රැස් කිරීම හා ප්‍රචලිත කිරීමයි. මෙරට ප්‍රජා විද්‍යාත්මක, සමාජ ආර්ථික තත්වයන්ගේ විවිධ අංශයන්හි දත්ත රැස් කිරීම සහ සම්පාදනය කිරීමේ වගකීම ඇතුළුව සංඛ්‍යාන සේවයේ අවශ්‍ය වන්නා වූ රාජ්‍ය ආයතන සඳහා වෘත්තීය මට්ටමේ නිලධාරීන් පුහුණු කිරීමේ හා අනුයුක්ත කිරීමේ කටයුතු ද එයට පැවරී ඇත. එයට අමතරව සංඛ්‍යාන කටයුතු සඳහා සහාය අවශ්‍ය ආයතනයන් සඳහා සංඛ්‍යාන උපදේශන සේවාවන් ද එමඟින් ලබා දෙයි.

ගත වූ වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් භාරගත් බොහෝ කාර්යයන් ඉතාමත් සාර්ථක අයුරින් නිම කිරීමට හැකි වීම සතුටට කරුණකි.

ඉකුත් වර්ෂයෙහි ආරම්භ කළ කාර්යයන් තව දුරටත් අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට බලාපොරොත්තු වන අතරම 2017 වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා වගකීමෙන් හා කැපවීමෙන් යුතුව වෙහෙස නොබලා කටයුතු කල දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත මාගේ අවංක ස්තුතිය පිරිනමමි. එසේම දෙපාර්තමේන්තුවේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සහයෝගය දුන් රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් ආයතන වෙත මෙන්ම මහජනතාව වෙතද මාගේ ස්තුතිය පිරිනමමි.




ආචාර්ය ඒ.ජේ. සතරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

"සංඛ්‍යාන මන්දිරය"

අංක 306/71, පොල්දූව පාර

බත්තරමුල්ල.

2018 මැයි

| | |
|---|---|
| දුරකථන අංකය | : +94 11 2147001 |
| ෆැක්ස් | : +94 11 2147011 |
| විද්‍යුත් ලිපිනය | : dgcensus@statistics.gov.lk |
| වෙබ් අඩවිය | : www.statistics.gov.lk |

# පටුන

පිටුව

1. හැඳින්වීම ........................................ 01

2. දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන් ........................................ 01

3. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශයන්හි කාර්ය සාධනය ........................................ 02

3.1 ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය ........................................ 02
3.2 කර්මාන්ත, ඉදිකිරීම්,වෙළඳ හා සේවා අංශය ........................................ 04
3.3 කෘෂිකර්ම හා පාරිසරික අංශය ........................................ 08
3.4 ජාතික ගිණුම් අංශය ........................................ 12
3.5 ප්‍රකාශන අංශය ........................................ 15
3.6 පුස්තකාල හා ප්‍රලේඛන අංශය ........................................ 17
3.7 නියැදි සමීක්ෂණ අංශය ........................................ 19
3.8 ක්ෂේත්‍ර කළමණාකරණ අංශය ........................................ 23
3.9 පුහුණු අංශය ........................................ 26
3.10 පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශය ........................................ 28
3.11 මිල හා වේතන අංශය ........................................ 30
3.12 සිතියම් විද්‍යා අංශය ........................................ 34
3.13 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ........................................ 35
3.14 දත්ත නිකුත් කිරීමේ ඒකකය ........................................ 37
3.15 මුද්‍රණ අංශය ........................................ 39
3.16 ආයතනික හා ගිණුම් අංශය ........................................ 41
3.16.1 පරිපාලනය ........................................ 41
I. අංශ හා ඒකක ........................................ 41
II. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල ........................................ 41
III. දිස්ත්‍රික් කාර්යාල ........................................ 41
IV. පළාත් සභාවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය ........................................ 42
V. කාර්ය මණ්ඩලය ........................................ 42
VI. විදේශ සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගීවීම - 2017 ........ 44
VII. උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයෑම් හා විශ්‍රාමයෑම් 49
3.16.2 ගිණුම් අංශය ........................................ 51
I. මූල්‍ය වාර්තාව - 2017 ........................................ 51
II. ප්‍රසම්පාදන අංශය ........................................ 53
3.17 අභ්‍යන්තර විගණන අංශය ........................................ 54

4.0 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන අංශයන්හි කාර්ය සාධනය 56
4.1 වාර්ෂික රැකීරක්ෂා සමීක්ෂණය ........................................ 56
4.2 සාමාන්‍ය ඉපැයීම් සහ වැඩ කල පැය ගණන පිළිබඳ සමීක්ෂණය ........................................ 56
4.3 පඩිපාලක සහා අවම වැටුප් දර්ශකාංකය ගණනය කිරීම ........................................ 56
4.4 කම්කරු සංඛ්‍යාති ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීම ........................................ 56
4.5 සේවක අර්ථසාධක අරමුදලට දායක වන නව ආයතන ලියාපදිංචි කිරීම ........................................ 57
4.6 අධ්‍යාපන සංඛ්‍යාති ........................................ 57
4.7 රේගු සංඛ්‍යාති ........................................ 57
4.8 වෛද්‍ය සංඛ්‍යාති ........................................ 57
4.9 ජීව සංඛ්‍යාති ........................................ 59
4.10 ධීවර සංඛ්‍යාති ........................................ 59

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2017

## 1. හැඳින්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව රටේ සංවර්ධනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත සැපයීම සඳහා වූ වගකීම් දරණ මධ්‍යම රජයේ ආයතනයක් වේ. තවද, ශිෂ්‍යයන්ගේ සිට ජාත්‍යන්තරය දක්වා දත්ත භාවිතා කරන්නන් ගේ ඉල්ලුම සඳහා වූ පුළුල් පරාසයක දත්ත අවශ්‍යතාව දෙපාර්තමේන්තුව සපුරාලනු ලැබේ. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ පදනම්ව ආර්ථිකයේ කෘෂිකර්මය, කර්මාන්ත, වෙළඳාම, ජනගහනය, ජාතික ආදායම හා අනෙකුත් ප්‍රජා විද්‍යාත්මක තොරතුරු කාලීනව රැස් කිරීම තුලින් ඉහත අවශ්‍යතා ඉටු කර දීමට දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කටයුතු කරයි.

### දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුලින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

### මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

## 2. දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන්

දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන් පුළුල් වශයෙන් පහත දැක්වේ.

2.1 දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

2.2 මෙරට සමාජ ආර්ථික දත්ත එක්රැස් කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් ඉටු කල අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

2.3 ඇතැම් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

# 3. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශයන්හි දායකත්වය හා 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කවලට අනුකූලව කාර්ය සාධනය පහත පරිදි වේ.

## 3.1 ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය

**I. ප්‍රජාවිද්‍යා සංඛ්‍යාති**

• ජනගහන දත්ත පිළිබඳව පාර්ලිමේන්තුව, රාජ්‍ය අංශයේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අර්ධ රාජ්‍ය ආයතන, පුද්ගලික අංශයේ ආයතන, පර්යේෂකයන්, සිසුන්, ඇතුළු දත්ත භාවිතා කරන්නන්ගේ ඉල්ලීම් සඳහා තොරතුරු ලබා දීම නිතිපතා සිදු කරන ලදී.

• ජන හා නිවාස සංගණනය -2021 හි සැලසුම් කටයුතු ආරම්භ කරන ලදි. මෙහෙයුම් කමිටුව, ප්‍රශ්නාවලිය සැකසීමේ හා ක්‍රමවේදය සැකසීමේ උප කමිටු පත් කරන ලද අතර ක්‍රමවේදය පිළිබඳ මූලික කෙටුම්පත් වාර්තාව සකස් කර ඇත. එමෙන්ම ප්‍රශ්නාවලියෙහි මූලික කෙටුම්පත සකස් කරන ලදී.

• සංගණනය සඳහා වන වියදම් ඇස්තමේන්තු කෙටුම්පත සැකසෙමින් පවතී.

• සංඛ්‍යාලේඛන ආඥා පනතෙහි මූලික කෙටුම්පත සකස් කර ඇත.

• සංගණන ඒකක ලැයිස්තුගත කිරීමේ ආකෘතියෙහි කෙටුම්පත සඳහා නාගරික, ග්‍රාමීය සහ වතු අංශ ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක 6ක් තුළ පූර්ව පරීක්ෂාව සිදු කරන ලදී.

• සංඛ්‍යාන සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා කොළඹ, පුත්තලම සහ ගම්පහ දිස්ත්‍රිකයන්හි රජයේ සේවකයන් මෙන්ම සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙහි සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයට අයත් නොවන අනෙකුත් නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. එමෙන්ම ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය ඉහළ යාම හා මතු විය හැකි සමාජ ආර්ථික ප්‍රවණතා පිළිබඳ රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.

• නාගරික අංශය සඳහා නව අර්ථ දැක්වීමක් හඳුන්වා දී මෙයට අදාළ තොරතුරු මේ වන විට එක්රැස් කර ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගෙන ඇත.

**II. SARA සමීක්ෂණ**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීමට අනුව ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවයේ දැනට පවතින පහසුකම් සහ සේවා සැපයීම සමීක්ෂණය(SARA) සිදු කරන ලදී. ඒ සඳහා නිලධාරීන් පුහුණු කිරීම, ක්ෂේත්‍රය තුළ දත්ත රැස් කිරීම, රැස්කල දත්ත පද්ධතිය සකස් කිරීම හා අදාළ දත්ත වගු ලබාදීම සිදු කර අවසන් කර ඇත.

**III. ප්‍රජා විද්‍යාත්මක සහ සෞඛ්‍ය සමීක්ෂණය**

• ප්‍රජාවිද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණයේ අවසන් වාර්තාව 2017 සැප්තැම්බර් මස 18 වන දින ප්‍රකාශයට පත් කරන ලදී. එය දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ද පල කර ඇත.

• දත්ත භාවිත කරන්නන් සඳහා ද දත්ත ගොනු නිකුත් කරන ලදී.

IV. **ජාත්‍යන්තර ආයතන සඳහා දත්ත ලබාදීම**

එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තර ආයතන වෙත දත්ත ලබාදීම දත්ත ඉල්ලීම් අනුව සිදු කර ඇත.

V. **විදේශීය රටවල ඉල්ලීම පරිදි පුහුණු පාඨමාලා පැවැත්වීම**

නේපාල සංඛ්‍යාන ආයතනයෙහි නිලධාරීන් සඳහා ශ්‍රමබල සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන ජූලි මාසයේදී ද, ආර්ථික සංගණනය පිළිබඳ පුහුණු වැඩසටහන සැප්තැම්බර් මාසයේදී ද පවත්වන ලදී.

VI. **තිරසාර සංවර්ධන අභිමතාර්ථ දර්ශක**

දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු තුල පිහිටා ඇති සංඛ්‍යාලේඛන අංශ මගින් රැස් කරනු ලබන දත්ත පදනම් කර ගනිමින් ගණනය කරන ලද දර්ශකයන් 46 ක් ඇතුලත්ව " ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන දර්ශක පිළිබඳ වාර්තාව" 2017 ජූලි මස 26 දින එළිදක්වන ලදි. එයට සමගාමීව තිරසර සංවර්ධන අභිමතාර්ථ සම්බන්ධව වෙබ් අඩවියද දියත් කරන ලදි.

VII. **සාර්ක් සංඛ්‍යාලේඛන**

සාර්ක් සංඛ්‍යාලේඛන සඳහා අදාල වන දත්ත ලබා දීම සිදු කර ඇත.

## මූල්‍ය කාර්ය සාධනය - 2017

| අනු අංකය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලි.) | 2017/12/31 දක්වා වැයකරන ලද මුදල (රු. මිලි.) |
|---|---|---|---|
| 1 | සංඛ්‍යාන සාක්ෂරතාව ඉහළ නැංවීමේ වැඩසටහන | 0.45 | 0.442 |
| 2 | සංගණන ඒකක ලැයිස්තුගත කිරීම (F1) | 0.3 | 0.3 |

## 3.2 කර්මාන්ත, ඉදිකිරීම්,වෙළඳ හා සේවා අංශය

### I. ත්‍රෛමාසික කාර්මික නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණය - 2016/ 2017

ශ්‍රී ලංකාවේ කාර්මික නිෂ්පාදන කර්මාන්තයන්ගේ නිෂ්පාදිතයෙහි හැසිරීම ත්‍රෛයිමාසිකව ඇස්තමේන්තු කිරීමේ අරමුණින් ත්‍රෛමාසික කාර්මික නිෂ්පාදන සමීක්ෂණය පවත්වනු ලබයි. නියැදි ආයතන 444 කින් නිමැවුම හා වටිනාකම පිළිබඳ මෙහිදී දත්ත රැස්කරනු ලබයි.

2017 වර්ෂය සඳහා දළ ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමේදී 2016 අවසන් කාර්තුවේ සහ 2017 මුල් කාර්තු තුනෙහි ත්‍රෛමාසික කර්මාන්ත සමීක්ෂණයෙහි ගණනය කරන ලද ඇස්තමේන්තු අගයන් උපයෝගී කර ගනුලබයි.

අප දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය මඟින් මෙම සමීක්ෂණයට අදාල දත්ත අන්තර්ජාලය හරහා ලබා ගැනීම සඳහා පරිගණක ගත දත්ත පද්ධතියක් සකස් කරමින් පවතී. ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණ වැඩසටහන්අවම කිරීම සහ තොරතුරු ලබානොදෙන ආයතන ප්‍රමාණය අවම කිරීම මෙමඟින් බලාපොරොත්තු වේ.

### II. වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය

රටෙහි කර්මාන්ත අංශයේ දිශානතිය සහ ප්‍රගතිය හඳුනා ගැනීමේ අරමුණින් දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය සිදු කරනු ලබයි. 2016 වර්ෂයේ වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය සඳහා යොදාගත් නියැදිරාමුව 2013/14 ආර්ථික සංගණනයට අනුව සකස් කරන ලදී. 2016 වර්ෂය තුළ සිදුකරනු ලැබූ වාර්ෂික කර්මාන්ත සමීක්ෂණයේ පදනම් වර්ෂය ලෙස 2015 වර්ෂය යොදා ගැණුන අතර එය අප රටෙහි 30 වෙනි වාර්ෂික කර්මාන්ත සමීක්ෂණයයි.

එක්සත් ජාතීන් විසින් භාවිතයට ගැණෙන අන්තර් ජාතික කර්මික වර්ගීකරණයේ හතර වන සංශෝධනයට අනුව සකස් කරන මෙම වාර්ෂික කර්මාන්ත සමීක්ෂණයට අනුව කර්මාන්ත ප්‍රධාන කොටස් හතරක් යටතේ වර්ග කර ඇත.

1) පතල් හා කැණීම්

2) නිෂ්පාදන

3) විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සමීකරණ සැපයුම

4) ජලය එක්රැස් කිරීම්, අපද්‍රව්‍ය බැහැරකිරීම, ප්‍රතිකාරක යෙදීම හා සැපයීම

2017 වර්ෂය තුළදී, විධිමත් කර්මාන්ත සඳහා අවසන් වාර්තාව 2017.06.20 වන දින නිකුත් කරනු ලැබූ අතර 2016 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණ වාර්තාව සඳහා දත්ත රැස්කිරීමේ කටයුතුවල නිරතවිය.

### III. වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය

වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණයේ එකතු කළ වටිනාකම් අගය සහ සේවා නියුක්තිකයන් පිළිබඳව සංඛ්‍යාත දත්ත ලබාගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලැබේ. 2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලැබුයේ 18 වැනි ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණයයි. ඉදිකිරීම් අංශයට අදාල සියලු ක්‍රියාකාරකම් ඇතුලත් වන ආකාරයට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සහ ආර්ථික සංගණනය 2013/14 යටතේ පෞද්ගලික , රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය යන සියලු අංශ ආවරණය වන පරිදි මෙම සමීක්ෂණය පවත්වනු ලබයි. නමුත් නිවැසියන් විසින් ඔවුනගේ අවශයතාවයන් සඳහා සිදුකරන ඉදිකිරීම් කටයුතු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

සහ ආර්ථික සංගණනය 2013/14 යටතේ ආවරණය නොවන නිසා මෙම ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය යටතේද ආවරණය නොවේ.

**IV. වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය - 2016/ 2017**

2013/14 ආර්ථික සංගණනය යටතේ හඳුනා ගනු ලැබූ වෙළඳ හා සේවා ආයතන අතරින් ආයතන 4000 ක නියැදි රාමුවකින් යුත් මෙම සමීක්ෂණය ප්‍රථම වරට 2016 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

මෙම සමීක්ෂණයේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ප්‍රමාණවත් තරම් යොදා ගතනොහැකි නිසා ප්‍රශ්නාවලි ආයතන වෙත තැපැල් කිරීම මඟින් දත්ත රැස් කිරීම සිදුකරණු ලැබීය. එමෙන්ම විශාල ආයතනවල වාර්ෂික ගිණුම් වාර්තා අන්තර් ජාලය හරහා බාගත කිරීම් සිදුකරමින් දත්ත රැස් කිරීම සිදුකරන ලදී. ඒ අනුව මෙම වාර්තාව පරිගණක පද්ධති භාවිතයෙන් තොරව සකස් කරන ලදී. එම අවසන් වාර්තාව 2018 වර්ශයේදී ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

2017 වර්ෂයේ වාර්ෂික කර්මාන්ත සමීක්ණයට අදාලව ප්‍රශ්නාවලි සකස් කිරීම , නියැදිය තේරීම හා නියැදි රාමුව යාවත් කාලීන කිරීම, උපදෙස් මාලාව නැවත සකස් කිරීම වැනි කටයුතු සිදු කර ඇත. තවද ප්‍රශ්නාවලි සහ උපදෙස් පත්‍රිකා දැනටමත් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවෙත යවා ඇත.

**V. ශ්‍රම ඉල්ලුම් සමීක්ෂණය**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ විශේෂ ඉල්ලීමකට අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රම ඉල්ලුම පිළිබඳ විශේෂ අවබෝධයක් ලබාගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරන ලදී. 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සියලු ආර්ථික කටයුතු ආවරණයවනසේ මෙම සමීක්ෂණය සිදු කරන ලදී.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් සාර්ථක පුහුණුවකින් පසුව නියැදිය ලෙස තෝරාගත් ආයතන 3500 කින් දත්ත රැස්කරන ලදී. මෙම සමීක්ෂණයේදී අපගේ නිලධාරීන් 89% ක ඉහල ප්‍රතිචාරයක් ආයතනවලින් ලබාගැනීමට සමත් වුණි. මෙහි අවසන් වාර්තාව අන්තර්ජාලය මඟින් ලබාගත හැකිය.

මෙම සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රම ඉල්ලුමෙහි හඳුනාගත් ප්‍රධාන පැතිකඩයන් පහත වගුව මඟින් නිරූපණය කර ඇත.

**වගුව 1 : ප්‍රධාන අංශ අනුව ශ්‍රම ඉල්ලුම**

| අංශය | විධිමත් | | අවිධිමත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කර්මාන්ත | 152,189 | 38.5 | 43,285 | 42.5 | 195,474 | 39.3 |
| ඉදිකිරීම් | 17,818 | 4.5 | 2,406 | 2.4 | 20,224 | 4.1 |
| කර්මාන්ත (ඉදිකිරීම් හැර) | 134,371 | 34.0 | 40,879 | 40.1 | 175,250 | 35.2 |
| වෙළඳ | 84,380 | 21.3 | 26,391 | 25.9 | 110,771 | 22.3 |
| සේවා | 155,878 | 39.4 | 32,142 | 31.6 | 188,020 | 37.8 |
| සංචාරක | 10,207 | 2.6 | 0 | 0.0 | 10,207 | 2.1 |
| සේවා (සංචාරක හැර) | 145,671 | 36.8 | 32,142 | 31.6 | 177,813 | 35.8 |
| වැවිලි අංශය | 3,037 | 0.8 | 0 | 0 | 3,037 | 0.6 |
| එකතුව | 395,484 | 100.0 | 101,818 | 100.0 | 497,302 | 100.0 |

### VI. කර්මාන්ත නිෂ්පාදන දර්ශකය ( IIP)

නිෂ්පාදන කර්මාන්ත ආවරණය වන පරිදි මාසික කර්මාන්ත දර්ශකය ගණනය කිරීම 2016 වර්ෂයේදී ආරම්භ කරනු ලැබිණි. එහිදී පදනම් වර්ෂය ලෙස 2015 වර්ෂය යොදා ගනු ලැබිණි. සෑම මාසයකටම අදාලව කර්මාන්ත නිෂ්පාදන දර්ශකය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් ප්‍රකාශකර ඇති දිනයන්ට අනුව අන්තර්ජාලයේ පල කරනු ලැබේ. එමෙන්ම මාස 3 කට වරක් මාසික කාර්මික නිෂ්පාදන දර්ශකය ඇතුළත් අත් පත්‍රිකාවක් නිකුත් කරනු ලැබේ.

### VII. ව්‍යාපාර නාමාවලිය (SBR)

ප්‍රධාන ආර්ථික සංඛ්‍යාති සකස්කිරීමේදී සංඛ්‍යානමය පහසුකම් සපයන මූලික අංගයක් වන්නේ ව්‍යාපාර සංඛ්‍යාන නාමාවලියයි. එය විවිධ ප්‍රදේශ වල පැතිරී ඇති විවිධ ව්‍යාපාර ඒකකවල සංඛ්‍යානමය අවශ්‍යතාවයන් උදෙසා නිරන්තරයෙන් යාවත් කාලීන වන සැලසුම්ගත දත්ත සමුදායක් වේ. රටෙහි පවතින පාලනමය අවශ්‍යතාවයන් අනුව ව්‍යාපාර නාමාවලිය හරහා විවිධ ප්‍රදේශවල, අමාත්‍යංශවල සහ පාලන අධිකාරී යටතේ ලියාපදිංචි වීම සඳහා පහසුකම් සපයා ඇත.

වර්තමානයේ පවතින ව්‍යාපාර නාමාවලිය ආර්ථික සංගණනයෙන් සකස්කරන ලද ආයතන ලැයිස්තුවක් වන අතර එය වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය සහ ත්‍රෛමාසික කර්මාන්ත සමීක්ෂණය මඟින් යාවත්කාලීන වී ඇත. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් විශාල පොදු සහ පෞද්ගලික ආයතන පරිගණක ගතකිරීම සිදුකරමින් පවතී. සමාගම් ලියාපදිංචි කර ඇත. තවද සෑම ව්‍යාපාරයක්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහ පළාත් ව්‍යාපාර ලියාපදිංචි කාර්යාල වල ලියාපදිංචි කරනු ලැබේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කර්මාන්ත අංශය මඟින් මේ වන විටත් එසේ ලියාපදිංචි වන ආයතන ලැයිස්තු ගෙන්වා දැනට සකස්කර ඇති ව්‍යාපාර සංඛ්‍යාන නාමාවලිය සමඟ සංසන්ධනය කරමින් පරිගණක ගත කරීම සිදුකරයි.

### VIII. ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය

ආයතන සමීක්ෂණ වලදී ප්‍රතිචාර ලබා ගැනීමේ දුෂ්කරතාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන ගැටළුවක් බවට පත් වී ඇත. එම නිසා ආයතන වලින් දත්ත රැස්කිරීමේ කටයුතු අධ්‍යනය කිරීම සඳහා ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණ වැඩ සටහනක් අප අංශය මඟින් හඳුන්වා දෙන ලදී. තොරාගත් ආයතන වෙතින් ප්‍රතිචාර මට්ටම වර්ධනය කිරීමත් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් දිරිමත් කිරීමත් මෙම වැඩසටහන යටතේ සිදු කරනු ලැබේ. කොළඹ, නුවර, නුවරඑළිය, අනුරාධපුර, මාතලේ සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වල මෙසේ ක්ෂේත්‍ර කටයුතු අධික්ෂණය කිරීමට අප අංශය මඟින් තීරණය කර ඇත.

# මූල්‍ය කාර්ය සාධනය - 2017

| අනු අංකය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලි.) | 2017/12/31 දක්වා වැයකරන ලද මුදල (රු. මිලි.) |
|---|---|---|---|
| 1 | ත්‍රෛමාසික කාර්මික නිෂ්පාදන පිළිබඳ සමීක්ෂණය හා කර්මාන්ත නිෂ්පාදන දර්ශකය | 0.86 | 0.41 |
| 2 | වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2016 | 0.16 | 0.16 |
| 3 | වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2017 | 0.5 | 0.23 |
| 4 | වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2016 | 0.2 | 0.15 |
| 5 | වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2017 | 0.23 | 0.10 |
| 6 | වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය - 2016 | 0.29 | 0.22 |
| 7 | වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය - 2017 | 0.71 | 0.30 |
| 8 | ශ්‍රම ඉල්ලුම් සමීක්ෂණය | 5.40 | 4.04 |
| 9 | ව්‍යාපාර නාමාවලිය (SBR) | 1.93 | 0.46 |
| 10 | ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය | 0.58 | 0.29 |

## 3.3 කෘෂිකර්ම හා පාරිසරික අංශය

### I. වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය

2016/2017 මහ කන්නය හා 2017 යල කන්නය සඳහා වී වගා කරන ලද බිම් ප්‍රමාණය, සාමාන්‍ය අස්වැන්න සහ මුළු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම මෙ මගින් සිදු කරන ලදී. මෙහිදී ජාතික මට්මමින් හා දිස්ත්‍රික් මට්ටමින් එක් එක් කන්නය තුළ වගා කරන ලද සහ අස්වැන්න නෙලා ගත් බිම් ප්‍රමාණයන් ගණනය කිරීම සහ සාමාන්‍ය අස්වැන්න සහ මුළු නිෂ්පාදනය ඇස්තමෙන්තු කිරීම සඳහා මෙම සමීක්ෂණ පවත්වන්නට යෙදුනි.

ඉහත සමීක්ෂණයට සමගාමීව වී වගාව පිළිබඳ උපාශ්‍රිත තොරතුරු වන එක් එක් වී වර්ග අනුව වගා කොට ඇති බිම් ප්‍රමාණයන් , බිම් සකස් කරන ලද ආකාරය, පොහොර භාවිතය, වල්නාශක භාවිතය වැනි විචල්‍යයන් පිලිබඳ දත්තයන්ද එක් රැස් කරන ලදී.

වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණයෙන් ලබා ගත් දත්ත විග්‍රහ කොට 2016/2017 මහ සහ 2017 යල කන්න සඳහා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන්ම, මහවැලි බල ප්‍රදේශ වල කුඩා කළමනාකරණ කොට්ඨාශ මට්ටමින්ද ඉහත දක්වන ලද සංඛ්‍යාතීන් පිළියෙල කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

### II. ගොඩගොවිතැන් සංඛ්‍යාලේඛන රැස් කිරීම (මහ/යල)-2017

කන්න මට්ටමින් මූලික දත්ත වාර්තාකරුවන්ගේ සහාය ඇතිව එක්රැස් කරනු ලබන උස්බිම්වල වගාකරන භෝගවල බිම් ප්‍රමාණය, නිෂ්පාදනයට අදාලව වාර්ෂිකව රැස් කරනු ලබන සංඛ්‍යාතීන් ද සංරංගගත කර රජයේ ප්‍රතිපත්ති සම්පාදකයින් හා අනෙකුත් ආයතනවලට දත්ත ලබාදීමට කටයුතු කළ අතර එම දත්ත වෙබ් අඩවියටද ඇතුලත් කරන ලදී.

මෙහිදී. ස්ථිර භෝග සහ කාලීන භෝග යටතේ සුළු අපනයන බෝග, පළතුරු, .එලවළු, ධාන්‍ය වර්ග හා රනිල භෝග ඇතුළුව භෝග වර්ග 60 ක් පමණ ආවරණය වන පරිදි වගා කරන ලද බිම් ප්‍රමාණය සහ නිෂ්පාදනය 2016/2017 මහ සහ 2017 යල කන්න සඳහා ඇස්තමේන්තු කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබීය.

### III. පශුධන සම්පත් පිළිබඳ සංඛ්‍යාලේඛන රැස් කිරීම- 2017

2017 වර්ෂයේ දී සත්ත්ව සංඛ්‍යාති වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සතුන් ඇති කරනු ලැබූ සියලුම නිවාස ඒකක , රජයේ හා පෞද්ගලික ගොවිපලවල් ආදියට ගොස් තොරතුරු රැස් කරන ලදී. මෙමගින් ඇති කරනු ලැබූ එළ හරක්, මී හරක්, එළුවන්, බැටළුවන්, ඌරන්, කුකුළන්, තාරාවන්, කළුකුන් හා වටුවන් ආදී සතුන් පිළිබඳ තොරතුරු හා සත්ව සංඛ්‍යාව ද එළ කිරි, මී කිරි හා බිත්තර නිෂ්පාදනය පිළිබඳ තොරතුරු ද ග්‍රා. නි. මට්ටමින් එක් රැස් කරන ලදී.

එක් රැස් කරනු ලැබූ එම තොරතුරු ප්‍රා. ලේ. මට්ටමින් හා දිස්ත්‍රික්ක මට්ටමින් පිළියෙල කොට, 2017 වර්ෂය සඳහා ඉහත සඳහන් එක් එක් සත්ත්ව ගහණය ද කිරි හා බිත්තර නිෂ්පාදනය පිළිබඳ ඇස්තමේන්තු ද පිළියෙල කිරීමට කටයුතු යොදන ලදී. ඒ අනුව මෙම සංඛ්‍යාතීන් වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

### IV. තේ, රබර් සහ පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය- 2016/2017

2016/2017 වර්ෂ සඳහා තේ, රබර් සහ පොල් යන ප්‍රධාන භෝගයන්ගේ නිෂ්පාදන වියදම් ගණනය කිරීමේ කටයුතු අවසන් කරන ලදී. තේ කිලෝග්‍රෑමයක නිෂ්පාදන වියදම ගණනය කිරීමට අදාල විස්තරාත්මක තොරතුරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ, තේ කොමසාරිස් අංශයේ සහාය ඇතිව එම කාර්යාලයේහි ලියාපදිංචි තේ කම්හල් වලින් එක් රැස් කරන ලදී. රබර් නිෂ්පාදන වියදම් ගණනය කිරීමේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව පවත්වනු ලබන සමීක්ෂණය පදනම් කර ගනු ලැබීය. පොල් නිෂ්පාදන වියදම් ගණනය කිරීමේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින්පවත්වනු ලබන පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය පදනම් කර ගනු ලැබීය මෙම සමීක්ෂණ මගින් ලබා ගන්නා දත්ත මගින් 2016/2017 වගා වර්ෂය සඳහා තේ, රබර් සහ පොල් වල නිෂ්පාදන වියදම් ගණනය කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

### V. අර්තාපල් නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය -2017

අර්තාපල් වගා කරනු ලබන බිම් ප්‍රමාණය හා අපේක්ෂිත නිෂ්පාදනයන් මාසිකව පුරෝකථනය කිරීම ප්‍රධාන අරමුණ කොටගත් මෙම සමීක්ෂණය 2017 වසර තුලදී නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්ක වල ප්‍රා.ලේ. කොට්ඨාස මට්ටමින් පහත සඳහන් අයුරින් සිදු කරන ලදී.

මෙම සමීක්ෂණය 2017 වර්ෂය තුල නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි අදියර තුනකින් ඉටුකරන ලද අතර, බදුල්ල දිස්ත්‍රික්කයෙහි අදියර දෙකකින් ඉටුකරන ලදී. එහි ක්ෂේත්‍ර කටයුතු සිදු කරනු ලැබූ කාල වකවානු පහත පරිදි වේ.

ජනවාරි / පෙබරවාරි

අප්‍රේල් / මැයි

අගෝස්තු / සැප්තැම්බර්

එම සමීක්ෂණ ප්‍රතිඵල අනුව 2017 වර්ෂය සඳහා අර්තාපල් වගා කරනු ලබන බිම් ප්‍රමාණය හා අපේක්ෂිත නිෂ්පාදනයන් මාසිකව පුරෝකථනය කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

### VI. ලොකු ළූණු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ විශේෂ සමීක්ෂණය - 2017

ලොකු ළූණු වගා කරන ගොවීන් සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය අනුව අපේක්ෂිත නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ අරමුණින් යුතුව 2017 වසරේදී ද මෙම සමීක්ෂණය අනුරාධපුරය, පොළොන්නරුව, මාතලේ යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හා මහවැලි ‘එච්‘ කලාපය තුළ ඒකක කළමනාකරණ කොට්ඨාස මට්ටමින් සිදු කරන ලදී.

ලොකු ළූණු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමෙහිලා පවත්වන මෙම සමීක්ෂණය යල කන්නය සඳහා සිදුකරන බැවින් එහි ක්ෂේත්‍ර කටයුතු 2017 වර්ෂය තුළ අගෝස්තු / සැප්තැම්බර් කාල වකවානුවේදි සිදු කරන ලදී.

එම සමීක්ෂණ ප්‍රතිඵල අනුව 2017 වර්ෂය සඳහා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හා මහවැලි ‘එච්‘ කලාපය තුළ ඒකක කළමනාකරණ කොට්ඨාස මට්ටමින්, ලොකු ළූණු වගා කරන බිම් ප්‍රමාණය හා අපේක්ෂිත නිෂ්පාදනය ඇතුලත් අවසන් වාර්තාව සකස් කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

**VII. ආහාර ශේෂ පත්‍රය**

වාර්ෂිකව පිළයෙල කරනු ලබන ආහාර ශේෂ පත්‍රය මගින් ඒක පුද්ගල ආහාර සැපයුම පෙන්නුම් කරන අතර එමගින් රටේ පවතින පෝෂණ තත්ත්වය ජාතික මට්ටමින් පිළිබිඹු වේ. 2016 වර්ෂයේ කෘෂිකාර්මික නිෂ්පාදන සැලකිල්ලට ගෙන 2016 වර්ෂයේ ඒක පුද්ගල ආහාර සැපයුම පිළිබඳ ඇස්තමේන්තු පිලියෙල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

**VIII. දිස්ත්‍රික් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන**

මෙම පුහුණු වැඩසටහන මගින් වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්‍ෂණය හා කෘෂි බෝග තොරතුරු රැස් කිරීම පිළිබඳ පුහුණුවක් ලබා දීමට කටයුතු කළ අතර මූලිකව කෑගල්ල, රත්නපුර හා බදුල්ල දිස්ත්‍රික්ක වල මෙම පුහුණුව සිදු කරන ලදී. පසුව එම පුහුණුව දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල මගින් කළ අතර එමගින් අනෙකුත් සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පුහුණු කටයුතු සිදු කරන ලදී.

**IX. ආර්ථික සංගණනය (කෘෂිකර්ම අංශයේ ගණන් ගැනීම)**

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඇති ව්‍යුහාත්මක වෙනස්කම් හඳුනාගැනීමට ආර්ථික සංගණනය යටතේ කෘෂිකර්ම අංශයේ තොරතුරු රැස් කිරීම සිදුකරන ලදී. ඒ අනුව කෘෂිකර්ම අංශයේ තොරතුරු රැස් කිරීම යටතේ කෘෂිකර්මාන්තයට අදාළ සියලුම ඒකක පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කරන ලදී. ඒ අනුව සියලුම වතු හා කුඩා ගොවිකාණ්ඩ ආවරණය කරමින් ගොවි කාරකයින්, ගොවි කාරකයාගේ ගෘහ කාණ්ඩය, ඉඩම් භාවිතය හා භුක්තිය, ඒ ඒ බෝග යටතේ වගා කොට ඇති බිම් ප්‍රමාණ, මිරිදිය/කිවුල්දිය/කරදිය මත්ස්‍ය වගාව, ආදී විෂයයන්ට අදාල තොරතුරු රැස් කරන ලදී.

මෙම සංගණනයේදී රැස් කළ තොරතුරු භාවිතයෙන් සියලුම දිස්ත්‍රික්ක සඳහා වාර්තා පිළියෙල කර වෙබ්අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන්ම රැස්කර ගන්නා තොරතුරු භාවිතයෙන් අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. මෙම වාර්තාව මගින් ගොවි කාණ්ඩ සංඛ්‍යාව, ගොවි කාරකයින් සංඛ්‍යාව, එක් එක් බෝග වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය, සත්ව පාලනය, මිරිදිය/කිවුල්දිය/කරදිය මත්ස්‍ය වගාව ආදි විෂයයන්ට අදාල සංඛ්‍යාති ප්‍රකාශයට පත් කරනු ලැබීය.

**X. කෘෂිකර්ම ගෘහ ඒකක සමීක්ෂණය-2017/18**

කෘෂිකර්ම ක්ෂෙත්‍රයේ ව්‍යුහාත්මක තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලැබීය. ඒ අනුව කෘෂිකර්ම අංශයේ ගෘහ ඒකක වල ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, ඉඩම් භාවිතය, වගා ව්‍යුහය, සත්ත්ව පාලනය, බෝග වගාව, වන වගාව, කෘෂිකාර්මික යෙදවුම්, නිෂ්පාදන වියදම හා තොග පවත්වා ගැනීම ආදී තොරතුරු රැස් කිරීමට මෙම සමීක්ෂණය සැලසුම් කරන ලදී. ඒ අනුව සමීක්ෂණ උපලේඛනය පිළියෙල කිරීම, නියදිය තේරීම, පූර්ව හා නියමු සමීක්ෂණ පැවැත්වීම, ගණන් ගන්නා නිලධාරීන්ගේ පුහුණුව පැවැත්වීම හා සමීක්ෂණයේ පළමු අදියරෙහි තොරතුරු රැස් කිරීම ආදිය සිදු කරන ලදී.

# මූල්‍ය කාර්ය සාධනය - 2017

| අනු අංකය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු.මිලියන) | 2017/12/31 දක්වා වැය කරන ලද මුදල (රු. මිලියන) |
|---|---|---|---|
| 01 | වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය (මහ)-2017 | 3.06 | 1.9 |
| 02 | වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය (යල)-2017 | 2.92 | 2.92 |
| 03 | ගොඩගොවිතැන් සංඛ්‍යාලේඛන රැස් කිරීම (මහ/යල)-2017 | 0.30 | 0.30 |
| 04 | පශුධන සම්පත් පිළිබඳ සංඛ්‍යාලේඛන රැස් කිරීම | 0.39 | 0.39 |
| 05 | තේ, රබර්, පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය 2016/17 | - | - |
| 06 | අල නිෂ්පාදන සමීක්ෂණය -2017 | 0.03 | 0.03 |
| 07 | ලොකුළුණු නිෂ්පාදන සමීක්ෂණය - 2017 | 0.10 | 0.10 |
| 08 | ආහාර ශේෂ පත්‍රය | - | - |
| 09 | දිස්ත්‍රික් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන | 1.00 | 0.75 |
| 10 | ආර්ථික සංගණනය (කෘෂිකර්ම අංශයේ ගණන් ගැනීම) | - | - |
| 11 | කෘෂිකර්ම නිෂ්පාදන සමීක්ෂණය | 18.48 | 4.30 |

## 3.4 ජාතික ගිණුම් අංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත 2007 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් සකස් කිරීම පිළිබඳ සම්පූර්ණ අධිකාරිය පැවරී ඇත. දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයට එම කටයුත්ත සඳහා වගකීම පැවරී ඇති අතර එම අංශය විසින් වාර්ෂික හා කාර්තුගත ජාතික ගිණුම් ප්‍රකාශයට පත් කරනු ලබයි.

ඒ අනුව 2017 වර්ෂය තුළදී ජාතික ගිණුම් අංශය විසින් ඉටුකරන ලද කාර්යයන් පහත පරිදි වේ.

I. වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක 2016 වර්ෂය සඳහා නිෂ්පාදන ප්‍රවේශය, ආදායම් ප්‍රවේශය සහ වියදම් ප්‍රවේශය යන ආකාර තුන යටතේ ම ඇස්තමේන්තු කරන ලදි. එසේ ම නිෂ්පාදන ප්‍රවේශය සහ වියදම් ප්‍රවේශය යටතේ කාර්තුගත දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක 2016 වර්ෂයේ තෙවන කාර්තුව සහ 2017 වර්ෂයේ පළමු, දෙවන සහ තෙවන කාර්තු සඳහා ඇස්තමේන්තු කරන ලදි. මෙම සියලුම ඇස්තමේන්තු 2010 පදනම් වර්ෂය වශයෙන් ගෙන පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් යටතේ සකස් කර ඇත. තවද අංශය විසින් අනුගමනය කරනු ලබන සංශෝධන ප්‍රතිපත්තිය අනුව යමින් 2014 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු, 2015 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු සහ 2016 වර්ෂයේ පළමු කාර්තුවේ හා දෙවන කාර්තුවේ කාර්තුගත ඇස්තමේන්තු සංශෝධනය කරන ලදි.

II. ජාතික ගිණුම් වාර්ෂික වාර්තාව 2015 වර්ෂය සහ 2016 වර්ෂය සඳහා සකස් කෙරෙමින් පවතින අතර එම වාර්තා ද්විත්වය ම 2018 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

III. ජාතික සහ ජාත්‍යන්තර ආයතනවලින් සිදුකරන ලද දත්ත ඉල්ලීම් සඳහා කිසිදු ප්‍රමාදයකින් තොරව ප්‍රතිචාර දැක්වීම වසර පුරා සිදුකරන ලදි.

IV. ජාතික ගිණුම් දත්ත පද්ධතිය සහ ක්‍රමවේදය නවීකරණය කිරීම සම්බන්ධයෙන් ගත්කල 2017 වර්ෂය තුළදී වැඩමුළු රැසක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ආසියානු සංවර්ධන බැංකුව ජාතික ගිණුම් අංශයේ සේවක මණ්ඩලය සමග එක්ව ජාතික ගිණුම් පදනම් වර්ෂය යාවත්කාලීන කිරීම සහ පළාත්බද ජාතික ගිණුම් ඇස්තමේන්තු සකස් කිරීම සම්බන්ධ වැඩමුළු දෙක බැගින් දියත් කරන ලදි. එසේ ම ආසියානු සංවර්ධන බැංකුව විසින් "ජාතික ගිණුම් දත්ත ඇසුරෙන් උසස් ආර්ථික විශ්ලේෂණය" සම්බන්ධ විශේෂ වැඩමුළුවක් පවත්වන ලදි. තව ද දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහය ලබාගනිමින් වනවගා සහ දැව උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය ඇස්තමේන්තු කිරීම් සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමට මුළු දිවයින ම ආවරණය වන වැඩපිළිවෙලක් සකස් කරන ලදි.

V. වාර්ෂික සහ කාර්තුගත ජාතික ගිණුම් ඇස්තමේන්තු ඒවාට අදාල දත්ත වගු, මාධ්‍ය නිවේදන සහ විස්තරාත්මක මාධ්‍ය සටහන් ද සමගින් නියමිත කාලයේ දී මහජනතාව වෙත නිකුත් කළ අතර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ද ප්‍රකාශයට පත් කරන ලදි.

වගුව **2:** වාර්ෂික ජාතික ගිණුම් හී ප්‍රධාන දර්ශක (2010 පාද වර්ෂය) 2013 – 2016

| | දර්ශකය | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| 1. | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (%) | 3.4 | 5.0 | 4.8 | 4.4 |
| 2. | පවත්නා මිල ගණන් යටතේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (රු.) | 466,112 | 498,828 | 522,355 | 558,363 |
| 3. | පවත්නා මිල ගණන් යටතේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (එක්සත් ජනපද ඩොලර්) | 3,610 | 3,821 | 3,844 | 3,835 |
| 4. | පවත්නා මිල ගණන් යටතේ ඒක පුද්ගල දළ ජාතික ආදායම (රු.) | 455,126 | 487,462 | 508,936 | 542,669 |
| 5. | පවත්නා මිල ගණන් යටතේ ඒක පුද්ගල දළ ජාතික ආදායම (එක්සත් ජනපද ඩොලර්) | 3,525 | 3,734 | 3,745 | 3,727 |
| 6. | පවත්නා මිල ගණන් යටතේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයේ (එක්සත් ජනපද ඩොලර්) වැඩිවීම (%) | 7.7 | 5.8 | 0.6 | -0.2 |
| 7. | පවත්නා මිල ගණන් යටතේ ඒක පුද්ගල දළ ජාතික ආදායමේ (එක්සත් ජනපද ඩොලර්) වැඩිවීම (%) | 7.1 | 5.9 | 0.3 | -0.5 |
| 8. | දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය | 122 | 126 | 127 | 131.4 |
| 9. | දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකයේ වෙනස්වීම (%) | 6.2 | 2.9 | 0.8 | 3.6 |
| 10. | විනිමය අනුපාතිකය : එක්සත් ජනපද ඩොලරයක් සඳහා රුපියල් | 129.1 | 130.6 | 136 | 146 |

වගුව **3:** කාර්තුගත ජාතික ගිණුම් හි ප්‍රධාන දර්ශක (2010 පාද වර්ෂය) 2015 – 2017

| දර්ශකය | 2015 | | | | 2016 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කාර්තු | | | | කාර්තු | | | | කාර්තු | | | |
| | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (%) | 4.4 | 7.0 | 5.6 | 2.5 | 5.2 | 2.7 | 4.1 | 5.3 | 3.9 | 4.0 | 3.3 | |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය | 137.7 | 130.5 | 132.2 | 120.1 | 143.2 | 138.5 | 136.4 | 124.4 | 149.8 | 141.4 | 140.3 | |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය වෙනස්වීම (%) | 3.2 | 1.0 | 3.2 | 1.2 | 4.0 | 6.2 | 3.2 | 5.7 | 7.7 | 4.9 | 8.9 | |

## මූල්‍ය කාර්ය සාධනය - 2017

| අනු අංකය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු.මිලියන) | 2017/12/31 දක්වා වැය කරන ලද මුදල (රු. මිලියන) |
|---|---|---|---|
| 01 | වාර්ෂික ජාතික ගිණුම් වාර්තාව -2015, 2016 සකස් කිරීම, සංස්කරණය සහ මුද්‍රණය කිරීම | 0.28 | 0.003 |
| 02 | ජාතික ගිණුම් වැඩි දියුණු කිරීම | 0.22 | 0.22 |
| 03 | ජාතික ගිණුම් දත්ත ප්‍රකාශයට පත් කිරීම | 0.1 | 0.044 |

## 3.5 ප්‍රකාශන අංශය

දෙපාර්තමේන්තුවේ ඉදිරි වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම, වාර්ෂික කාර්ය සාධන වාර්තාව, සංඛ්‍යාන නිබන්ධනය, සංඛ්‍යාන අත්පොත (ඉංග්‍රීසි, සිංහල / දෙමළ ), පලාත් පාලන සංඛ්‍යාති , සංඛ්‍යාන දත්ත පත්‍රිකාව, ශ්‍රී ලංකාවේ ආර්ථික සංඛ්‍යාති, News Letter පිළියෙල කොට ඉදිරිපත් කිරීම හා දෙපාර්තමේන්තුවේ සියළුම ප්‍රකාශන බෙදා හැරීම ප්‍රකාශන අංශයේ මූලික කාර්යයන් වේ.

### I. සංඛ්‍යාන නිබන්ධනය - 2017

ශ්‍රී ලංකාවේ වැදගත් ක්ෂේත්‍ර ගණනාවක දත්තයන් වසර කිහිපයක ශ්‍රේණියක් ලෙස ඇතුලත් කොට සකස් කරනු ලබන සංඛ්‍යාන නිබන්ධන 2017 පිළියෙල කොට නියමිත පරිදි වෙබ් අඩවියට ඇතුලත් කරනු ලැබූ අතර එය මුද්‍රණය කිරීම සඳහා සියළු කටයුතු සූදානම් කොට ඇත.

### II. ක්‍රියාකාරි සැලැස්ම - 2018

දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා 2018 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම, අනුමත ඇස්තමේන්තු යටතේ සකස් කොට නියමිත කාලවකවානුව තුළදී ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට හා විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදි.

### III. කාර්ය සාධන වාර්තාව - 2016

දෙපාර්තමේන්තුවේ සියළුම අංශයන් හා දෙපාර්තමේන්තුවට පරිබාහිරව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අනුයුක්ත සංඛ්‍යාලේඛන අංශයන් මඟින් ඉටු කරන ලද කාර්යයන් හා 2016 වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තාව ද ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව 2016 ප්‍රකාශයට පත් කරන ලද අතර එම වාර්තාවේ සංයුක්ත තැටි 350ක් සමඟ මෙම වාර්තාවේ පිටපත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත නියමිත දිනට පෙර භාරදීමට කටයුතු කරන ලදි.

### IV. කාර්ය සාධන සාරාංශ වාර්තාව - 2017

2016 වර්ෂයේ දෙපාර්තමේන්තුව මගින් ඉටු කරන ලද කාර්යයන් සාරාංශ ගතකොට එම වාර්තාව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වෙත නිශ්චිත කාලය තුල විද්‍යුත් තැපැල(e-mail) මගින් ලබා දෙන ලදී.

### V. භෞතික හා මූල්‍ය කාර්ය සාධන කාර්තු වාර්තාව - 2017

එක් එක් කාර්තුව තුල සෑම අංශයක් විසින්ම ඉටු කරන ලද කාර්යයන් පිළිබඳව භෞතික හා මූල්‍ය කාර්ය සාධන කාර්තු වාර්තා සෑම කාර්තුවක් අවසානයේදී ම පිළියෙල කරන ලදී.

### VI. සංඛ්‍යාන අත්පොත - 2017

ශ්‍රී ලංකාවේ වැදගත් මූලික සමාජ ආර්ථික දත්ත , වර්ෂ කීපයක ශ්‍රේණියක් ලෙස ඉදිරිපත් කරන මෙම ප්‍රකාශනය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළියෙල කරන සංඛ්‍යාන අත්පොත 2017 හා එම තොරතුරුම ඇතුලත් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පිළියෙල කරන සංඛ්‍යාන අත්පොත 2017 යන ප්‍රකාශන දෙකම නියමිත කාල වකවානුව තුළ එළි දැක්වීමට හැකි විය.

### VII. ආර්ථික දත්ත - 2017

ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය පෙන්නුම් කරන දත්ත පමණක් ඇතුලත්කොට ප්‍රථම වතාවට පිළියෙල කරන ලද ශ්‍රී ලංකාවේ ආර්ථික දත්ත 2017 ප්‍රකාශනය පිළියෙල කොට එළි දක්වන ලදි.

### VIII. සංඛ්‍යාන පුවත් විවරණිකාව - 2017

දෙපාර්තමේන්තුවේ කාලින තොරතුරු ඇතුලත් සංඛ්‍යාන පුවත් විවරණිකාව 2017 අර්ධ වාර්ෂිකව පිළියෙල කොට එළි දක්වන ලදි.

### IX. සංඛ්‍යාන දත්ත පත්‍රිකාව - 2017

මෙම දත්ත පත්‍රිකාව භාෂා ත්‍රිත්වයෙන්ම පිළියෙල කොට මුද්‍රණය කිරීමෙන් පසු බෙදා හරින ලද අතර දෙපාර්තමේන්තු වෙබ් අඩවියටද ඇතුලත් කරන ලදි.

### X. දෙපාර්තමේන්තු ප්‍රකාශන බෙදා හැරීම

එක්රැස් කරනු ලබන දත්ත ප්‍රචලිත කිරීමේ මූලික වගකීම දෙපාර්තමේන්තුව සතුවේ. මෙම කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශනයන් හා පුවත් විවරණිකා ප්‍රමාදයකින් තොරව දේශීය හා විදේශීය ආයතනයන් හා පුද්ගලයින් අතර බෙදාහැරීම පසුගිය වර්ෂය පුරා නොකඩවා සිදුකර ඇත.

මීට අමතරව දෙපාර්තමේන්තුවේ සියළුම ප්‍රකාශනයන් හා පුවත් විවරණිකාවන් සඳහා ISBN/ ISSN අංක ලබා ගැනීමත්, ඒ ඒ කාලවකවානු වලදී ඉටු කර ඇත. දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන කාර්යයන් පිළිබඳව කාර්ය සාධන සාරාංශ වාර්තා පිළියෙල කොට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වෙත නියමිත කාල වකවානු තුල ඉදිරිපත් කිරීමටද හැකි විය.

## 3.6 පුස්තකාල හා ප්‍රලේඛන අංශය

දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදීම, දෙපාර්තමේන්තු නිලධාරීන්, රජයේ ආයතන, රජයේ ප්‍රතිපත්ති සම්පාදකයන්, පර්යේෂකයින්, විශ්වවිද්‍යාල සිසුන්, පාසල් සිසුන් හා මහජනතාවට අවශ්‍ය තොරතුරු අත්පත් කර ගෙන එම තොරතුරු සංවිධානය කර සැපයීමේ ප්‍රධාන කාර්යය භාර්යයක් පුස්තකාල හා ප්‍රලේඛන අංශය විසින් සිදුකරනු ලබයි.

දෙපාර්තමේන්තු පුස්තකාලය බැහැර දිමේ අංශය සහ විමර්ශන අංශය වශයෙන් ප්‍රධන අංශ දෙකකින් සමන්විත වන අතර, පුස්තකාල ද්‍රව්‍ය බැහැර දිමේ සේවාවන් දෙපාර්තමේන්තු ස්ථිර සේවයේ යෙදි සිටින නිලධාරීන්ට පමණක් ලබා දෙන අතර විමර්ශන අංශය මගින් දෙපාර්තමේන්තු නිලධාරින් සහ බාහිර පාඨකයින්ට විමර්ශන සේවා ලබාගත හැක.

දෙපාර්තමේන්තු ප්‍රකාශන එකතුව, ශ්‍රී ලංකා එකතුව, ජාත්‍යන්තර ප්‍රකාශන එකතුව, සහ විවිධ විෂයයන්ට අදාල පෙළ පොත් එකතුවකින් බැහැරදීමේ අංශය සමන්විතය. විමර්ශන අංශයේ පැරණි දෙපාර්තමේන්තු ප්‍රකාශන තැන්පත් කර ඇත. පුස්තකාලයේ නොමැති ප්‍රකාශන අවශ්‍යතාවක් වුවහොත් අන්තර් පුස්තකාල පිරුළු සේවාව යටතේ වෙනත් පුස්තකාලවලින් හුවමාරු කරගනු ලැබේ.

2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකරන ලද පුස්තකාල සේවා ලෙස,

**I. පුස්තකාල පොත් මිලදී ගැනිම**

පුස්තකාලය භාවිත කරන නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා සංඛ්‍යානය, පරිගණක විද්‍යාව, සිතියම්, කළමනාකරණය, කාර්යාල ක්‍රම, ඉංග්‍රීසි භාෂාව, දෙමළ භාෂාව සහ පුස්තකාල විද්‍යාව යන විෂයන්ට අදාල ග්‍රන්ථ 191ක් දේශීය ප්‍රකාශන ආයතනවලින් මිලදී ගන්නා ලදී.

**II. පුස්තකාල පොත් සංරක්ෂණය**

අබලන් වී තිබූ පැරණි දෙපාර්තමේන්තු ප්‍රකාශන 40ක් දෙපාර්තමේන්තු මුද්‍රණ අංශය මගින් බැඳීම් සිදුකරන ලදී. මෙයට අමතරව සුළු වශයෙන් හානි වී තිබූ පොත් පුස්තකාල අංශයේ සේවය කළ පොත් බැඳුම්කරු විසින් ප්‍රතිසංස්කරණය කරන ලදී.

**III. දැනුවත් කිරීමේ වැඩසටහන්**

කොළඹ විශාඛා විද්‍යාලයීය ශත සංවත්සර ප්‍රදර්ශනය වෙනුවෙන් 2017 මාර්තු මස 28, 29, 30, සහ 31 දිනවලදී ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාම සහ එයට සමගාමීව එහි සිසුන් දැනුවත් කිරීමේ දෙදින වැඩමුළුවක් දෙපාර්තමේන්තුවේ දී පවත්වන ලදී.
දෙපාර්තමේන්තු පුස්තකාලයේ පරිගණක දත්ත පද්ධතිය පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පුස්තකාල අංශයේ දී පවත්වන ලදී.

**IV. පුස්තකාල පොත් සමීක්ෂණය**

2016 වර්ෂයේ පොත් සමීක්ෂණයෙන් අනාවරණය වූ නැති වූ පොත් ඌණතා පිළිබඳ තීරණ ගැනීම සඳහා පුස්තකාල උපදේශන කමිටුවක් පත්කිරීම 2017 වර්ෂයේ දී සිදුකළ අතර කමිටු නිර්දේශ ලබා ගැනීමට අදාළ කටයුතු මේ වන විට ඉටු කරමින් පවතී.

**V. පුස්තකාල සාමාජිකයින් සඳහා ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පත් ලබා දීම**

දෙපාර්තමේන්තු පුස්තකාලයේ දැනට ඇති ප්‍රකාශන සහ පුස්තකාල සාමාජිකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු පිළිබඳව තොරතුරු (ඡායාරූප සහිතව) පරිගණක දත්ත පද්ධතියට ඇතුලත් කිරීම මේ වන විට අවසන් කර ඇත. පාඨකයන්ට පොත් බැහැරදීමේ කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා Barcode අංකය සහිත ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පත් ලබා දීමේ කාර්යයන් සිදු කරන අතර එම කාර්යය සඳහා හැඳුනුම්පත් මුද්‍රණය කිරීමේ කටයුතු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන අංශය මගින් සිදුකරමින් පවතී.

**VI. පටුන පිටු සේවය**

පුස්තකාලයට ලැබෙන නවතම ප්‍රකාශන පිලිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීම සඳහා මාසිකව මෙම සේවය ක්‍රියාත්මක කරනු ලැබේ. වෙනත් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබෙන ප්‍රකාශන වල මුල් කවරය සහ පටුන පරිලෝකනය කර විද්‍යුත් තැපැල මගින් දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරිමේ කාර්යයන් සිදු කරනු ලැබේ.

**VII. පුවත්පත් කැපුම් සේවය**

පුස්තකාල අංශයට දිනපතා ලබා ගන්නා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලට අදාල පුවත්පත්වල තිබෙන දෙපාර්තමේන්තු විෂය ක්ෂේත්‍රයට අදාළ ලිපි ඡායා පිටපත් කර දැනුවත් කිරිම සඳහා සියලුම අංශ ප්‍රධානීන් වෙත දෛනිකව යැවීම සහ එම පුවත්පත් ලිපි එකතුවක් ලෙස පුස්තකාල අංශයේ පවත්වාගෙන යාම කරනු ලැබේ.

## මූල්‍ය කාර්ය සාධනය - 2017

| අනු අංකය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු.මිලි.) | 2017/12/31 දක්වා වැය කරන ලද මුදල (රු.මිලි.) |
|---|---|---|---|
| 01 | පුස්තකාල පොත් මිලදී ගැනීම | 0.44 | 0.44 |

## 3.7 නියැදි සමීක්ෂණ අංශය

### I. ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය - 2017

ශ්‍රී ලංකාවේ ශ්‍රමබලකාය, සේවා නියුක්තිය සහ සේවා වියුක්ති මට්ටම සහ ඒවායේ උපනතීන් පිළිබඳ මැනබැලීම සඳහා 1990 වර්ෂයේ පළමු කාර්තුවේ සිට නොකඩවා කාර්තු මට්ටමෙන් මෙම සමීක්ෂණය සිදුකරනු ලබයි. 2017 වර්ෂය සඳහා වූ මෙම සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු ටැබ්ලට් පරිගණක භාවිතයෙන් (CAPI) ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා සියලුම දිස්ත්‍රික්කයන්හි සිදු කර ඇත.

ශ්‍රමබල සමීක්ෂණයේ වාර්ෂික වාර්තාව 2016 ප්‍රකාශයට පත්කර ඇත.තවද 2017 වර්ෂයේ පළමු, දෙවන සහ තුන්වන කාර්තුවල සංක්ෂිප්ත වර්තා සහ කාර්තුගත වාර්තාවන් සහ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ 2016 අවසන් සංක්ෂිප්ත වාර්තාව, 2017 පළමු මාස 6 සඳහා වූ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවද ප්‍රකාශයට පත්කර ඇත.

**වගුව 4: ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය - 2017 (III වන කාර්තුව)**

| දර්ශකය | ශ්‍රී ලංකාව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| වයස අවුරුදු 15ට වැඩි ජනගහනය | 15,893,819 | 7,315,588 | 8,578,231 |
| ශ්‍රම බලකාය (වයස අවු 15 හා ඊට වැඩි ) | 8,522,219 | 5,381,432 | 3,140,787 |
| ශ්‍රම බලසහභාගිත්ව අනුපාතය | 53.6 | 73.6 | 36.6 |
| සේවා නියුක්ති ජනගහනය | 8,163,869 | 5,237,380 | 2,926,489 |
| සේවා නියුක්ති අනුපාතිකය (%) | 95.8 | 97.3 | 93.2 |
| සේවා වියුක්ති ජනගහනය | 358,350 | 144,052 | 214,298 |
| සේවා වියුක්ති අනුපාතිකය (%) | 4.2 | 2.7 | 6.8 |
| ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය | 7,371,600 | 1,934,157 | 5,437,444 |
| **පරිගණක සාක්ෂරතාවය (I සහ II කාර්තු - 2017)** | | | |
| පරිගණක සාක්ෂරතා අනුපාතිකය (%) | 28.3 | 30.7 | 26.1 |

### II. ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2016

ජාතික ගෘහ ඒකක නියැදි සමීක්ෂණ වැඩසටහන යටතේ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය මෙම දෙපාර්තමේන්තුව මගින් වසර 3කට වරක් පවත්වනු ලබයි. මෙම සමීක්ෂණ මාලාවේ 9වන සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු 2016 ජනවාරි මාසයේ ආරම්භ වූ අතර 2016 දෙසැම්බර් මාසයෙන් අවසන් විය.

මෙම සමීක්ෂණයේ තොරතුරු රැස්කිරීම මුළු දිවයිනම ආවරණය වන පරිදි පැවැත්විණි. තොරතුරු ලබාගන්නා උපලේඛනය කාණ්ඩ 9කින් සමන්විත වන අතර ප්‍රජාවිද්‍යාත්මක තොරතුරු, පාසල් අධ්‍යාපනය, සෞඛ්‍ය, ගෘහ ඒකක ආදායම් හා වියදම්, ගෘහ ඒකක සතුව ඇති කල්පවතින භාණ්ඩ, මූලික පහසුකම් ලබා ලැනීම, ගෘහ ඒකකයේ ණයගැතිභාවය , නිවාස සහ සනීපාරක්ෂාව,ස්වභාවික විපත්, ඉඩම් අයිතිය, සත්ත්ව පාලනය යන ක්ෂේත්‍ර වලට අදාලව තොරතුරු රැස්කරන ලදී.

මෙම සමීක්ෂණයට අදාල අවසන් සංක්ෂිප්ත වාර්තාව සහ අවසන් වාර්තාව ප්‍රකාශයට පත්කරන ලද අතර මෙම සමීක්ෂණ දත්ත උපයෝගී කරගෙන සකස් කරනු ලබන දරිද්‍රතා දර්ශක ඇතුලත් කර සංක්ෂිප්ත වාර්තාවද ප්‍රකාශයට පත්කරන ලදී.

**වගුව 5: ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2016**

| දර්ශකය | ඒකකය | වටිනාකම |
|---|---|---|
| මාසික ගෘහ ඒකක මධ්‍යනාය ආදායම | (රු.) | 62,237 |
| මාසික ගෘහ ඒකක මධ්‍යස්ථ ආදායම | (රු.) | 43,511 |
| මාසික ගෘහ ඒකක මධ්‍යනාය ඒක පුද්ගල ආදායම | (රු.) | 16,377 |
| මාසික ගෘහ ඒකක මධ්‍යස්ථ ඒක පුද්ගල ආදායම | (රු.) | 11,307 |
| ආදායම් උපයන්නන්ගේ මාසික ගෘහ ඒකක මධ්‍යනාය ආදායම | (රු.) | 33.894 |
| ආදායම් උපයන්නන්ගේ මාසික ගෘහ ඒකක මධ්‍යස්ථ ආදායම | (රු.) | 23,260 |
| ගෘහ ඒකක ආදායම සඳහා ගිනි සංගුණකය | | 0.45 |
| ඒක පුද්ගල ආදායම සඳහා ගිනි සංගුණකය | | 0.44 |
| ආදායම් උපයන්නන්ගේ ආදායම සඳහා ගිනි සංගුණකය | | 0.51 |
| මාසික ගෘහ ඒකක මධ්‍යනා වියදම | (රු.) | 54,999 |
| මාසික ගෘහ ඒකක මධ්‍යස්ථ වියදම | (රු.) | 40,186 |
| මාසික ගෘහ ඒකක ඒක පුද්ගල මධ්‍යනා වියදම | (රු.) | 14,473 |
| මාසික ගෘහ ඒකක ඒක පුද්ගල මධ්‍යස්ථ වියදම | (රු.) | 10,429 |
| ගෘහ ඒකක වියදම සඳහා ගිනි සංගුණකය | | 0.41 |
| ඒක පුද්ගල වියදම සඳහා ගිනි සංගුණකය | | 0.40 |
| නිල දරිද්‍රතා රේඛාව (එක් පුද්ගලෙකු සඳහා මසකට) | | 4,166 |
| ජනගහන දරිද්‍රතා දර්ශකය | (%) | 4.1 |
| අන්තර් දරිද්‍රතා දර්ශකය | (%) | 0.6 |
| අන්තර් දරිද්‍රතා දර්ශකයේ වර්ගායිත අගය | (%) | 0.1 |

### III. ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය - 2016

වයස අවුරුදු 5 – 17 වයස් සීමාව තුල සිටින සියළුම ළමයින්ගේ ආර්ථික ක්‍රියාකාරකම් ආවරණය කිරීම අරමුණු කරගෙන ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය පවත්වනු ලබයි. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) මූල්‍ය සහ තාක්ෂණික අනුග්‍රහයෙන් සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි නිවාස ඒකක 25000 ක නියැදියක් භාවිතයෙන් මෙම සමීක්ෂණය පවත්වන ලදී. 2016 වර්ෂයේ පැවැත්වූ මෙම සමීක්ෂණය මගින් ළමයින්ගේ ප්‍රජාවිද්‍යාත්මක, අධ්‍යාපනික, යෙදී සිටින ආර්ථික ක්‍රියාකාරකම්, එදිනෙදා ගෘහ ක්‍රියාකාරකම්, සෞඛ්‍ය හා ආරක්ෂාව මෙන්ම ළමා ශ්‍රමිකයින් පිළිබඳ දෙමාපියන්ගේ ආකල්ප පිළිබඳ තොරතුරු රැස් කරන ලදී.

**වගුව 6: ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය - 2016**

| ප්‍රධාන දර්ශක | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| **ළමා ජනගහනය** | | |
| වයස අවුරුදු 5 -17 ඇස්තමේන්තුගත ළමා ජනගහනය | 4,571,442 | 100.0 |
| ආර්ථික වටිනාකමක් ඇති ඕනෑම කටයුත්තක නිරත නොවන ළමයි | 4,467738 | 97.7 |
| ආර්ථික වටිනාකමක් ඇති ඕනෑම කටයුත්තක නිරත වන ළමයි | 103,704 | 2.3 |
| ආර්ථික කටයුත්තක නිරත ළමා ශ්‍රමිකයින් නොවන ළමයි | 59,990 | 1.3 |
| අන්තරායකාරී රැකියාවල නොයෙදෙන ළමා ශ්‍රමිකයින් | 4,707 | 0.1 |
| අන්තරායකාරී රැකියාවල නිරත වන ළමයි | 39,007 | 0.9 |

| | | |
|---|---|---|
| **පාසල් අධ්‍යාපනය ලැබීම** | | |
| මුළු ළමයින් අතරින් | 4,118,781 | 90.1 |
| වැඩකරන ළමයින් අතරින් | 40,290 | 38.9 |
| මුළු ළමා ශ්‍රමිකයින් අතරින් | 8,713 | 19.9 |
| අන්තරායකාරී ළමා ශ්‍රමිකයින් අතරින් | 4,612 | 11.8 |
| **සේවා තත්ත්වය අනුව ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ළමයි** | | |
| සේවක | 37,500 | 36.2 |
| සේවා යෝජක | 0 | 0.0 |
| තමාගේම වැඩකටයුතු කරන්නා | 4,741 | 4.6 |
| වැටුප් නොලබා පවුලේ වැඩ කරන්නා | 61,463 | 59.3 |

### IV. සංචාරක වියදම් සමීක්ෂණය - 2017/2018

සවිස්තරාත්මක ජාතික ගිණුම් සැකසීමේ පරමාර්ථයෙන් ඒ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම වරට මෙම සමීක්ෂණය සිදුකරනු ඇත. විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරයෙන් ආර්ථික දායකත්වය ගණනය කිරීම සඳහා අවශ්‍ය චන්ද්‍රිකා ගිණුම් සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අරමුණින් මෙම සමීක්ෂණය පැවැත්වීමට තීරණය කර ඇත.

මෙහි ක්ෂේත්‍ර කටයුතු 2017 ඔක්තෝම්බර් මාසයේ සිට 2018 සැප්තැම්බර් මාසය දක්වා මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරයි.

### V. කාල පරිහරණ සමීක්ෂණය - 2017

කිසියම් පුද්ගලයෙකු දිනක පැය 24ක කාලය ගතකරන්නේ කෙසේද යන්න පිළිබඳව තොරතුරු ලබාගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණයට සමගාමීව වෙනමම උපලේඛනයක් භාවිතා කරමින් මුළු රටම ආවරණය වන පරිදි නිවාස ඒකක 6,250ක නියැදියක් භාවිතයෙන් 2017 වර්ෂයේ අවසන් කාර්තුවේදී (ඔක්තෝම්බර්,නොවැම්බර් සහ දෙසැම්බර්) මෙම සමීක්ෂණය පැවැත්වුණි. වයස අවුරුදු 10ට වැඩි ගෘහ කාණ්ඩයේ සියලුම සාමාජිකයින් මෙහිදී සමීක්ෂණයට භාජනය විය.

සමීක්ෂණයේ උපලේඛනය සම්මුඛ පරීක්ෂක විසින් සම්පූර්ණ කල අතර ප්‍රතිචාරකයින් සඳහා වෙනමම දිනපොතක් ලබාදී එය සම්පූර්ණ කිරීම සඳහා සතියක කාලයක් ලබා දෙන ලදී. මෙම කාල පරිහරණ දිනපොත පැය 24ක කාලය විනාඩි 15 බැගින් කාල පරාස වලට බෙදා ඇති අතර එම කාලයන් තුල පුද්ගලයින් සිදුකල ක්‍රියාකාරකම් පිළිබඳව සටහන් කිරීම සඳහා ඔවුන්ට උපදෙස් ලබා දෙන ලදී.

### VI. World Bank Trust Fund for statistical capacity building – 2016

ලෝක බැංකු අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක කල මෙම ව්‍යාපෘතිය මගින් ජාත්‍යන්තර උපදේශන සේවා තුනක් සහ සමීක්ෂණ කටයුතු සඳහා ටැබ්ලට් පරිගණක මිලදී ගැනීමක් 2016 වර්ෂයේදී සිදුකෙරිනි. අදාල උපදේශක මහතුන් සඳහා ගෙවීම් 2017 වර්ෂයේ පළමු කාර්තුවේ සිදුකර අවසන් කරන ලදී.

# මූල්‍ය කාර්ය සාධනය - 2017

| අනු අංකය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලි.) | 2017/12/31 දක්වා වැයකරන ලද මුදල (රු. මිලි.) |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය | 5.84 | 9.82 |
| 2 | ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය | 3.2 | |
| 3 | සංචාර වියදම් සමීක්ෂණය | 1.5 | |
| 4 | කාල පරිහරණ සමීක්ෂණය | 0.5 | |
| 5 | ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය | 5.846 | 5.75 |
| 6 | සංඛ්‍යානමය හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා වූ ලෝක බැංකු භාර අරමුදල | 12 | 10.67 |

## 3.8 ක්ෂේත්‍ර කළමණාකරණ අංශය

**I. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ සහ ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණ කටයුතු**

දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ සහ ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණ කටයුතු මැනවින් සිදු කිරීම සඳහා දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවලට අවශ්‍ය විවිධ ප්‍රතිපාදන, භෞතික පහසුකම් හා විවිධ ආකෘති පත්‍ර ලබාදීමේ කටයුතු සිදුකර ඇත.

ප්‍රතිපාදන යැවීම යටතේ, කාර්තුමය වශයෙන්

- දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින්ගේ හා ක්ෂේත්‍ර නිලධාරින්ගේ මාසික ගමන් වියදම් සඳහා ප්‍රතිපාදන
- ලිපිද්‍රව්‍ය සඳහා ප්‍රතිපාදන
- තැපැල් සහ සන්නිවේදන කටයුතු සඳහා ප්‍රතිපාදන
- ඉන්ධන සඳහා ප්‍රතිපාදන, රියදුරු සංයුක්ත සහ අතිකාල දීමනා සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.

එමෙන්ම දිස්ත්‍රික් කාර්යාලයීය සංඛ්‍යාලේඛන අංශවලට අවශ්‍ය

- විදුලිය, ජලය, සනීපාරක්ෂක කටයුතු,
- යන්ත්‍රෝපකරණ නඩත්තු කටයුතු වැනි අනෙකුත් කාර්යාලයීය අවශ්‍යතා සඳහා ද ප්‍රතිපාදන යවා ඇත
- දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවල ආකෘති පත්‍ර අවශ්‍යතා සපුරාලීම

දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවල කාර්ය මණ්ඩල පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම, දිස්ත්‍රික් කාර්ය මණ්ඩල නිලධාරින්ගේ ස්ථාන මාරුවීම්, අනුයුක්ත කිරීම් සහ වැඩ ආවරණය කිරීම් හා සම්බන්ධ නිර්දේශ කිරීම් අනුමැතිය සඳහා යොමු කිරීම් පිළිබඳ රාජකාරි කටයුතු සිදු කර ඇත.

**II. අනෙකුත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශවල පිහිටුවා ඇති සංඛ්‍යාලේඛන අංශ සම්බන්ධීකරණය හා අගැයීම් කටයුතු**

- මෙම කාර්යය යටතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල ඇති සංඛ්‍යාලේඛන අංශ අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ වරුන් පත් කිරීම.

- දෙපාර්තමේන්තුවේ විශේෂිත කාර්යයන්, මාධ්‍ය නිවේදන නිකුත් කිරීම, තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යයන් සම්බන්ධ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශවල පිහිටුවා ඇති සංඛ්‍යාලේඛන අංශ නිලධාරින් දැනුවත් කිරිමේ වැඩ සටහනක් 2017.06.29 වන දින පවත්වන ලදී.

**III. කාර්යක්ෂම දිස්ත්‍රික් කාර්යාල තේරීම**

- අදාල අංශ මගින් අගැයීම් වාර්තා ලබා ගැනීම.
- එම වාර්තා පදනම් කරගෙන තේරීම් කටයුතු සිදු කිරීම සඳහා වාර්තාවක් සකස් කිරීම.

**IV. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින් හා ප්‍රධාන කාර්යාලයීය අංශ ප්‍රධානින්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික වැඩමුළු පැවැත්වීම.**

මෙම වැඩමුළු අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රධාන කාර්යාලයීය අංශ ප්‍රධානින්ගේ හා දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින්ගේ සහභාගිත්වයෙන් පහත සඳහන් දිනවලදී පවත්වන ලදී.

- දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින්ගේ වාර්ෂික වැඩමුළුව 1

2017 ජුනි මස 15, 16 සහ 17 දින වලදී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේ දී

- දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින්ගේ වාර්ෂික වැඩමුළුව 2

2017 නොවැම්බර් මස 28, 29 සහ 30 දිනවලදී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේ දී පවත්වා ඇත.

මෙම වැඩමුළුවලදී,

- ප්‍රධාන කාර්යාලයීය අංශ ප්‍රධානින් විසින් අංශවල විශේෂිත කාර්යභාරයන් පිළිබඳ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

- දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින් විසින් ඉදිරිපත් කරන ලද අදහස්, යෝජනා, ගැටළු හා විසඳුම් පිළිබඳ සාකච්ඡා කරන ලදී.

**V. කාර්යසාධනය සහ ප්‍රගතිය නිරීක්ෂණය, සාකච්ඡා කිරීම සඳහා කමිටු රැස්වීම් පැවැත්වීම. (ප්‍රජාවිද්‍යාත්මක, කර්මාන්ත, කෘෂිකර්ම)**

මෙම අංශය මගින් පවත්වනු ලබන වාර්ෂික ප්‍රජාවිද්‍යාත්මක, කෘෂිකර්ම කමිටු රැස්වීම් වල පළමු රැස්වීම් දෙපාර්තමේන්තු පුහුණු අංශයේ දී පහත සඳහන් දින වලදී පවත්වන ලදී.

- කෘෂිකර්ම කමිටු රැස්වීම - 2017.03.31
- කර්මාන්ත කමිටු රැස්වීම - 2017.04.04
- ප්‍රජාවිද්‍යාත්මක කමිටු රැස්වීම - 2017.05.23

එමෙන්ම මෙම කමිටු රැස්වීම්වල දෙවන වටයේ රැස්වීම් පහත සඳහන් දින වලදී පවත්වන ලදී.

- කර්මාන්ත කමිටු රැස්වීම - 2017.11.23
- කෘෂිකර්ම කමිටු රැස්වීම - 2017.12.04
- ප්‍රජාවිද්‍යාත්මක කමිටු රැස්වීම - 2017.12.14

මෙම රැස්වීම් දී අදාල සංඛ්‍යාලේඛන අංශවල කාර්යභාරය පිළිබඳ ප්‍රගතිය, මුහුණපා ඇති ගැටළු හා ඉදිරිපත්කරනු ලැබූ යෝජනා පිළිබඳ සාකච්ඡා කිරීම සිදුකරන ලදී. කමිටු රැස්වීම්වලට අදාලව වාර්තා සකස් කිරීම ද සිදු කර ඇත.

**VI. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සැකසීම**

- දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සැකසීම සඳහා අවශ්‍ය අදාල දත්ත වගුවල ආදර්ශ සහ ලිඛිත උපදෙස් සහ ISBN අංක දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ වෙත ලබාදී ඇත.

- අධ්‍යාපන, උසස් අධ්‍යාපන, විදේශ රැකියා, විශ්‍රාම වැටුප්, රෙජිස්ට්‍රාර් ජනරාල්, පොලිස් ආදී විවිධ ආයතන වලින් එකතු කරන දත්ත එම ආයතනවලින් ලබා ගෙන දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ වෙත ලබාදී ඇත.

- දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සකස් කරනු ලබන නිලධාරින් සඳහා පුහුණු වැඩ සටහනක් 2017 අප්‍රේල් මස 05 සහ 06 දිනයන්හි පුහුණු අංශයේ දී පවත්වන ලදී.

- දත්ත නිරවද්‍යතාවය පරික්ෂා කිරීමේ වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් සකස්කර ලබාදී ඇත.

- දත්ත වගු ආකෘති භාෂා දෙකකින් හා තුනකින් වන පරිදි දිස්ත්‍රික්ක අනුව සැකසීම.

**VII. ක්ෂේත්‍ර නිලධාරින්ගේ කාර්යක්ෂමතාවය හා හැකියා ප්‍රවර්ධනය කිරීමේ වැඩමුළු (SEC)**

- High Brand Team පෞද්ගලික පුහුණු කිරීම් ආයතනය හා සම්බන්ධ වෙමින් දිස්ත්‍රික් ක්ෂේත්‍ර නිලධාරින් සඳහා තෙදින නේවාසික පුහුණු වැඩමුළු 03 ක් වාරියපොල වයඹ පුහුණු ආයතනයේ දී පහත සඳහන් දිනවල පවත්වන ලදී.

1 වන පුහුණු වැඩමුළුව - 2017 ඔක්තෝබර් 25, 26 සහ 27
2 වන පුහුණු වැඩමුළුව - 2017 ඔක්තෝබර් 31, නොවැම්බර් 01 සහ 02
3 වන පුහුණු වැඩමුළුව - 2017 නොවැම්බර් 14, 15 සහ 16

ක්‍රියාකාරි සැලැස්මෙහි අතුලත් නොවන පහත සඳහන් කාර්යයන් ද ක්ෂේත්‍ර කළමනාකරණ අංශය විසින් 2017 වර්ෂයේ දී සිදු කර ඇත.

- බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී 2017 මාර්තු 31 අප්‍රේල් 01, 02, 03, 04 දිනවල පැවති තිරසර යුගයක් ජාතික ප්‍රදර්ශනයේ දෙපාර්තමේන්තු ප්‍රදර්ශන කුටිය සංවිධානය කිරීම.

## මූල්‍ය කාර්ය සාධනය - 2017

| අනු අංකය | ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුළු මුදල (රු.මි.) | 2017/12/31 දක්වා වැය කරන ලද මුදල (රු.මි.) |
|---|---|---|---|
| 1 | දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ සහ ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීම සඳහා තාක්ෂණික හා පරිපාලනමය පහසුකම් සැපයීම. | 14.5 | 13.68 |
| 2 | අමාත්‍යංශ, දෙපාර්තමේන්තුවල ඇති සංඛ්‍යාලේඛන අංශ සම්බන්ධිකරණය සහ ඇගයීම. | 0.05 | 0.05 |
| 3 | කාර්යක්ෂම දිස්ත්‍රික් කාර්යාල තේරීම | 0.15 | - |
| 4 | දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානින් හා ප්‍රධාන කාර්යාලයීය අංශ ප්‍රධානින්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික වැඩමුළු පැවැත්වීම. | 0.55 | 0.6 |
| 5 | කාර්යසාධනය සහ ප්‍රගතිය නිරීක්ෂණය, සාකච්ඡා කිරිම සඳහා කමිටු රැස්වීම් පැවැත්වීම. (ප්‍රජාවිද්‍යාත්මක, කර්මාන්ත, කෘෂිකර්ම) | 0.05 | 0.043 |
| 6 | දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සැකසීම. | 0.70 | 0.248 |
| 7 | දිස්ත්‍රික් ක්ෂේත්‍ර නිලධාරින් සඳහා කාර්යක්ෂමතා හා හැකියා ප්‍රවර්ධනය කිරීමේ වැඩමුළු (SEC) | 2.0 | 1.766 |

## 3.9 පුහුණු අංශය

I. **කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

දෙමළ මාධ්‍ය කේත ලිපිකරු/සිංහල මාධ්‍ය කේත ලිපිකරු නිලධාරින් සහ දත්ත සටහන් ක්‍රියාකරු/කේත ලිපිකරු නිලධාරින් සඳහාද කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා ඇත.

II. **පරිගණක පුහුණු වැඩසටහන්**

නිලධාරීන් 97 දෙනෙකු පුහුණු කර ඇත. පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමාණවත් අයදුම්පත් නොලැබීම හා සම්පත් දායකයින් ලෙස සහභාගි වන දෙපාර්තමේන්තු නිලධාරීන් කාර්ය බහුලවීමෙන් නියමිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

III. **සංඛ්‍යාන පුහුණු වැඩසටහන්**

දේශීය නිලධාරීන් 143ක් හා නේපාලයේ සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය 9දෙනෙක් පුහුණු කරවා ඇත. මීට අමතරව E-learning පාඨමාලා සඳහා නිලධාරීන් සම්බන්ධීකරණය කිරීම, 9 වන අංශය මඟින් පවත්වනු ලැබූ සංචාරක වියදම් සමීක්ෂණය, 3 වන අංශය මඟින් පවත්වනු ලැබූ ආහාර ශේෂ පත්‍ර සකස් කිරීම, කෘෂිකාර්මික ගෘහ ඒකක සමීක්ෂණය, 2 වන අංශය මඟින් පවත්වනු ලැබූ ශ්‍රම ඉල්ලුම පිළිබඳ සමීක්ෂණ ආදී වැඩසටහන් පැවැත්වීම සඳහා දේශන ශාලා සැපයීම පරිගණක විද්‍යාගාරය,ශබ්ද විකාශන පහසුකම් ආදී යටිතල පහසුකම් සැපයීම සිදු කරන ලදී.කෙසේ නමුදු පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමාණවත් අයදුම්පත් නොලැබීම හා සම්පත් දායකයින් ලෙස සහභාගි වන දෙපාර්තමේන්තු නිලධාරීන් කාර්ය බහුලවීමෙන් නියමිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

IV. **පුහුණු මොඩියුල සකස් කිරීම හා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම**

සකසන ලද මොඩියුල වලට අනුකූලව නිලධාරීන් 68 දෙනෙකු පුහුණු කරවා ඇත.

V. **විදේශීය පුහුණු වැඩසටහන් සම්බන්ධ දේශන මාලාව**

විදේශීය පුහුණු පාඨමාලාවන්ට සහභාගිවූ නිලධාරීන් විදේශ රටවල ලබාගත් දැනුම දෙපාර්තමේන්තු නිලධාරීන්ට ලබාදීම සඳහා සෑම මසකම පුහුණු සැසියක් පැවැත්වීමට නියමිතව තිබුණි. විදේශීය පුහුණු පාඨමාලාවන්ට සහභාගිවූ නිලධාරීන් 22 දෙනෙකු විසින් තේමාත්මක වැඩ සටහන් යටතේ නිලධාරීන් 304 දෙනෙකු දැනුවත් කරන ලදී.

VI. **ව්‍යවහාරික සංඛ්‍යාන සහතික පත්‍ර පාඨමාලාව**

මෙම පාඨමාලාව සඳහා අයදුම් කරන නවක නිලධාරීන් දෙපාර්තමේන්තුවට බඳවා ගැනීමේදී සංඛ්‍යානය පිළිබඳ දැනුමක් සහිතව පැමිනෙන බැවින් අයදුම්කරුවන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන නිසා මෙම පාඨමාලාව ආරම්භ කිරීමට නොහැකි වී ඇත.

VII. **බාහිර ආයතන හා සම්බන්ධවී සිදු කරන පුහුණු පාඨමාලා**

බාහිර ආයතන මඟින් සම්පත් දායකයින් ලබා ගැනීමෙන් හෝ බාහිර ආයතන වෙත දෙපාර්තමේන්තු නිලධාරීන් යොමු කිරීමෙන් සිදුකරන පුහුණු වැඩසටහන් මඟින් නිලධාරීන් 983ක් පුහුණු කර ඇත. ඉහත II,III,IV,V,VI යන කාර්යන් වල ඉලක්කගත මූල්‍ය ප්‍රගතිය ලබා ගත නොහැකි වුවද එම මුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් සඳහා බාහිර පුහුණු ආයතන වෙත නිලධාරීන් යොමු කිරීමෙන්ද, පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දීමෙන්ද ඵලදායි ලෙස මුදල් ප්‍රතිපාදන වියදම් කර ඇත.

VIII. දෙමළ/ඉංග්‍රීසි පුහුණු වැඩසටහන්

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හා අප දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය සම්බන්ධවී සංඛ්‍යාලේඛනඥවරුන් 23 දෙනෙකු සඳහා දින 17ක ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. දෙමළ රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබා ගැනීමට අවශ්‍ය නිලධාරීන් සඳහා පැය 105ක වැඩසටහන් පවත්වා නිලධාරීන් 40දෙනෙකු පුහුණු කරවා ඇත.

## මූල්‍ය කාර්ය සාධනය - 2017

| අනු අංකය | ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුළු මුදල (රු.මිලි.) | 2017/12/31 දක්වා වැය කරන ලද මුදල (රු.මිලි.) |
|---|---|---|---|
| 1 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 0.005 | 0.004 |
| 2 | පරිගණක පුහුණු වැඩසටහන් | 0.5 | 0.044 |
| 3 | සංඛ්‍යාන පුහුණු වැඩසටහන් | 0.5 | 0.17 |
| 4 | පුහුණු මොඩියුල සකස් කිරීම හා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම | 0.765 | 0.198 |
| 5 | විදේශීය පුහුණු වැඩසටහන් සම්බන්ධ දේශන මාලාව | 0.1 | 0.03 |
| 6 | ව්‍යවහාරික සංඛ්‍යාන සහතික පත්‍ර පාඨමාලාව | 0.35 | - |
| 7 | බාහිර ආයතන හා සම්බන්ධවී සිදු කරන පුහුණු පාඨමාලා | 1.5 | 1.60 |
| 8 | දෙමළ/ඉංග්‍රීසි පුහුණු වැඩසටහන් | 0.34 | 0.32 |

## 3.10 පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශය

### I. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය

රටේ ප්‍රතිපත්ති සම්පාදනයට සහ ශ්‍රමබල සැලසුම් කිරීමට අවශ්‍ය රාජ්‍ය අංශයේ (මධ්‍යම රජය සහ පළාත් රාජ්‍ය) සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව සහ එම නිලධාරීන්ගේ ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ ආර්ථික තොරතුරු පිළිබඳව නිවැරදි සංඛ්‍යාලේඛන රැස්කිරීම සඳහා 2016 නොවැම්බර් මස 17 වන දින මෙම සංගණනය පවත්වන ලදී. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සියලු ආයතන තුළ පවත්වන ලද මෙම සංගණනයේ සාරාංශ ලේඛන, දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීම, එම සාරාංශ ලේඛනවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීම හා සංගණන මූලික වාර්තාව සඳහා දත්ත සැකසුම් කටයුතු හා දත්ත විශ්ලේෂණය සිදු කිරීම හා සංගණන මූලික වාර්තාව සකස් කර ප්‍රකාශයට පත් කිරීම මෙම වර්ෂය ආරම්භයේදී සිදු කරන ලදී. මිලියන 1.1 වන සංගණන ප්‍රශ්නාවලි හා අනෙකුත් ලේඛන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීම, සංගණන ප්‍රශ්නාවලි තේරීම හා ගබඩා කිරීම, සංගණන ප්‍රශ්නාවලි කේත කිරීම හා සංස්කරණය කිරීම, ප්‍රශ්නාවලි ආයතන වශයෙන් අංක කිරීම, පොත් වශයෙන් සකස් කිරීම හා ලේබල් කිරීම, දත්ත සැකසුම් කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන අංශයට වෙත ප්‍රශ්නාවලි නිකුත් කිරීම මෙම වර්ෂය තුළ අඛණ්ඩව සිදු කරන ලදී. සංගණන අමු දත්ත ගොනු අධ්‍යයනය කර අවශ්‍ය දත්ත ශෝධන (Data Cleaning) හා දත්ත සංස්කරණ හඳුනාගැනීමේ කටයුතුද මෙම වර්ෂය තුළදී ආරම්භ කරන ලදී.

මෙම සංගණනයේදී සේවා නියුක්තිය පිළිබඳ තොරතුරු රැස්කිරීමට සමගාමීව සිදු කරන ලද රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල ආයතනික වත්කම් පිළිබඳ සාරාංශ තොරතුරු ලැයිස්තුගත කිරීමේ ප්‍රශ්නාවලි නැවත ගෙන්වා ගැනීම, ප්‍රතිචාර නොලැබුනු ආයතන වලට නැවත දැනුම්දීම් සිදු කර අදාළ ප්‍රශ්නාවලි සම්පූර්ණ කර නැවත ගෙන්වා ගැනීමට කටයුතු කිරීම, එම ප්‍රශ්නාවලිවල සම්පූර්ණත්වය තහවුරු කිරීම හා පිළිවෙළට ගබඩා කිරීම මෙම වර්ෂය තුළ සිදු කරන ලදී.

### II. නිල සංඛ්‍යාති වැඩසටහන

නිල සංඛ්‍යාති වැඩසටහන මගින් රටේ විවිධ ආයතන සතු දත්ත උපයෝගීකරගෙන සකස් කළ හැකි දර්ශකාංක හඳුනාගෙන, එම දර්ශකාංක දත්ත පරිහරණය කරන්නන් වෙත විධිමත්ව ලබාදීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීම සිදු කරයි. මෙම වැඩසටහන ජාතික දත්ත කමිටුවට අනුබද්ධ අනුකමිටු 23ක් හරහා සිදු කරනු ලබන අතර මෙහිදී එක් එක් විෂයයන්ට අදාල ප්‍රධාන ආයතන හඳුනාගෙන එම ආයතන වල නියෝජිතයන්ගෙන් සැදුම්ලත් අනුකමිටු පිහිටුවා එම අනුකමිටු මගින් ක්ෂේත්‍රයට අදාළ දර්ශකාංක හඳුනාගෙන එම දර්ශකාංක සකස් කිරීමේ ක්‍රමවේදය, නිකුත් කරනු ලබන කාල පරාසය යනාදිය ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් සකස් කළ යුතු වේ. 2017වර්ෂය අවසන් වන විට සෑම අනුකමිටුකම වැඩ සම්පූර්ණයෙන් නිම කර අවසන් වාර්තාව භාරදී ඇත.

### III. ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංඛ්‍යාති සකස් කිරීම (Preparing Gender Statistics)

මෙම විෂය හා සම්බන්ධ විවිධ ආයතන වෙත දත්ත ඉල්ලීම් ඉදිරිපත් කිරීම, ඒ අනුව විවිධ ආයතනවලින් ලැබෙන දත්ත පරීක්ෂා කිරීම හා දත්තවල කිසියම් නොගැලපීමක් ඇත්නම් අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් එම නොගැලපීම් නිවැරදි කරවා ගැනීම සිදු කිරීම හා එම දත්ත හා දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන සංගණන හා සමීක්ෂණ මගින් ලබා ගන්නා දත්ත ඇතුළත් කර ස්ත්‍රී/පුරුෂ භාවයට අදාළ සංඛ්‍යාති ප්‍රකාශයට පත්කිරීම සඳහා වන වෙබ් පිටුව යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

IV. ජාතික තොරතුරු කමිටුවට අදාල රාජකාරී කටයුතු

ශ්‍රී ලංකාවේ දත්ත සපයනු ලබන ප්‍රධාන ආයතන තුනක් වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, මහාභාණ්ඩාගාරය හා ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණායතනය සම්බන්ධ කරගනිමින් කලට වේලාවට විශ්වසනීය ආකාරයට දත්ත නිකුත් කිරීම තහවුරු කිරීම, දත්ත වල ද්විකරණය (duplication) වැලැක්වීම හා සියලු දෙනා සඳහා දත්ත විවෘත කිරීම පදනම් කරගනිමින් 2015 වර්ෂයේදී ජාතික තොරතුරු කමිටුව ස්ථාපනය කරන ලදී. ජාතික තොරතුරු කමිටු රැස්වීම්වලට සහභාගී වෙමින් මෙම කමිටුවේ කාර්යයන් සඳහා සහයෝගය ලබාදීම දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේදීද අඛණ්ඩව සිදු කරන ලදී.

V. පර්යේෂණ හා විශේෂ අධ්‍යයන කටයුතු

දෙපාර්තමේන්තුව තුළ පර්යේෂණ කටයුතු සිදු කිරීමට විශේෂ කැමැත්තක් දක්වන විධායක නිලධාරීන් හඳුනාගෙන එම නිලධාරීන් වෙනුවෙන් පර්යේෂණ යෝජනාවලියක් විද්‍යානුකූලව සකස් කිරීම හා පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර සම්පත්දායකයෙක් තෝරාගැනීම සිදු කරන ලද අතර මේ සම්බන්ධව සම්පත්දායක සමග මූලික සාකච්ඡාවක් පවත්වා පුහුණුව පවත්වනු ලබන ක්‍රමවේදය/ දින වකවානු තීරණය කරන ලදී.

VI. දර්ශනපති උපාධි සඳහා ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහන

මෙම වැඩසටහන සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් දේශීය පාඨමාලා සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දීම සඳහා වන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර ඉන් එක් නිලධාරියෙක් සඳහා පුහුණු වැය ශීර්ෂය මගින් ප්‍රතිපාදන ලබා දෙන ලදී. මෙම වැඩසටහන සඳහා අයදුම්පත් යොමු කර තිබූ අනෙක් නිලධාරියාට ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවන ලෙස දැනුම්දෙන ලදී.

VII. ඉදිරි දත්ත මුදාහැරීමේ දින සටහන

වර්ෂය ආරම්භයේදී 2017 වර්ෂය සඳහා ඉදිරි දත්ත මුදාහැරීමේ දින සටහන සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කරන ලද අතර එතැන් සිට එහි යාවත්කාලීන කිරීම් සිදු කිරීම අඛණ්ඩව වර්ෂය පුරා සිදු කරන ලදී.

## 2017 වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පහතින් දැක්වේ.

| අනු අංකය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් | **2017** වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලියන) | **2017/12/31** දක්වා වැයකරන ලද මුදල (රු. මිලියන) |
|---|---|---|---|
| 01 | රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 2016 | 1.93 | 1.93 |

## 3.11 මිල හා වේතන අංශය

### I. ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) : පදනම 2013 = 100

ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013=100) ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමේ නිල මිණුම ලෙස 2015 ඔක්තෝම්බර් මාසයේ සිට භාවිතා කරනු ලැබේ. 2017, නොවැම්බර් මාසය දක්වා මුළු දිවයිනම ආවරණය වන පරිදි ජාතික පාරිභෝගික මිල දර්ශකය දර්ශකය (NCPI) (පාද වර්ෂය 2013 = 100) ගණනය කර සෑම මසකම මිල දර්ශකය, ඊළඟ මස 21 දින ගැසට් නිවේදනය, මාධ්‍ය නිවේදනය, පුවත්පත් මගින් සහ දෙපාර්තමේන්තු වෙබ්අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කර ඇත.

2017, නොවැම්බර් මාසය දක්වා මාස්පතා දර්ශකාංකය ගණනය කිරීම පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රධාන මිල වෙනස්වීම් පෙන්නුම් කරන "ජාතික පාරිභෝගික මිල දර්ශකය" පුවත් නිවේදනය දෙපාර්තමේන්තු වෙබ්අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇත. එමෙන්ම 2017, නොවැම්බර් මාසය දක්වා මාස්පතා දර්ශකාංකය ගණනය කිරිම පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රධාන මිල වෙනස්වීම් පෙන්නුම් කරන "ජාතික පාරිභෝගික මිල දර්ශකය" ප්‍රවෘත්ති නිවේදනය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත. අදාල ප්‍රවෘත්ති වාර්තා මාධ්‍ය ආයතන වෙත ලබා දීම සඳහා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු වෙත ලබා දී ඇත. මිල දර්ශකාංකය ඇතුලත් නිවේදනය දිනමිණ, ඩෙලිනිවුස් හා තිනකරන් යන පුවත්පත් වල සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කර ඇත. 2017 නොවැම්බර් මස දක්වා ගණනය කරන ලද ජාතික පාරිභෝගික මිල දර්ශකාංකය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇත. මිල දර්ශකාංකය නිකුත් කිරීමත් සමඟ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු වලට අදාල තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇත. 2017 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය පහත වගුව මගින් දැක්වේ.

**වගු අංක 7: ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම 2013=100)**

| මාසය | දර්ශක අගය |
|---|---|
| | **2017** |
| ජනවාරි | 119.3 |
| පෙබරවාරි | 119.9 |
| මාර්තු | 119.5 |
| අප්‍රේල් | 121.0 |
| මැයි | 121.8 |
| ජූනි | 123.4 |
| ජූලි | 122.4 |
| අගෝස්තු | 122.3 |
| සැප්තැම්බර් | 123.3 |
| ඔක්තෝම්බර් | 124.8 |
| නොවැම්බර් | 126.4 |

කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ඉල්ලීම පරිදි පඩි පාලක සභා ආඥාපණත යටතේ කරදමුංගු, කොකෝවා හා ගම්මිරිස් වගා කරුවන්ගේ විශේෂ ජීවන වියදම් දීමනාව ගණනය කිරීම සඳහා ජාතික පාරිභෝගික මිල දර්ශකයේ D1-D6 කාණ්ඩයට අදාලව පාරිභෝගික මිල දර්ශකය 2017, ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා ගණනය කර කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.

## II. පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීමට අවශ්‍ය මිල තොරතුරු ලබා ගැනීම සඳහා මිල හා වේතන අංශයේ නිලධාරීන් විසින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශ ආවරණය වන පරිදි පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණය සිදු කරනු ලැබේ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික සීමාව තුල මධ්‍යස්ථාන 14 කින් භාණ්ඩ පැස සඳහා 2017 වසරේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මිල ගණන් රැස් කිරීම සිදු කර ඇත. මෙහිදී තෝරාගත් භාණ්ඩ හා සේවාවන්හි මිල තොරතුරු අඛණ්ඩව තෝරාගත් වෙළඳසැල් වලින් එක් එක් භාණ්ඩය සඳහා සකසා ඇති පිරිවිතර තත්වයන්ට අනුකූලව එක්රැස් කරනු ලැබේ. 2017 වසරේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ලැබී ඇති මිල තොරතුරු පරීක්ෂා කර පරිගණක ගත කර ඇත.

## III. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) : පදනම 2013=100

කොළඹ පාරිභෝගික මිල දර්ශකය මිල දර්ශකය(පාද වර්ෂය 2006/07 = 100), පාද වර්ෂය 2013 = 100 ලෙස 2017 ජනවාරි මාසයේදී යාවත්කාලීන කරන ලදී. කොළඹ දිස්ත්‍රික් නාගරික ප්‍රදේශ ආවරණය වන පරිදි 2013 පදනම් වර්ෂය ලෙස සලකා කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2017 ජනවාරි මස සිට ප්‍රකාශයට පත් කරනු ලබේ. ඒ අනුව 2017, දෙසැම්බර් මාසය දක්වා දර්ශකාංක ගණනය සෑම මාසයකම රාජකාරී ඉටුකරන අවසාන දින දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කර ඇත. එමෙන්ම 2017, දෙසැම්බර් මාසය දක්වා දර්ශකාංකය ගණනය කිරීම පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රධාන මිල වෙනස්වීම් පෙන්නුම් කරන "කොළඹ පාරිභෝගික මිල දර්ශකාංකය" පුවත් නිවේදනය මාසිකව දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කොට ඇත. මිල දර්ශකාංකය නිකුත් කිරීමත් සමඟ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු වලට අදාල තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත ලබා දීම සිදුකර ඇත. 2017 වසරේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ විචලනය පහත වගුව මගින් දැක්වේ.

වගු අංක 8: කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම 2013=100)

| මාසය | දර්ශක අගය |
|---|---|
| | 2017 |
| ජනවාරි | 116.1 |
| පෙබරවාරි | 116.7 |
| මාර්තු | 116.5 |
| අප්‍රේල් | 117.1 |
| මැයි | 118.2 |
| ජුනි | 120.1 |
| ජූලි | 119.4 |
| අගෝස්තු | 118.8 |
| සැප්තැම්බර් | 119.7 |
| ඔක්තෝම්බර් | 120.8 |
| නොවැම්බර් | 122.2 |
| දෙසැම්බර් | 122.9 |

## IV. දිස්ත්‍රික් නාගරික සිල්ලර සහ නිෂ්පාදකයාගේ මිල ගණන් රැස් කිරීම

මෙම අංශය මගින් ඉටු කරනු ලබන තවත් කාර්යයක් වන්නේ ජාතික පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සඳහා දිස්ත්‍රික් නාගරික සිල්ලර මිල ගණන් හා නිෂ්පාදකයාගේ මිල ගණන් රැස්

කිරීමයි. පළමු, දෙවන, තෙවන සහ හතරවන කාර්තු සඳහා සියළුම දිස්ත්‍රික්ක වල ප්‍රධාන නගරයන්හි ආහාර හා විවිධ පාරිභෝගික භාණ්ඩ පිලිබඳ සිල්ලර මිල ගණන් සතිපතා, සති දෙකකට වරක්, මාසිකව හා කාර්තුමය පදනමක් මත දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයට අනුයුත්ක නිලධාරීන් විසින් එක් රැස් කර මෙම අංශය වෙත එවා ඇත. ඊට අමතරව නිෂ්පාදකයාගේ මිල දර්ශකය ගණනය කිරීම සඳහා දේශීයව නිෂ්පාදනය කෙරෙන කෘෂිකාර්මික, සත්ත්ව හා ධීවර නිෂ්පාදන ද්‍රව්‍ය සඳහා නිෂ්පාදකයාගේ මිල ගණන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රමවත්ව, මාසිකව දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සංඛ්‍යාන කාර්ය මණ්ඩලය යොදා ගැනීමෙන් එක් රැස් කරවා මිල හා වේතන අංශය වෙත ගෙන්වා පරීක්ෂා කර පරිගණක කර ඇත.

මිල තොරතුරු ඇතුලත් කර 2016 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා සතිපතා සිල්ලර මිල ගණන් (කොළඹ දිස්ත්‍රික්කය) හි මිල විවරණිකාවේ 25 වන නිකුතුව මුද්‍රණය කර ප්‍රකාශනයට පත් කරන ලදී.

2013-2016 දක්වා විස්තර ඇතුලත් සිල්ලර සහ නිෂ්පාදකයාගේ මිල ගණන් පිලිබඳ විවරණිකාවේ 34 වන නිකුතුව මුද්‍රණය කර ප්‍රකාශනයට පත් කරන ලදී.

තවද, මෙම සිල්ලර මිල තොරතුරු සහ නිෂ්පාදකයාගේ මිල තොරතුරු ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයට කාර්තුමය වශයෙන් (පළමු, දෙවන, තෙවන සහ හතරවන කාර්තු සඳහා) ලබා දී ඇත. මෙයට අමතරව දත්ත භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවයන් සඳහාද මිල තොරතුරු ලබා දී ඇත. ආහාර ද්‍රව්‍ය, විවෘත වෙළඳ පොළ සිල්ලර මිල තොරතුරු ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ නිළධාරින් වෙත සතිපතා ඉදිරිපත් කර ඇත. මෙම මිල ගණන් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේද ප්‍රකාශයට ප්‍රකාශයට පත් කොට ඇත.

## v. නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI) : පදනම 2013 Q4=100

නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ කෘෂිකර්ම අංශයේ ගණනය කිරීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන 36 ක මිල තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අනුයුන්ත ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මගින්ද, කර්මාන්ත අංශය සඳහා ගණනය කිරීම් වලට අදාල මිල තොරතුරු තෝරාගත් ආයතන 376 කින්ද, උපකාරක සේවා සඳහා විදුලිබල මණ්ඩලය හා ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින්ද 2017 නොවැම්බර් මස දක්වා තොරතුරු ලබා ගෙන පරිගණක ගත කර ඇත. සෑම මසකම නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI) (පාද වර්ෂය 2013 q4=100) එම මස අවසන් වී දින 45 කට පසුව දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලබයි. 2017 වසරේ ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ විචලනය පහත වගුව මගින් දැක්වේ. එමෙන්ම 2017, නොවැම්බර් මාසය දක්වා දර්ශකාංකය ගණනය කිරීම පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රධාන මිල වෙනස්වීම් පෙන්නුම් කරන "නිෂ්පාදකයාගේ මිල දර්ශකාංකය" පුවත් නිවේදනය මාසිකව දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කොට ඇත.

වගු අංක 9: නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ විචලනය (පදනම 2013 Q4=100)

| මාසය | දර්ශක අගය |
|---|---|
| | **2017** |
| ජනවාරි | 117.8 |
| පෙබරවාරි | 120.1 |
| මාර්තු | 120.6 |
| අප්‍රේල් | 123.4 |
| මැයි | 126.0 |
| ජුනි | 127.9 |
| ජුලි | 125.4 |
| අගෝස්තු | 124.9 |
| සැප්තැම්බර්* | 126.6 |
| ඔක්තෝම්බර්* | 128.5 |
| නොවැම්බර්** | 130.2 |

සටහන : * - සංශෝධිත ** - යාවකාලිකයි

### VI. ආසියානු පැසිපික් කලාපයේ ජාත්‍යන්තර සංසන්දනාත්මක වැඩසටහන (International Comparision Programme)

ආසියානු සංවර්ධන බැංකුව මෙහෙයවීමෙන් කරනු ලබන ආසියානු පැසිපික් කලාපයේ ජාත්‍යන්තර මිල සංසන්දනාත්මක වැඩසටහන (ICP) යටතේ 2017, 1 වන කාර්තුවට අදාල ගෘහ ඒකකයන් යටතට නොනැගෙන යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම්, රජය විසින් සිදු කරනු ලබන වේතන සඳහා අදාල මිල තොරතුරු එක්රැස් කොට පරීක්ෂා කර පරිගණක ගතකොට ආසියානු සංවර්ධන බැංකුව වෙත යවා ඇත.

මෙම ICP වැඩ සටහන යටතේ 2017, 2 වන කාර්තුවට අදාලව සියළුම දිස්ත්‍රික්කයන්හි (මුළු දිවයිනම ආවරණය වන පරිදි) ගෘහ ඒකකයන් පරිභෝජනය කරන භාණ්ඩ හා සේවාවන් සඳහා මිල තොරතුරු එක් රැස් කොට ඇති අතර, කොළඹ දිස්ත්‍රික්කය සඳහා තොරතුරු පරීක්ෂා කිරීමෙන් අනතුරුව ආසියානු සංවර්ධන බැංකුව වෙත යවා ඇත.

ආසියානු සංවර්ධන බැංකුව මගින් ලබා දෙන ලද ICP-APSS මෘදුකාංගයේ පැවති දෝෂ සහ අප දිස්ත්‍රික් කාර්යාල වල පවතින පරිගණකයන්හි පවතින අඩුපාඩු හේතුවෙන් එම මෘදුකාංගය, Patch File මගින් යාවත්කාලීන කරන තුරු දිස්ත්‍රික් කාර්යාලයන්හි දත්ත පරිගණක ගත කිරීම ආරම්භ කිරීමට ප්‍රමාද විය. එමෙන්ම මෙම වැඩසටහන යටතේ 2017, 3 වන කාර්තුවට අදාලව සියළුම දිස්ත්‍රික්කයන්හි ගෘහ ඒකකයන් පරිභෝජනය කරන භාණ්ඩ හා සේවාවන් සඳහා මිල තොරතුරු එක්රැස් කොට පරීක්ෂා කර පරිගණක ගතකොට ආසියානු සංවර්ධන බැංකුව වෙත යවා ඇත. තවද මෙම වැඩසටහන යටතේ 2017, 4 වන කාර්තුවට අදාලව සියළුම දිස්ත්‍රික්කයන්හි ගෘහ ඒකකයන් පරිභෝජනය කරන භාණ්ඩ හා සේවාවන් සඳහා මිල තොරතුරු එක්රැස් කොට ඇත.

### VIII. ත්‍රිවිධ හමුදා සේවා පුද්ගලයන්ගේ සලාක දීමනාව ගණනය කිරීම

රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි, 2017 වර්ෂය සඳහා මාසිකව ගණනය කරන ලද ත්‍රිවිධ හමුදා සේවා පුද්ගලයන්ගේ සලාක වටිනාකම යුධ හමුදාපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සකස් කර ඇත.

## මූල්‍ය කාර්ය සාධනය - 2017

| අනු අංකය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලියන) | 2017/12/31 දක්වා වැයකරන ලද මුදල (රු. මිලියන) |
|---|---|---|---|
| 01 | පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණය | 0.810 | 1.020 |
| 02 | දිස්ත්‍රික් නාගරික මිල හා නිෂ්පාදන මිල ගණන් රැස් කිරීම | 0.482 | |
| 03 | ජාත්‍යන්තර මිල සැසඳීමේ වැඩසටහන | 3.476 | 3.241 |

## 3.12 සිතියම් විද්‍යා අංශය

2021 වර්ෂයේ පැවැත්වීමට නියමිත ජන හා නිවාස සංගණනය මූලික කොට ගෙන මහනුවර, මාතලේ, අම්පාර, මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල චන්ද්‍රිකා ඡායාරූප භාගත කිරීමේ කටයුතු අවසන් කර ඇත. එමෙන්ම, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, පුත්තලම, අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික්කවල 2012 ජන හා නිවාස සංගණනයට භාවිතා කරන ලද සිතියම් පරිලෝකනය කිරීමේ කටයුතු ද අවසන් කර ඇත. භූගෝලීය දත්ත පද්ධතිය සකස් කිරීමේ කටයුතු රත්නපුර, මහනුවර, අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්ක වල අවසන් කර ඇත. තවද, බදුල්ල, මොනරාගල, රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්ක වල සිතියම් Geo referencing කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කවල සිතියම් අංකිත කිරීම සිදු කරමින් පවතී.

ග්‍රාම නිලධාරි කොට්ඨාශ සිතියම් අංකිත කිරීමේ කටයුතු බදුල්ල, කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක වල අවසන් කර ඇති අතර මොනරාගල, මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්ක වල පිළිවෙළින් ග්‍රාම නිලධාරි කොට්ඨාශ සිතියම් වලින් 86%, 47% හා 14% ක් අවසන් කර ඇත. දකුණු පලාතේ දිස්ත්‍රික්ක 3 හි , උතුරු පලාතේ දිස්ත්‍රික්ක 5 හි, ගම්පහ හා කළුතර දිස්ත්‍රික්කවලට අයත් සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පුහුණු පංති පවත්වා අවසන් කර ඇති අතර එම දිස්ත්‍රික්ක වලට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ සිතියම් 4981 ක් මුද්‍රණය කර ක්ෂේත්‍ර කටයුතු සඳහා ලබා දී ඇත. එම දිස්ත්‍රික්ක 10 හි ක්ෂේත්‍ර කටයුතු සිදුවෙමින් පවතින අතර ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 17 කට අයත් සිතියම් 727 ක් ක්ෂේත්‍ර කටයුතු අවසන් කර සිතියම් විද්‍යා අංශයේ නිලධාරීන් විසින් භාර ගෙන ඇති අතර සංගණන ඛාණ්ඩ සිතියම් අංකිත කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. තවද, රජයේ අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු සහ ඒ සම්බන්ධ ආයතන ඉල්ලීම් මත අදාල සිතියම් සකස් කිරීමේ කටයුතු සිදු කර ඇත.

### මූල්‍ය කාර්ය සාධනය - 2017

| අනු අංකය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලියන) | 2017/12/31 දක්වා වැයකරන ලද මුදල (රු. මිලියන) |
|---|---|---|---|
| 01 | ක්ෂේත්‍ර කටයුතු සැලසුම් කිරීම ( සිතියම් මුද්‍රණය කිරීම, උපදෙස් පොත් සකස් කිරීම ආදිය) (දකුණු සහ උතුරු පලාත් වලට අයත් දිස්ත්‍රික්ක, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල සිතියම් මුද්‍රණය කිරීම.) | 5.647 | 6.3853 |
| 02 | දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය සහ ග්‍රාම නිලධාරීන් සිතියම් පරීක්ෂා කිරීම සඳහා පුහුණු කිරීම. (දකුණු සහ උතුරු පලාත් වලට අයත් දිස්ත්‍රික්ක, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක සඳහා පුහුණු පංති පැවැත්වීම.) | 1.646 | 1.4368 |
| 03 | ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම. (දකුණු සහ උතුරු පලාත් වලට අයත් දිස්ත්‍රික්ක, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක වල ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම.) | 11.707 | 0.6627 |
| එකතුව | | 19.0 | 8.48 |

## 3.13 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණවල දත්ත සැකසුම් කටයුතු ද ඇතැම් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට අනුයුක්ත සංඛ්‍යාලේඛන අංශ වලට අයත් දත්ත සැකසුම් කටයුතුද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මගින් සිදු කරන ලදී.

I. **ආර්ථික සංගණනය කෘෂිකාර්මික අංශය**
දත්ත සංස්කරණ කටයුතු අවසන් කර ඇති අතර සියළුම දත්ත වගු නිකුත් කර ඇත.

II. **රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ සංගණනය**
මේ වන විට ආයතන 17 ක දත්ත පරිගණක ගත කිරීමේ කටයුතු අවසන් කර ඇත.

III. **ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය - 2017**
CAPI පරිගණක වැඩසටහන අවසන් කර ඇති අතර 2018 වර්ෂය සඳහා වූ CAPI මෘදුකාංගය නියැදි සමීක්ෂණ අංශයට ලබා දී ඇත.

IV. **වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම.**
2017 වර්ෂයට අදාල වැඩි දියුණු කිරීමේ කටයුතු නියමිත පරිදි අවසන් කර ඇත.

V. **"ලංකා දත්ත" (Lanka Datta)**
2017 වසරට දත්ත ඉල්ලුම් කරන්නන් සඳහා දත්ත නිකුත් කිරීමේ අවසන් කර ඇත.

VI. **"Lanka SIS" සංඛ්‍යාන තොරතුරු පද්ධතිය**
2017 වර්ෂයට අදාල යාවත්කාලීන කිරීම සිදු කොට අවසන් කර ඇත.

VII. **Digital Display unit**
2017 වර්ෂයට අදාල යාවත්කාලීන කටයුතු අවසන් කර ඇත.

VIII. **කර්මාන්ත නිෂ්පාදන ත්‍රෛමාසික සමීක්ෂණය**
ඉහත සමීක්ෂණයට අදාලව භාවිතා කල හැකි පරිදි 2017 වර්ෂයට අදාල මෘදුකාංග සංවර්ධනය කිරීමේ කටයුතු අවසන් කර ඇත.

IX. **පරිගණක නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම**
2017 වර්ෂයට අදාල පරිගණක නඩත්තු කිරීමේ කටයුතු සිදු කර ඇත.

X. **Sever Room Power Backup modification**
මේ සඳහා අදාල කොන්ත්‍රාත් ආයතනයට වැඩ කටයුතු භාර දී ඇත.

XI. **(STATA/ Network Monitoring) මෘදුකාංගය**
මෙම මෘදුකාංගය මිලට ගෙන සර්වර් පරිඝණකයෙහි ස්ථාපනය කර ඇත.

XII. **සංඛ්‍යාන ව්‍යාපෘති නාමාවලිය (SBR) වැඩිදියුණු කිරීම (පළමු අදියර)**
මෙම අදියරේ වැඩ කටයුතු අවසන් කොට අදාල අංශයට ලබා දී ඇත.

XIII. **කෘෂිකාර්මික ගෘහ ඒකක සමීක්ෂණය (AHS) - 2017/18 (පළමු වටය)**
මෙම සමීක්ෂණයට අදාල CAPI තාක්ෂණය මගින් දත්ත එක් රැස් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කාර්යයන් සියල්ල අවසන් කර ඇත.

XIV. **පාසල් සංගණනය - 2017**
දත්ත පරිගණක ගත කිරීම හා නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම.
රජයේ පාසැල් , පිරිවෙන් අධ්‍යාපන ආයතනවල අදාල මෘදුකාංග නිපදවීම අවසන්කර ඇත. පෞද්ගලික පාසැල් හා අවධිමත් ආයතන වලට අදාල මෘදුකාංග නිපදවමින් පවතී.

XV. **ජන හා නිවාස සංගණනය - 2021**
ග්‍රාම නිලධාරි කොට්ඨාශ හා සංගණන කාණ්ඩ සිතියම් ගත කිරීම හා මේවා සර්වර් පරිගණකයෙහි ස්ථාපනය කිරීම සිදු කෙරෙමින් පවතී.

XVI. **මිල රැස් කිරීම සඳහා වූ CAPI පරිගණක වැඩසටහන**
මෙම පරිගණක වැඩසටහන සඳහා වූ මෘදුකාංග නිපදවා අවසන් කර ඇත.

XVII. **Network Monitoring System වැඩි දියුණු කිරීම**
2017 වර්ෂයට අදාලව දෙපාර්තමේන්තු පරිගණක ජාල යාවත්කාලීන කිරීම හා වැඩි දියුණු කිරීම අවසන් කර ඇත.

XVIII. **"Lanka StatMap" සිංහල හා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම**
මෙම වෙබ් වැඩසටහන සංවර්ධනය කර ස්ථාපනය කොට ඇත.

XIX. **"SARA" ව්‍යාපෘතිය**
මෙම ව්‍යාපෘතියට අදාල දත්ත සැකසුම් පද්ධතිය නිර්මාණය අවසන් කර සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා දී ඇත.

XX. **Online Census for Industry (වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය )**
මේ සඳහා වූ මෘදුකාංගය සංවර්ධනය කරමින් පවතී.

XXI. **සහශ්‍ර සංවර්ධන ඉලක්ක (SDG) වෙබ් පිටුව වැඩි දියුණු කිරීම**
මෙම වෙබ් පිටුව සංවර්ධනය කර ස්ථාපනය කර ඇති අතර යාවත්කාලීන කරමින් පවතී.

XXII. **Poverty People of Sri Lanka**
මෙම මෘදුකාංගය නිර්මාණය කිරීම අවසන් කොට ඇත

XXIII. **ජන හා නිවාස සංගණනය 2021 - තොරතුරු තාක්ෂණ කටයුතු**
ප්‍රශ්ණාවලිය සැකසීමේ කටයුතු වලට අදාල තොරතුරු තාක්ෂණ නිරීක්ෂණ ලබා දී ඇත.

## 3.14 දත්ත නිකුත් කිරීමේ ඒකකය

### I. ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ , ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය (Dissemination Policy on MicroData) අනුව මෙම වර්ෂය තුළදී දත්ත ඉල්ලීම් 52ක් සඳහා නොමිලයේද, ඉල්ලීම් 4ක් සඳහා මුදල් අයකිරීමේ පදනම මතද දත්ත නිකුත් කරන ලදී. මේ යටතේ ලෝක බැංකුව සහ ගාමිණී කොරයා පදනම වෙත දත්ත අලෙවි කිරීමෙන් රු: 976634.88 මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම පිණිස දෙපාර්තමේන්තුව ගිණුම වෙත යොමු කර ඇත.

### II. පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම

ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුවෙහි ගරු මැති ඇමතිවරුන්ගේ වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය වන දත්ත හා තොරතුරු ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවනු ලබන ඉල්ලීම් සඳහා දත්ත ලබා දීම සිදු කරන්නේද මෙම ඒකකය මඟිනි. අදාල පාර්ලිමේන්තු ප්‍රශ්නයට අනුව දෙපාර්තමේන්තුවේ විවිධ අංශ සම්බන්ධීකරණය කරගනිමින් අදාල පිළිතුරු සකසා මුදල් අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ලබාදීම මෙහිදී සිදුකරනු ලැබේ. මේ යටතේ 2017 වර්ෂයේදී ඉල්ලීම් 05ක් ලැබුණු අතර ඒ සියල්ලටම පිළිතුරු ලබා දීමට කටයුතු කරන ලදී.

### III. වෙනත් ආයතන වල දත්ත ඉල්ලීම් සඳහා තොරතුරු ලබාදීම

දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලබන විවිධ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සහ පුද්ගලයින් විසින් කරනු ලබන දත්ත ඉල්ලීම් සඳහා අදාල තොරතුරු සැපයීමද දත්ත නිකුත් කිරීමේ ඒකකය මඟින් සිදුකරනු ලබයි. මෙම වර්ෂය තුලදී සාමාන්‍ය තැපැල මඟින් හා විද්‍යුත් තැපැල මඟින්ද, දුරකථනය මඟින්ද ලද ඉල්ලීම් 200කට පමණ තොරතුරු සැපයීම සිදු කර ඇත.

### IV. තොරතුරු දැන ගැනීමේ පනතට අදාළ රාජකාරී ඉටු කිරීම

2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිලිබඳ පනත 2017 පෙබරවාරි 01 වැනි දින සිට බලාත්මක කරන ලදී. ඒ අනුව තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉදිරිපත් වන ඉල්ලීම් අදාල අංශ වෙත යොමු කර එම තොරතුරු ලබා දීම දත්ත නිකුත් කිරීමේ ඒකකය විසින් සිදු කරනු ලබයි.2017 වර්ෂයේදී තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලීම් 20ක් සහ අභියාචනා 04ක් සඳහා පිළිතුරු ලබා දීම සිදු කර ඇත.

### V. දෙපාර්තමේන්තු ප්‍රකාශන අලෙවි කවුළුව පවත්වාගෙන යාම

දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන මුද්‍රිත ප්‍රකාශන අළෙවිය මෙම ඒකකයෙහි පිහිටුවා ඇති අලෙවි කවුළුව මඟින් සිදු කෙරේ. තවද 2017 මාර්තු 31 සහ අප්‍රේල් 01, 02, 03, 04 යන දිනයන්හි බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවති තිරසාර යුගයක ජාතික ප්‍රදර්ශනය සඳහාද, ඔවුන්ගේ ඉල්ලීම මත දෙපාර්තමේන්තු ප්‍රකාශණ අලෙවි කුටියක් පිහිටුවීමට මෙම ඒකකය විසින් දායකත්වය සපයන ලදී.

2017 වර්ෂයේ මුද්‍රිත ප්‍රකාශන පිටපත් 393ක් සහ CD තැටි 16ක් අලෙවි කර ඇත.

**VI. ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය යාවත් කාලීන කිරීම**

සංශෝධිත ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීම ප්‍රතිපත්තිය සඳහා දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මඟින් නිර්දේශ ඉදිරිපත් කර ලබා ගැනීම සිදු කරනු ලද අතර මෙය ඊලග වසරේදී අමාත්‍යාංශ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.
ඒ අනුව 2017 වර්ෂයේ අප ඒකකය වෙත පැවරුණු කාර්යයන් සාර්ථකව ඉටු කරන ලදි.

## 3.15 මුද්‍රණ අංශය

දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ සංගණන හා සමීක්ෂණ වල පහත නම් සඳහන් වාර්තා මෙන්ම ඊට අදාල උපලේඛන, ප්‍රශ්නාවලීන් හා උපදෙස් අත්පොත් දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලය මගින් මුද්‍රණය කිරීම සිදු කරන ලදී.

- කර්මාන්ත ඉදිකිරීම් සමීක්ෂණය - 2015 අවසන් වාර්තාව
- වී පිළිබඳ සංඛ්‍යාලේඛන - 2015/16 මහ
- කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ග්‍රාම නිලධාරී මට්ටමේ තොරතුරු 2013/14
- සංඛ්‍යාන අත්පොත සිංහල/දෙමළ 2016
- සංඛ්‍යාන නිබන්ධනය - 2015
- ක්‍රියාකාරී සැලැස්ම
- දෙපාර්තමේන්තු ලිපි ශීර්ෂ, ප්‍රසංශා සහතික පත්‍ර
- ශ්‍රමබල සමීක්ෂණ උපලේඛන - සිංහල, දෙමළ
- NASP උපලේඛන (පිටු 04 - සිංහල,පිටු 02 - සිංහල, පිටු 04 - දෙමළ, පිටු 02 - දෙමළ)
- ශ්‍රමබල සමීක්ෂණය අවසන් වාර්තාව - 2016
- ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණ වාර්තාව - 2016 , ෆයිල් කවර සහ ආරාධනා පත්‍ර
- ශ්‍රමබල සමීක්ෂණය කාර්තු වාර්තා - 2016 ( 1 , 2, 3, 4 කාර්තු වාර්තා)
- තිරසාර ලංකා පොත් සලකුණු සහ අත් පත්‍රිකා
- SPSS මූලික කරුණු
- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ රැකියා පිළිබඳ සංගණනය 2016 (මූලික වාර්තාව)
- පාසල් සංගණන වාර්තාව - 2015ල 2016
- සංඛ්‍යාන සාක්ෂරතාවය ඉහල නැංවීමේ වැඩසටහන් ගොනු කවර
- ආර්ථික සංගණනයේ අවසන් වාර්තාව (විධිමත් කර්මාන්ත සඳහා)
- ශ්‍රී ලංකා මධ්‍යම නිෂ්පාදන වර්ගීකරණය ( SLCPC)
- කාර්මික නිෂ්පාදන දර්ශකය ( 1වන කාර්තුව 2017)
- අර්තාපල් නිෂ්පාදන ව්‍යාප්තිය ඇස්තමේන්තු කිරීම
- කෘෂිකාර්මික ගෘහ ඒකක 17/18 ලැයිස්තු ගත කිරීමේ ලේඛනය - සිංහල, දෙමළ
- F1 ෆෝරම
- වී පිළිබඳ සංඛ්‍යාලේඛන - 2016 යල
- කපා හෙලන ලද දැව කදන් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමේ ආකෘති පත්‍ර
- දැව පරිමා වගුව
- දෙපාර්තමේන්තු කාර්යය සාධන වාර්තා
- ගොඩනැගිලි සංඛ්‍යාලේඛන
- පරිගණක සාක්ෂරතා වාර්තාව (ජනවාරි-ජුනි)
- ශ්‍රම බල සමීක්ෂණ වාර්ෂිකවාර්තාව - 2016
- ශ්‍රම ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය - 2016 (උපලේඛන)
- සංඛ්‍යාන අත්පොත - 2016 ගම්පහ දිස්ත්‍රික්කය
- ජාත්‍යන්තර මිල සැසඳීමේ වැඩ සටහන ආකෘති පත්‍ර ( සතිපතා මිල,මාසික මිල, කාර්තු)
- සතිපතා සිල්ලර මිල ගණන්
- ජන හා නිවාස සංගණනය - 2021 සිතියම් සකස් කිරිම - උපලේඛන (MP-1,MP-2,MP-3,MP-4,MP-5), ග්‍රාම නිලධාරි සාරාංශ ලේඛන, ග්‍රාම නිලධාරි උපදෙස් පොත්
- ශ්‍රී ලංකා මධ්‍යම නිෂ්පාදන වර්ගීකරණය (කාර්මික අංශය)
- ශ්‍රම බල සමීක්ෂණ උපලේඛන (සිංහල)
- දෙපාර්තමේන්තු ශීර්ෂ ලිපි, සටහන් පොත්
- LG-1 පෝරම (සිංහල සහ දෙමළ)
- ශ්‍රී ලංකාවේ සංවර්ධන ඉලක්කයන් -2017
- ශ්‍රී ලංකාවේ පාරිසරික සංඛ්‍යාති -2015
- වාර්ෂික කර්මාන්ත සමීක්ෂණ වාර්තාව -2015

- ජන හා නිවාස සංගණනය-2021 සංඛ්‍යාලේඛන නිලධාරින්ගේ සහ ග්‍රාම නිලධාරි උපදෙස්
- සංඛ්‍යාන පුවත්පත (Statistical Newsletter) - ජුලි 2017
- ඇස්තමේන්තුගත ප්‍රමාණය හා අර්තාපල් නිෂ්පාදනය
- ළමා ක්‍රියාකාරකම් පිලිබඳ අමසන් වාර්තාව (සිංහල, දෙමල)
- නිවාඩු අයදුම්පත් පෝරම
- පරිගණක සාක්ෂරතාවය සංක්ෂිප්ත වාර්තාව-ඉංග්‍රීසි
- කාල පරිහරණ සංගණන උපලේඛන(සිංහල), උපදෙස් පොත් TSA-1 , TSA-2
- දත්ත පත්‍රිකාව (Data Sheet) - (සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි)
- ග්‍රාම නිලධාරි උපදෙස්
- අමාත්‍යාංශ කාර්ය සාධන වාර්තාව(සාරාංශ සහ වාර්ෂික)
- කාර්මික නිෂ්පාදන දර්ශකය ((IIP) වාර්තාව
- ASH සමීක්ෂණ උපලේඛන-සිංහල,දෙමළ - උපදෙස් පොත්-දෙමළ
- සංචාරක වියදම් සමීක්ෂණය උපදෙස් පොත් - දෙමළ
- කාල පරිහරණ සමීක්ෂණ දින පොත්- සිංහල ,ඉංග්‍රීසි ,දෙමළ
- ක්‍රියාකාරී සැලැස්ම 2017- 1වන සංශොධනය)
- Pocket Book English
- ශ්‍රීලංකා ප්‍රමිති කර්මාන්ත වර්ගීකරණය(SLSIC)
- තෝරාගත් සිල්ලර මිල ගණන් පිලිබඳ විවරණිකාව, 2013-2016
- ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තා, CD කවර
- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ආරාධනා පත්‍ර
- සංඛ්‍යාන අත්පොත-2017 සිංහල/දෙමළ
- P-1 කවර සහ P1, P2 ලේඛන ( සිංහල, දෙමල)
- දර්ද්‍රතා දර්ශකය-2016
- HIES සමීක්ෂණය-2016 අවසන් වාර්තාව
- පළාත් පාලන ආයතන සංඛ්‍යාලේඛන
- LH Register
- ශ්‍රී ලංකාවේ ආර්ථික සංඛ්‍යාති-2017
- සංචාරක වියදම් සමීක්ෂණය උපලේඛන- සිංහල, දෙමළ
- NSHP ලේඛන සිංහල,දෙමළ
- පරිගණක සාක්ෂරතා වාර්තාව 2017 (පළමු මාස 6 සඳහා)
- ජන හා නිවාස සංගණනය -2021 ( MP-1,Mp-2,Mp-3,Mp-4,ග්‍රාම නිලධාරි ලිපි,ලිපි කවර ඇලවීමේ
- ගිණුම් අංශයේ ලෙජර පොත් (පොත් බැඳීම)
- ආර්ථික සංගණනයේ අවසන් වාර්තාව (ඉදිකිරීම්, වෙළඳ හා සේවා සඳහා)

# 3.16 ආයතනික හා ගිණුම් අංශය

## 3.16.1 පරිපාලනය

### I. අංශ හා ඒකක

පහත දැක්වෙන තාක්ෂණික හා සේවා අංශ 15 ක් සහ ඒකක 4 ක් මගින් 2017 වසර තුල කාර්යයන් මෙහෙයවන අතර අභ්‍යන්තර විගණන අංශයකින් ද සමන්විත වේ.

| | |
|---|---|
| 1 වන අංශය | ජන සංගණන හා ප්‍රජා විද්‍යා |
| 2 වන අංශය | කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා |
| 3 වන අංශය | කෘෂිකර්ම හා පාරිසරික |
| 4 වන අංශය | ජාතික ගිණුම් |
| 5 වන අංශය | ප්‍රකාශන |
| 6 වන අංශය | පුස්තකාල හා ප්‍රලේඛන |
| 7 වන අංශය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ |
| 8 වන අංශය | ආයතනික හා ගිණුම් |
| 9 වන අංශය | නියැදි සමීක්ෂණ |
| 10 වන අංශය | මුද්‍රණ |
| 11 වන අංශය | ක්ෂේත්‍ර කළමනාකරණ |
| 12 වන අංශය | පුහුණු |
| 15 වන අංශය | පර්යේෂණ හා විශේෂ අධ්‍යයන |
| 16 වන අංශය | මිල හා වේතන |
| 18 වන අංශය | සිතියම් විද්‍යා |

දත්ත නිකුත් කිරීමේ ඒකකය
අන්තර්ජාතික සංඛ්‍යාලේඛන ඒකකය
තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ ඒකකය
ආපදා කළමනාකරණ සංඛ්‍යාලේඛන ඒකකය
අභ්‍යන්තර විගණන අංශය

### II. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල

මෙම දෙපාර්තමේන්තුව විසින් විවිධ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ තුල ශාඛා කාර්යාල 46 ක් පවත්වාගෙන යයි. මෙම ශාඛා කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරයෙකු, සංඛ්‍යාලේඛනඥවරයෙකු, සංඛ්‍යාලේඛන නිලධාරීවරයෙකු හෝ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරීවරයෙකු යටතේ පවතී.

### III. දිස්ත්‍රික් කාර්යාල

දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කොට ඇති දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ මහවැලි සංවර්ධන බල ප්‍රදේශයට අයත් මහවැලි එච් කලාපයේ තඹුත්තේගම එක් කාර්යාලයක් ද වේ. මෙම කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරයෙකු හෝ සංඛ්‍යාලේඛනඥවරයෙකු භාරයේ පවතින අතර ඔහුට සහාය වීමට සංඛ්‍යාලේඛන නිලධාරීන් සහ සංඛ්‍යාලේඛන සහකාරවරුන් ද අනුයුක්ත කොට ඇත. ඒ ඒ දිස්ත්‍රික්කය තුළ දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සමීක්ෂණ, සංගණන වලට අදාලව දත්ත රැස් කිරීම

මෙම කාර්යාල මඟින් සිදු කෙරේ. දිස්ත්‍රික්කය තුළ සංඛ්‍යාලේඛන කටයුතු පිළිබද සම්බන්ධීකරණය කරනු ලබන්නේද මෙම දිස්ත්‍රික් කාර්යාල මඟිනි.

IV. පළාත් සභාවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය

වෘත්තීය දක්ෂතා පෙන්වන සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කරමින් පළාත් සභාවල සංඛ්‍යාලේඛන සේවාව සැපයීම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. මේ අනුව කාර්ය මණ්ඩලය පළාත් සභාවලට අනුයුක්ත කර ඇත. වඩාත් සුදුසු සංඛ්‍යානමය සම්බන්ධීකරණය, සංඛ්‍යාලේඛන ප්‍රමිතීන් පවත්වාගෙන යාම හා කාර්ය මණ්ඩලයේ උපරිම ප්‍රයෝජන ලබා ගැනීම මෙමගින් තහවුරු කර ඇත.

V. කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත සංඛ්‍යාව | 2017.12.31 දිනට සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( සංඛ්‍යාන) | 3 | 3 | 0 |
| 3 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (තොරතුරු තාක්ෂණ) | 1 | 0 | 1 |
| 4 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පරිපාලන) | 1 | 1 | 0 |
| 5 | අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | 11 | 0 | 11 |
| 6 | අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 1 | 0 |
| 7 | අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 2 | 0 | 2 |
| 8 | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 |
| 9 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| 10 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | 34 | 0 | 34 |
| 11 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 6 | 3 (තවත් නිලධාරීන් 3 දෙනෙකු තො.ස.තා. සේවයේ 1 පංතියේ II ශ්‍රේණියට උසස් වී ඇත.) | 0 |
| 12 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 0 | 1 |
| 13 | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 15 | 7 | 8 |
| 14 | ගණකාධිකාරී | 2 | 2 | 0 |
| 15 | අභ්‍යන්තර විගණක | 1 | 0 | 1 |
| 16 | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ } | 37 | 29 } | - ◊ |
| 17 | සංඛ්‍යාලේඛනඥ } | 200 | 109 } | 62 ® |
| 18 | මුද්‍රණ කළමණාකරු | 1 | 0 | 1 |
| 19 | පරිපාලන නිලධාරී | 1 | 1 | 0 |
| 20 | සංඛ්‍යාලේඛන සැලසුම්කරු | 1 | 0 | 1 |
| 21 | පුස්තකාලයාධිපති (විශේෂ) | 1 | 0 | 1 |

| | | | | |
|---|---|---|---|---|
| 22 | පුස්තකාලයාධිපති | 3 | 3 | 0 |
| 23 | භාෂා පරිවර්තක | 3 | 2 | 1 |
| 24 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී 2 පන්තිය II,I ශ්‍රේණිය | 30 | 10 | 20 |
| 25 | සංඛ්‍යාලේඛන නිලධාරී | 494 | 319 | 175 |
| 26 | සංවර්ධන නිලධාරී | 64 | 57 | 7 |
| 27 | සංඛ්‍යාලේඛන සහකාර | 202 | 185 | 0 • |
| 28 | අයවැය සහකාර | 1 | 1 | 0 • |
| 29 | සිතියම් විද්‍යාඥ | 1 | 0 | 0 |
| 30 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර 3 පන්තිය III,II,I ශ්‍රේණිය | 262 | 223 | 39 |
| 31 | මුද්‍රණ නිමැවුම්කරු | 5 | 0 | 5 |
| 32 | මුද්‍රණ කාර්මික | 2 | 0 | 2 |
| 33 | කාර්මික නිලධාරී | 1 | 0 | 1 |
| 34 | පෙර මුද්‍රණ සැලසුම්කරු | 3 | 0 | 3 |
| 35 | ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 0 | 1 |
| 36 | පද්ධති පාලක | 6 | 2 | 0 ◊ |
| 37 | ජ්‍යෙෂ්ඨ පද්ධති ක්‍රියාකරු | 3 | 3 | 0 ◊ |
| 38 | වැඩමුලික (මුද්‍රණ) | 1 | 0 | 1 |
| 39 | රාජ්‍ය කළමණාකරණ සහකාර | 170 | 111 | 59 |
| 40 | දත්ත සටහන් ක්‍රියාකරු | 5 | 5 | 0 ◊ |
| 41 | දත්ත සටහන් ක්‍රියාකරු/ කේත ලිපිකරු | 33 | 31 | 2 |
| 42 | ලිපිකරු (සිංහල මාධ්‍ය) | 10 | 6 | 4 |
| 43 | ලිපිකරු (දෙමළ මාධ්‍ය) | 20 | 17 | 3 |
| 44 | කැමරා ක්‍රියාකරු | 1 | 1 | 0 ◊ |
| 45 | ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 1 | 0 |
| 46 | තහඩු සාදන්නා | 1 | 1 | 0 |
| 47 | යන්ත්‍ර පරිවාරක | 2 | 2 | 0 ◊ |
| 48 | ටයිප් සෙටර් | 1 | 1 | 0 |
| 49 | රියදුරු | 55 | 45 | 10 |
| 50 | වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 1 | 0 ◊ |
| 51 | මුද්‍රණ යන්ත්ර සහයක | 1 | 0 | 1 |
| 52 | කාර්යාල කාර්ය සහයක තනතුරු | 107 | 86 | 21 |
| 53 | කාර්යාල කාර්ය සහයක තනතුරු | 10 | 9 | 1 |
| | **එකතුව** | **1822** | **1284** | **479** |
| | රියදුරු (අනියම්) | 3 | 2 | 1 |
| | කාර්යාල කාර්ය සහයක (අනියම්) | 3 | 0 | 3 |
| | **එකතුව** | **1828** | **1286** | **483** |

® - අනුමත සංඛ්‍යාලේඛනඥ තනතුරු 200 ක් තුළ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ තනතුරු 37 ද ඇතුළත්ව ඇති බැවින් බඳවා ගැනීම් කිරීමේදී පුරප්පාඩු සංඛ්‍යාව සැලකිය යුත්තේ එම තනතුරු දෙක(02) ම සඳහා ඒකාබද්ධ සේවක සංඛ්‍යාව 200 ක් සේ සලකමිනි.

• - ශ්‍රී ලංකා සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීමට යටත්ව

◊ - තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව

## VI. විදේශ සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගීවීම - 2017

| අනු අංකය | නම | තනතුර | වැඩසටහන | කාල සීමාව | රට |
|---|---|---|---|---|---|
| 1 | ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මයා<br>කේ.එම්.ඩී.එස්.ඩී.කරුණාරත්න මිය<br>අයි.සී.ප්‍රේමරත්න මිය | අධ්‍යක්ෂ ජනරාල්<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>සංඛ්‍යාලේඛනඥ | ආසියා පැසිෆික් රටවල ජාතික ගිණුම් ක්‍රමය වැඩිදියුණු කිරීම | 2017 ජනවාරි 19 - 14 | වියට්නාමය |
| 2 | කේ.එල්.සී.එස්.වීරසූරිය මයා<br>ඩබ්.ටී.පී.ජී.එන්.සී.වීරසිංහ මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>සංඛ්‍යාලේඛන නිලධාරී | කුඩා, මධ්‍යම සහ මහා පරිමාණ ව්‍යාපාර පිළිබඳ සංඛ්‍යාලේඛන නාමාවලිය සම්බන්ධව පැවැත්වුණු කලාපීය වැඩමුළුව | 2017 ජනවාරි 23- 27 | කාම්බෝජය |
| 3 | කේ.ඩබ්.එස්.සද්ධානන්ද මයා<br>පී.එල්.ඒ.ඒ.හේමන්ත මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>සංඛ්‍යාලේඛනඥ | තිරසාර සංවර්ධනය සඳහා සැකසූ 2030 න්‍යාය පත්‍රයෙහි සඳහන් අන්තර්ජාතික සංක්‍රමණ දත්ත රැස් කිරීම දිරිමත් කිරීම උදෙසා පැවැත්වුණු කලාපීය වැඩමුළුව | 2017 ජනවාරි 31 - පෙබරවාරි 03 | තායිලන්තය |
| 4 | එන්.ඩබ්.දිසානායක මිය | සංඛ්‍යාලේඛනඥ | දකුණු සහ නිරිතදිග ආසියානු රටවල් වල පරිසර සංඛ්‍යාලේඛන පිළිබඳ උපකලාපීය වැඩමුළුව | 2017 පෙබරවාරි 06-08 | තායිලන්තය |
| 5 | ඩී.ජී.එස්.ජී.මුණසිංහ මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන III) | සෞඛ්‍ය ආශ්‍රිත තිරසර සංවර්ධන අභිමතාර්ථ අධීක්ෂණය කිරීම සඳහා පැවැත්වුණු කලාපීය තාක්ෂණික උපදේශන වැඩසටහන | 2017 පෙබරවාරි 09-10 | ඉන්දියාව |
| 6 | ඒ.එම්.යූ.කේ.අලහකෝන් මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | ආසියාවේ ජාතික සංඛ්‍යාලේඛන කාර්යාංශයේ සංඛ්‍යාලේඛන ප්‍රධානීන් සඳහා පැවැත්වූ සංඛ්‍යාලේඛන නායකත්ව පුහුණු වැඩසටහන | 2017 පෙබරවාරි 14-15 | ජපානය |
| 7 | ඒ.ජී.එස්.කාරියවසම් මයා<br>වී.පී.ලලිත් මයා | සංඛ්‍යාලේඛනඥ<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | ජාත්‍යන්තර සැසඳුම් වැඩසටහන පිළිබඳ කලාපීය තාක්ෂණික ඇගයීම සහ පුහුණු වැඩමුළුව | 2017 පෙබරවාරි 23-28 | තායිලන්තය |
| 8 | චාන්දනී විජේබණ්ඩාර මිය | සංඛ්‍යාලේඛනඥ | 20 වෙනි ICLS වැඩසටහන සඳහා සූදානම් වීම පිණිස පැවැත්වූ කම්කරු සංඛ්‍යාලේඛනඥයින් සඳහා වූ කලාපීය රැස්වීම | 2017 පෙබරවාරි 28 - මාර්තු 02 | තායිලන්තය |
| 9 | එම්.පී.පෙරේරා මිය<br>ඒ.එම්.පී.අබේසිංහ මයා | අධ්‍යක්ෂ - පරිපාලන<br>සංඛ්‍යාලේඛනඥ | රාජ්‍ය කළමණාකරන පශ්චාත් උපාධි වැඩසටහන (MPM) යටතේ සිදු කළ දෙවන විදේශ අධ්‍යයන හමුව | 2017 පෙබරවාරි 27 - මාර්තු 11 | චීනය |
| 10 | අයි.ආර්.බණ්ඩාර මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන II) | එක්සත් ජාතීන්ගේ සංඛ්‍යාලේඛන කොමිෂන් සභාවේ 48 වෙනි සැසිවාරයට සහභාගි වීම | 2017 මාර්තු 06-10 | ඇමරිකා එක්සත් ජනපදය |
| 11 | එම්.ඩී.ඩී.ඩී.දීපවංශ මිය | සංඛ්‍යාලේඛනඥ | තිරසර සංවර්ධන අභිමතාර්ථ අධීක්ෂණය කිරීම සඳහා සමාජ ආරක්ෂණ දර්ශක පිළිබඳ හැකියා ප්‍රවර්ධන වැඩමුළුව | 2017 මාර්තු 14-15 | පිලිපීනය |
| 12 | ඩී.එම්.එන්.බණ්ඩාර මයා | සංඛ්‍යාලේඛනඥ | ඵලදායිතා විශ්ලේෂණය පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව (ලෝක බැංකුවේ ගෝලීය දැනුම සහ මැලේසියාවේ පර්යේෂණ මධ්‍යස්ථානය - ඵලදායීතාවය ආයතන මට්ටමින් මැනීම පිළිබඳ වැඩමුළුව) | 2017 මාර්තු 20-22 | මැලේසියාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මයා | අධ්‍යක්ෂ ජනරාල් | ආසියා පැසිෆික් සම්මේලනය: 2030 න්‍යාය පත්‍රයට අනුව නිල සංඛ්‍යාති වෙනස් කිරීම කඩිනම් කිරීම සඳහා සාමූහික ක්‍රියාමාර්ග ගැනීම | 2017 මාර්තු 27-28 | තායිලන්තය |
| 14 | එස්.එම්.එච්.එන්.සමරකෝන් මයා | සංඛ්‍යාලේඛනඥ | ISDR ආසියානු හවුල් ව්‍යාපාර රැස්වීම | 2017 අප්‍රේල් 05-07 | මොංගෝලියාව |
| 15 | යූ.මහේෂ්වරන් මිය<br>ඒ.එල්.රිසා මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>සංඛ්‍යාලේඛන නිලධාරී | කර්මාන්ත ශක්නුතාව ආශ්‍රිත සංඛ්‍යාති පිළිබඳ අන්තර්ජාතික වැඩමුළුව | 2017 අප්‍රේල් 24-26 | චීනය |
| 16 | ජී.අජිතා චාන්දනී මිය | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ප්‍රතිපත්ති විධිමත් පරිදි ක්‍රියාත්මක කරවීම සඳහා සිදුකරනු ලබන වෙනස්කම් ක්‍රමවත් ලෙස කළමණාකරනය කිරීම පිළිබඳ උසස් ජාත්‍යන්තර වැඩසටහන | 2017 මැයි 02-08 | මැලේසියාව |
| 17 | ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මයා<br>කේ.එම්.ඩී.එස්.ඩී.කරුණාරත්න මිය | අධ්‍යක්ෂ ජනරාල්<br>අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | දෙවන ආසියා- පැසිෆික් ආර්ථික සංඛ්‍යාති සතිය (APES 2017) : 3 වන ESCAP ව්‍යාපෘති රැස්වීම දෙවන ආසියා- පැසිෆික් ආර්ථික සංඛ්‍යාති සතිය (APES ) : තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කිරීම පිණිස ආර්ථික සංඛ්‍යාති පුළුල් කිරීම | 2017 මැයි 25<br>2017 මැයි 22- 25 | තායිලන්තය |
| 18 | ඒ.කේ.ඩී.සී.එන්.එස්. කරුණාරත්න මයා | සංඛ්‍යාලේඛනඥ | ආසියාවේ/ අග්නිදිග ආසියාවේ වෙසෙන තරුණයින් නගාසිටුවීම පිළිබඳ සාක්ෂිමත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය | 2017 මැයි 29- ජූනි 01 | තායිලන්තය |
| 19 | ජේ.ලියනගේ මයා<br>ටී.ආර්.ඩී.පද්මසිරි මිය | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛන නිලධාරී | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) - දකුණු ආසියානු කලාපීය පුහුණු සහ තාක්ෂණික සහය මධ්‍යස්ථානය : SA:17:13 කාර්තුමය ජාතික ගිණුම් | 2017 ජූනි 12 - 16 | ඉන්දියාව |
| 20 | අයි.ආර්.බණ්ඩාර මිය<br><br>ඩී.ඩී.ජී.ඒ.සෙනෙවිරත්න මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන I)<br>අධ්‍යක්ෂ | ජන හා නිවාස සංගණනය සැලසුම් කිරීම සහ කළමණාකරනය පිළිබඳ කලාපීය වැඩමුළුව | 2017 ජූනි 19-23 | තායිලන්තය |
| 21 | ජී.එස්.උඩුවන මයා<br>යූ.ඩබ්.එන්.ඩී.අළුත්වත්ත මිය | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛන නිලධාරී | කෘෂිකාර්මික නිෂ්පාදන සංඛ්‍යාති, සන්නිවේදනය සහ සංඛ්‍යාති සම්බන්ධ උපදේශන සඳහා වැය වන වියදම පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව | 2017 ජූනි 26-30 | දකුණු කොරියාව |
| 22 | එස්.යූ.බී.ජයමහ මයා | සංඛ්‍යාලේඛනඥ | තිරසර සංවර්ධනය සඳහා වැදගත්වන දත්ත ලබා ගැනීම පිළිබඳ වැඩසටහන | 2017 ජූනි 27-29 | දකුණු කොරියාව |
| 23 | ටී.එන්.රාජපක්ෂ මිය<br>පී.එච්.වල්පිට මිය<br>එස්.ටී.ටී.වරාපිටිය මයා | සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛන නිලධාරී | අන්තර්ජාතික සැසඳුම් වැඩසටහන යාවත්කාලීන කිරීම පිළිබඳ තාක්ෂණික ඇගයීම් සහ පුහුණු කලාපීය වැඩමුළුව | 2017 ජූනි 29 - ජූලි 05<br>2017 ජූනි 29 -30<br>2017 ජූලි 03-04 | තායිලන්තය |
| 24 | සී.ජයවික්‍රම මිය<br>එම්.ඩී.ඩී.ඩී.දීපවංශ මිය<br>සී.එස්.ලියනගේ මිය | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛන සහකාර | බහුවිධ දරිද්‍රතා මිනුම සහ විශ්ලේෂණය | 2017 ජූලි 14-15 | මොරොක්කෝව |
| 25 | ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මයා<br>එච්.පී.එල්.ජයරත්න මිය | අධ්‍යක්ෂ ජනරාල්<br>සංඛ්‍යාලේඛනඥ | එක්සත් ජාතීන්ගේ ප්‍රධාන දේශපාලනික සංසදයේදී පැවැත්වුණු සංඛ්‍යාති පිළිබඳ සාකච්ඡාව | 2017 ජූලි 14-15 | ඇමරිකා එක්සත් ජනපදය |
| 26 | ඩී.එම්.එන්.බණ්ඩාර මයා<br>ඩබ්.බී.ජේ.වික්‍රමාරච්චි මයා<br>එච්.එල්.ටී.පී.ප්‍රනාන්දු මයා | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛන සහකාර | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) - දකුණු දිග ආසියා කලාපීය පුහුණුව සහ තාක්ෂණික සහය මධ්‍යස්ථානය : SA:17:4 බාහිර අංශය පිළිබඳ සංඛ්‍යාති | 2017 ජූලි 24-28 | ඉන්දියාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 27 | එස්.ජයවින්තන් මයා | සංඛ්‍යාලේඛන නිලධාරී | ඉන්දියාවේ පිහිටුවා ඇති තාක්ෂණික හා ආර්ථික සංස්ථා (ITEC) යටතේ පුහුණු අවකාශ ශිෂ්‍යත්ව ක්‍රමය/ISEC විධිමත් පාඨමාලා - 71 වන වාරය | 2017 අගෝස්තු 01 - 2018 මැයි 31 | ඉන්දියාව |
| 28 | සී.පී.චන්ද්‍රසේකර මිය | සංඛ්‍යාලේඛනඥ | පරිගණක ආශ්‍රිත සම්මුඛ පරීක්ෂණ (CAPI) පිළිබඳ වැඩමුළුව | 2017 ජූලි 31 - 2017 අගෝස්තු 04 | ජපානය |
| 29 | එස්.ටී.සී.ගවේෂිකා මිය | සංඛ්‍යාලේඛනඥ | EAPRO-ROSA MICS සමීක්ෂණ සැලසුම් පිළිබඳ අනුබද්ධිත වැඩමුළුව | 2017 අගෝස්තු 07 - 14 | තායිලන්තය |
| 30 | අයි.ආර්.බණ්ඩාර මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන I) | කිසිවකු නොහැර' සංකල්පය යටතේ ලබාගත් දත්ත සම්බන්ධ ජන හා සමාජ සංඛ්‍යාති පිළිබඳ කලාපීය මෙහෙයවීම් කණ්ඩායම් සඳහා පැවැත්වූ පළමු රැස්වීම | 2017 අගෝස්තු 28-31 | තායිලන්තය |
| 31 | පී.එම්.පී.අනුර කුමාර මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන III) | ආහාර හා කෘෂිකර්මය අංශය ආශ්‍රිත තිරසර සංවර්ධන අභිමතාර්ථ අධීක්ෂණය කිරීම සඳහා කලාපීය උපදේශන වැඩසටහන සහ ආහාර සුරක්ෂිතතාවය සඳහා භාවිතා කරන තාක්ෂණික ක්‍රම පිළිබඳ නිරූපණාත්මක වැඩමුළුව | 2017 සැප්තැම්බර් 04-08 | තායිලන්තය |
| 32 | එස්.එම්.එච්.එන්.සමරකෝන් මයා<br>ඩබ්.බී.එම්.ආර්.වීරසේකර මයා | සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛන නිලධාරී | ආසියා - පැසිෆික් රටවල පවතින ආපදා ආශ්‍රිත සංඛ්‍යාති පිළිබඳ විශේෂඥ කණ්ඩායමෙහි 5 වන රැස්වීම සහ නැගෙනහිර හා ඊශානදිග ආසියාවේ පැවතිය හැකි ආපදා අවධානම පිළිබඳ වැඩමුළුව | 2017 සැප්තැම්බර් 20-22 | දකුණු කොරියාව |
| 33 | යූ.වී.ආර්.එස්.ගුණවර්ධන මිය | සංඛ්‍යාලේඛනඥ | තිරසර සංවර්ධන අභිමතාර්ථ අධීක්ෂණය සහ වාර්තා කිරීම සඳහා ඉඩම් ගණනය කිරීම පිළිබඳ කලාපීය වැඩමුළුව | 2017 සැප්තැම්බර් 25-27 | තායිලන්තය |
| 34 | සුගුමරන් මයා | සංඛ්‍යාලේඛන නිලධාරී | ආසියා - පැසිෆික් කලාපයේ ජාත්‍යන්තර සේවක (කම්කරු) සංක්‍රමණ සංඛ්‍යාති පිළිබඳ දත්ත රැස්කිරීම සඳහා පැවැත්වුණු 3 වන වැඩමුළුව | 2017 සැප්තැම්බර් 25-27 | දකුණු කොරියාව |
| 35 | ඩී.ඩී.ජී.ඒ.සෙනෙවිරත්න මිය | අධ්‍යක්ෂ | තිරසර සංවර්ධන අභිමතාර්ථ සඳහා රැස්කරන ලද විවෘත දත්ත පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | 2017 සැප්තැම්බර් 25-27 | දකුණු කොරියාව |
| 36 | කේ.ඒ.එස්.පී. කොඩිකාර මිය | සංඛ්‍යාලේඛනඥ | ව්‍යාපාර ලේඛන පිළිබඳ විශේෂඥ කණ්ඩායමේ ද්විවාර්ෂික රැස්වීම | 2017 සැප්තැම්බර් 27-29 | ප්‍රංශය |
| 37 | ඩබ්.ඒ.සී.විජේබණ්ඩාර මිය | සංඛ්‍යාලේඛනඥ | අවිධිමත් අංශයේ සංඛ්‍යාති (දිල්ලි කණ්ඩායම) පිළිබඳ විශේෂඥ කණ්ඩායම සඳහා පැවැත්වුණු 12 වන රැස්වීම | 2017 ඔක්තොම්බර් 02-03 | ස්විට්සර්ලන්තය |
| 38 | ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මයා | අධ්‍යක්ෂ ජනරාල් | තිරසර සංවර්ධනය උදෙසා සැකසූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ කලාපීය දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන - 2017 | 2017 ඔක්තොම්බර් 02-04 | පිලිපීනය |
| 39 | ඒ.ජී.එස්.කාරියවසම් මයා<br>පී.එච්.වල්පිට මිය | සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛනඥ | ආසියා - පැසිෆික් රටවල පර්යේෂණ සිදු කිරීම සඳහා සැකසුණු ජාත්‍යන්තර සැසඳුම් වැඩසටහන | 2017 ඔක්තොම්බර් 04-11 | තායිලන්තය |
| 40 | ඩබ්.එච්.පී.ඩබ්. වීරසිරි මයා | අධ්‍යක්ෂ (තො.ස.තා) | සංගණන හා සමීක්ෂණ දත්ත සැකසුම පිළිබඳ කලාපීය වැඩමුළුව | 2017 ඔක්තොම්බර් 09-20 | පිලිපීනය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 41 | ඒ.එන්.ද සිල්වා මිය<br>එන්.ඩබ්.දිසානායක මිය | සංඛ්‍යාලේඛන නිලධාරී<br>සංඛ්‍යාලේඛන නිලධාරී | අවිධිමත්භාවය පිළිබඳ කලාපීය පාඨමාලාව : අර්ථ දැක්වීම, මිනුම්, තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ වෙනත් ප්‍රතිපත්ති දර්ශක | 2017 ඔක්තොම්බර් 16-20 | ජපානය |
| 42 | ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මයා<br>අයි.ආර්.බණ්ඩාර මිය | අධ්‍යක්ෂ ජනරාල්<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන I) | දුබලතා සංඛ්‍යාති පිළිබඳ වොෂින්ටන් කණ්ඩායමේ 17 වෙනි රැස්වීම | 2017 ඔක්තොම්බර් 30- නොවැම්බර් 02 | ඕස්ට්‍රේලියාව |
| 43 | ජේ.පී.එන්.මල්ලවආරච්චි මයා | සංඛ්‍යාලේඛනඥ | තිරසර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාත්මක කිරීම පිළිබඳ දකුණු සහ නිරිතදිග ආසියා සංසදය | 2017 නොවැම්බර් 01-02 | නේපාලය |
| 44 | ජී.යූ.එන්.පෙරේරා මයා<br>ඩබ්.ඒ.එස්.මල්කාන්ති මිය | සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛන නිලධාරී | ගෝලීය ආර්ථිකය තුළ පවතින කම්කරු සහ රැකියා නියුක්තිය අතර සම්බන්ධතාවය | 2017 නොවැම්බර් 06 - 24 | ඉන්දියාව |
| 45 | සී.ඩී.ද සිල්වා මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2015 වර්ෂයේ පසුවිපරම් සිදු කිරීමේ ශක්‍යතාවය ශක්තිමත් කිරීම පිළිබඳ පැවැත්වුණු ගිණුම් සංවර්ධන ව්‍යාපෘතියේ 3 වන වැඩමුළුව | 2017 නොවැම්බර් 06- 10 | පිලිපීනය |
| 46 | ඩී.ඩී.බස්නායක මිය | සංඛ්‍යාලේඛනඥ | සංඛ්‍යාති වල දියුණුව සඳහා ජාතිකමය වශයෙන් ගත හැකි ක්‍රමෝපායන් පිළිබඳ 4 වෙනි කලාපීය පුහුණු පාඨමාලාව | 2017 නොවැම්බර් 07 - 09 | ජපානය |
| 47 | කේ.ඩී.පී.ප්‍රියදර්ශන මයා<br>ඩබ්.ඒ.ආර්.මංගලිකා මිය | සංඛ්‍යාලේඛන නිලධාරී<br>සංඛ්‍යාලේඛන සහකාර | ST. 17.23: කාර්තුමය ජාතික ගිණුම් (QNA) පිළිබඳ පාඨමාලාව | 2017 නොවැම්බර් 06 - 17 | සිංගප්පූරුව |
| 48 | බී.ජී.කේ.ප්‍රේමලතා මිය<br>යූ.එස්.දිල්රුක්ෂි මිය | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛනඥ | නිල සංඛ්‍යාති වල ක්ෂුද්‍ර දත්ත විශ්ලේෂණය පිළිබඳ 9 වෙනි ජාත්‍යන්තර වැඩමුළුව | 2017 නොවැම්බර් 08 - 15 | ජපානය |
| 49 | යූ.මහේෂ්වරන් මිය<br>ජේ.එස්.එන්.පී.ධර්මවර්ධන මයා | අධ්‍යක්ෂ<br>සංඛ්‍යාලේඛනඥ | ආර්ථික සංඛ්‍යාති පිළිබඳ කලාපීය වැඩසටහන | 2017 නොවැම්බර් 13 - 15 | තායිලන්තය |
| 50 | ඒ.එම්.යූ.කේ.අලහකෝන් මයා | අධ්‍යක්ෂ | කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංඛ්‍යාති දියුණු කිරීම සඳහා ගෝලීය ක්‍රමෝපායන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ආසියා - පැසිෆික් සඳහා වන කලාපීය මෙහෙයුම් කමිටුවෙහි 7 වන රැස්වීම | 2017නොවැම්බර් 15 - 17 | තායිලන්තය |
| 51 | ඩී.එම්.කේ.පී.කේ.දිසානායක මයා<br>ඊ.ආර්.අයි.ඒ.පී.ඩබ්.රණසිංහ | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>සංඛ්‍යාලේඛන නිලධාරී | නව සැපයුම් උපයෝගිතා ගිණුම/ ආහාර ශේෂ පත්‍ර ක්‍රමය සහ සම්පාදන උපාංග පිළිබඳ කලාපීය පුහුණු වැඩසටහන | 2017 නොවැම්බර් 20 - 24 | කොරියාව |
| 52 | යූ.වී.ජයකොඩි මිය | අධ්‍යක්ෂ | සංගණන ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම සහ භාවිතය පිළිබඳ වැඩමුළුව | 2017 නොවැම්බර් 21 - 22 | කොරියාව |
| 53 | ජී.එස්.උඩුවන මයා | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | ගෘහස්ථ සත්ත්ව විවිධත්ව තොරතුරු පද්ධතියෙහි (DAD-IS) නව අනුවාදය ප්‍රකාශයට පත් කිරීම සහ ගෝලීය සහ ජාතික සම්බන්ධීකරණ වැඩමුළුව | 2017 නොවැම්බර් 21 - 23 | ඉතාලිය |
| 54 | කේ.එල්.සී.එස්.වීරසූරිය<br>බී.ඒ.යූ.වර්ණසිරි මයා<br>ඩබ්.ටී.පී.ජී.එන්.සී.වීරසිංහ මයා<br>කේ.එම්.සී.බී.කස්තුරිසිංහ මයා<br>පී.පී.එන්.ඒ.එස්.පෙරේරා මයා<br>ඩබ්.කේ.ටී.පී.කුලරත්න මයා<br>බී.සී.වැලිකල මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>සංඛ්‍යාලේඛනඥ<br>සංඛ්‍යාලේඛන නිලධාරී<br>සංඛ්‍යාලේඛන නිලධාරී<br>සංඛ්‍යාලේඛන නිලධාරී<br>සංඛ්‍යාලේඛන සහකාර<br>තො.ස.තා. නිලධාරී | ව්‍යාපාර ලේඛන පිළිබඳ සංඛ්‍යාති පිළිබඳ කලාපීය තාක්ෂණික පුහුණුව | 2017 නොවැම්බර් 20 - 25 | බ්රුනායි |
| 55 | එම්.ඩී.ඩී.දීපවංශ මිය | සංඛ්‍යාලේඛනඥ | දකුණුදිග ආසියාවේ පවතින ආදායම්, අසමානතාවය සහ දරිද්‍රතාවය තීරණය කිරීම පිළිබඳ අත්දැකීම් සහ අභියෝග පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලනය | 2017 නොවැම්බර් 23 - 24 | ඉන්දියාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 56 | ඩී.ජී.එස්.ජී.මුණසිංහ මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන II) | සමස්ථ සංවර්ධනය සඳහා අවශ්‍ය වන දත්ත අවශ්‍යතා පිළිබඳ අවබෝධ කර ගැනීම සඳහා කලාපීය වැඩමුළුව | 2017 නොවැම්බර් 28 - 31 | තායිලන්තය |
| 57 | වයි.ජී.ආර්.අයි.කුලතිලක මිය | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | ආසියානු ආර්ථික සංවර්ධනය සහ ඒකීයකරණය පිලිබඳ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය ඉගෙනුම් පාඨමාලාව | 2017 නොවැම්බර් 29 - 2017 දෙසැම්බර් 01 | ජපානය |
| 58 | ජේ.එම්.එස්.යූ.බී.ජයමහ මයා | සංඛ්‍යාලේඛනඥ | ආහාර සහ කෘෂිකර්මය ආශ්‍රිත තිරසර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාවට නැංවීම පිණිස දකුණු ආසියාව සඳහා පැවැත්වෙන කලාපීය වැඩමුළුව | 2017 දෙසැම්බර් 02 - 03 | බංග්ලාදේශය |
| 59 | එම්.පී.පෙරේරා මිය | අධ්‍යක්ෂ (පරිපාලන) | කළමණාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | 2017 දෙසැම්බර් 03 - 10 | තායිලන්තය |
| 60 | අයි.ආර්.බණ්ඩාර මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන I) | ආසියා-පැසිෆික් රටවල්හි පැවැත්වෙන සංඛ්‍යාලේඛන ආයතනයේ පාලන සභාවෙහි 13 වන සැසිවාරය ආසියා පැසිෆික් රටවල ජාතික සංඛ්‍යාලේඛන නිලධාරී ප්‍රධානීන් සඳහා පැවැත්වෙන 13 වෙනි කළමණාකරණ සම්මන්ත්‍රණය සහ නව දත්ත මූලාශ්‍ර සඳහා සංඛ්‍යාලේඛන අංශයේ හැකියා ප්‍රවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | 2017 දෙසැම්බර් 04- 07 | ජපානය |
| 61 | ඩබ්.එම්.එස්.ඩී.වන්නිනායක මිය<br>ජී.ජී.ජේ.මැණිකේ මිය | සංඛ්‍යාලේඛන සහකාර<br>සංඛ්‍යාලේඛන සහකාර | ඊකියා ලෝකයේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආශ්‍රිත ගැටළු | 2017 දෙසැම්බර් 04 - 22 | ඉන්දියාව |
| 62 | කේ.ඒ.එස්. කොඩිකාර මිය | අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | තිරසර සංවර්ධන අභිමතාර්ථ සඳහා සංකලනය වූ සංඛ්‍යාති පිළිබඳ විශේෂඥයන් සඳහා පවත්වනු ලබන සම්මන්ත්‍රණය | 2017 දෙසැම්බර් 11 - 13 | තායිලන්තය |
| 63 | බී.ඒ.කේ.ජයකොඩි මයා | සංඛ්‍යාලේඛන නිලධාරී | සංවර්ධනය වෙමින් පවතින රටවල පාරිසරික කෘෂිකර්මය කළමණාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | 2017 ජූනි 29 - ජූලි 26 | චීනය |
| 64 | යූ.එල්.කේ.පෙරේරා මිය | සංඛ්‍යාලේඛනඥ | සංවර්ධනය වෙමින් පවතින රටවල මුහුදුබඩ ප්‍රදේශයන්හි පවතින ආර්ථික කටයුතු ශක්තිමත් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය-2017 (ICM) | 2017 ඔක්තොම්බර් 23 - නොවැම්බර් 11 | චීනය |
| 65 | ආර්.ඩී.එන්.කරුණාසිරි මයා | සංඛ්‍යාලේඛනඥ | අධ්‍යාපන දර්ශක වැඩිදියුණු කිරීම සහ සංඛ්‍යාති පිළිබඳ හැකියා ප්‍රවර්ධනය පිළිබඳව ආසියානු සහයෝගිතා කණ්ඩායම වෙනුවෙන් පැවැත්වූ වැඩමුළුව | 2017 අගෝස්තු 27 - සැප්තැම්බර් 01 | දකුණු කොරියාව |
| 66 | ඩී.පී.ඩබ්.ඩී. වර්ණසූරිය මිය | සංඛ්‍යාලේඛනඥ | අප්‍රිකාව මූලික කරගනිමින් සේවා සංඛ්‍යාති වලට අයත්වන ව්‍යාපාර පිළිබඳ තේමාත්මක පාඨමාලාව (WTO) | 2017 නොවැම්බර් 06 - 10 | ස්විට්සර්ලන්තය |

## VII. උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයෑම් හා විශ්‍රාමයෑම්

**පත් කිරීම්**

| | |
|---|---|
| අධ්‍යක්ෂ (පරිපාලන) | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 04 |
| සංවර්ධන නිලධාරී | 04 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර | 15 |
| රියදුරු (අනියම්) | 02 |

**මුදාහැරීම්**

| | |
|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 |
| සංඛ්‍යාලේඛන සහකාර | 02 |
| ක්ෂේත්‍ර ලිපිකරු (සිංහල මාධ්‍ය) | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 01 |
| සංවර්ධන නිලධාරී | 01 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර | 02 |
| කාර්යාල කාර්ය සහයක | 02 |

**සේවය අතහැරයෑම්**

| | |
|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 |
| සංඛ්‍යාලේඛන සහකාර | 01 |
| කාර්යාල කාර්ය සහයක | 02 |

**විශ්‍රාමයෑම්**

| | |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන) | 01 |
| අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | 01 |
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 01 |
| සංඛ්‍යාලේඛනඥ | 04 |
| සිතියම් විද්‍යාඥ | 01 |
| සංඛ්‍යාලේඛන නිලධාරී | 13 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර | 02 |
| තොරතුරු හා සන්නිවේද තාක්ෂණ සහකාර | 03 |
| කාර්යාල කාර්ය සහයක | 01 |
| රියදුරු | 01 |

**ස්ථාන මාරු**

| | |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) | 01 |
| සහකාර අධ්‍යක්ෂ (තොරුතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 01 |
| සංවර්ධන නිලධාරී | 04 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර | 24 |
| තොරුතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 19 |
| රියදුරු | 05 |
| කාර්යාල කාර්ය සහයක | 11 |

**සේවයෙන් ඉල්ලා අස්වීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන නිලධාරී | 01 |
| තොරුතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 01 |
| සංවර්ධන නිලධාරී | 01 |
| රාජ්‍ය කළමණාකරණ සහකාර | 02 |

**මිය යාම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන නිලධාරී | 03 |
| රියදුරු (අනියම්) | 01 |

## මූල්‍ය කාර්ය සාධනය - 2017

| අනු අංකය | ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුළු මුදල (රු.මි.) | 2017/12/31 දක්වා වැය කරන ලද මුදල (රු.මි.) |
|---|---|---|---|
| 1 | පුනරුත්තාපන හා වැඩි දියුණු කිරීම්(ගොඩනැඟිලි) | 40 | 28 |
| 2 | නඩත්තු හා අළුත්වැඩියා(ගොඩනැඟිලි) | 9 | 6 |

## 3.16.2 ගිණුම් අංශය

## I. මූල්‍ය වාර්තාව - 2017

2017 වර්ෂය සඳහා අදාල සීමාවන් යටතේ වන මුළු ඇස්තමේන්තුගත වියදම රු.1,127,213,222 (මිලියන 1,127.21)කි. මේ අතරින් රු.942,052,000 (මිලියන 942.05) ක් පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු වන අතර රු.185,161,222 ක්(මිලියන 185.16) ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවේ. "පුනරාවර්තන වියදම් 2017" වගුව අනුව සත්‍ය වශයෙන් දරන ලද පුනරාවර්තන වියදම රු. 851,029,819 (මිලියන 851.02)ක් වේ. "ප්‍රාග්ධන වියදම් 2017" වගුවෙහි දක්වා ඇති පරිදි සත්‍ය වශයෙන් දරන ලද ප්‍රාග්ධන වියදම රු. 130,098,865 (මිලියන 130.09) කි.

ඉහත වර්ගකිරීම් යටතේ මුළු පුනරාවර්තන වියදමින් පුද්ගල පඩිනඩි සඳහා දරන ලද වියදම එම ඇස්තමේන්තු ප්‍රතාපාදනයෙන් 91.5% ක් වන අතර අනෙකුත් පුනරාවර්තන වියදම එම ඇස්තමේන්තු ප්‍රතිපාදනය තුල 85.9% ක උපයෝජනයක් පෙන්නුම් කෙරේ.

ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව තුල මූල ධන වත්කම් පුනරාවර්තනය හා වැඩි දියුණු කිරීම එම ඇස්තමේන්තු ප්‍රතිපාදනය තුල 69.5 ක උපයෝජනයක් ද මූල ධන වත්කම් අත්පත් කර ගැනීම එම ඇස්තමේන්තුව තුල 71.5% ක හා හැකියා වර්ධනය 87% ක උපයෝජනයක්ද පෙන්නුම් කෙරිණි.

දේශීය අරමුදල් භාවිතය යටතේ ක්‍රියාත්මක කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති වූ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය පිළිබඳ සංගණනය- 2016 හා ශ්‍රම ඉල්ලුම් සමීක්ෂණය (දේශීය අරමුදල්) පිලිවෙලින් එම ඇස්තමේන්තුව මත 99.2% ක් හා 79.6% ක උපයෝජනයක් අත්කර ගෙන තිබුණි.

විදේශීය අරමුදල් භාවිතා වූ ප්‍රාග්ධන ව්‍යාපෘති යටතේ ළමා ක්‍රියාකාරකම් වැඩසටහන (ජාත්‍යාන්තර කම්කරු සංවිධානය), ආසියා පැසිපික් කලාපයේ ජාත්‍යාන්තර සංසන්දනාත්මක වැඩසටහන (ආසියානු සංවර්ධන බැංකුව), ව්‍යාපාර පිළිබඳ සංඛ්‍යාන නාමාවලිය (ආසියානු සංවර්ධන බැංකුව), සංඛ්‍යාන හැකියා ගොඩ නැංවීම- දරිද්‍රතා මැන බැලීමේ ව්‍යාපෘතිය, ශ්‍රම ඉල්ලුම් සමීක්ෂණය (විදේශීය), කෘෂිකාර්මික ගෘහ ඒකක සමීක්ෂණය යන කාර්යයන්හි එම ඇස්තමේන්තු ප්‍රතිපාදනය මත පිළිවෙලින් 98.3%, 91.8%, 30.1%, 92%, 99.9% හා 18.4% ක උපයෝජනයක් පෙන්නුම් කෙරිණි.

| | | |
|---|---|---|
| ශීර්ෂය | : | 252 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | : | 01 මෙහෙයුම් වැඩ සටහන |
| ව්‍යාපෘතිය | : | පරිපාලනය සහ ජාතික සංඛ්‍යාලේඛන |

**පුනරාවර්තන වියදම් 2017**

| ව්‍යාපෘතිය | වැය විෂයය | 2017 ඇස්තමේන්තුව (මුළු ශුද්ධ වෙන්කිරීම) රුපියල් | 2017 සත්‍ය වියදම රුපියල් |
|---|---|---|---|
| 1 | 1. පුද්ගලික පඩිනඩි | 732,752,000.00 | 671,096,662.00 |
| | 2. වෙනත් පුනරාවර්තන වියදම් | 209,300,000.00 | 179,933,157.00 |
| | එකතුව | **942,052,000.00** | **851,029,819.00** |

**ප්‍රාග්ධන වියදම් 2017**

| **ව්‍යාපෘතිය** | **වැය විෂයය** | **2017 ඇස්තමේන්තුව (මුළු ශුද්ධ වෙන්කිරීම) රුපියල්** | **2017 සත්‍ය වියදම රුපියල්** |
|---|---|---|---|
| 1 | 1.මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම | 46,000,000.00 | 32,003,417.00 |
| | 2. මූලධන වත්කම්වල අත්පත් කර ගැනීම | 74,725,000.00 | 53,453,596.00 |
| | වෙනත් මූලධන වියදම් | 64,436,222.00 | 44,641,852.00 |
| | **එකතුව** | **185,161,222.00** | **130,098,865.00** |

**ර.නි.අ.බි. ගිණුම 2520011 – 2017**

| | අනුමත සීමාව රුපියල් | සත්‍ය සීමාව රුපියල් |
|---|---|---|
| උපරිම හර සීමාව | 48,000,000.00 | 29,792,345.61 |
| උපරිම බැර සීමාව | 30,000,000.00 | 36,297,711.78 |
| හර ශේෂයේ උපරිම සීමාව | 240,000,000.00 | 128,592,512.24 |

## II. ප්‍රසම්පාදන අංශය

| අනු අංකය | ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් | 2017 වර්ෂය සඳහා ඇස්තමේන්තු මුදල (රු. මිලියන) | වැය කරන ලද මුදල (රු. මිලියන) 2017.12.31 දක්වා |
|---|---|---|---|
| 01 | ලිපි ද්‍රව්‍ය - පළමු මාස 06 සහ දෙවන මාස 06 | 07 | 13.34 |
| 02 | ටෝනර් - පළමු මාස 06 සහ දෙවන මාස 06 | 04 | |
| 03 | ලිපි ද්‍රව්‍ය (මුද්‍රණ අංශය) - පළමු මාස 06 සහ දෙවන මාස 06 | 02 | |
| 04 | ටයර් - පළමු මාස 06 සහ දෙවන මාස 06 | 2.4 | 1.41 |
| 05 | සුළු ප්‍රාග්ධන භාණ්ඩ | 02 | 0.25 |
| 06 | ඩුප්ලෝ රිසෝග්‍රාෆ් යන්ත්‍රය (මුද්‍රණ අංශය) | 01 | 1.1 |
| 07 | ඩිජිටල් කොනිකා මිනොල්ටා යන්ත්‍ර සඳහා UPS යන්ත්‍රය | 01 | 0.52 |
| 08 | සර්වර් කාමරය සඳහා උපස්ථ විදුලිබල සැපයුම නවීකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම. **(යන්ත්‍ර සවි කිරීම් කටයුතු සිදු කරමින් පවතී.)** | 06 | - |
| 09 | මෘදුකාංග සංවර්ධනය | 02 | 2.18 |
| 10 | වාහන **(කොන්ත්‍රාත්තුව පිරිනමන ලද ආයතනය විසින් අදාල වක්‍රලේඛ වලට අනුකූලව වාහන සැපයීමට අපොහොසත් වූ බැවින් නැවත මිල ගණන් කැඳවීමට අනුමැතිය ලැබීඇත.)** | 5.75 | - |
| 11 | උද්‍යාන හා සනීපාරක්ෂක සේවාව **(2018 වර්ෂය සඳහා මිල ගණන් කැඳවා ඇත.)** | 08 | 5.65 |
| 12 | ගොඩනැගිලි නඩත්තු සේවාව **( ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ඉටු කිරීමට නොහැකි විය.)** | 02 | - |
| 13 | ADB ව්‍යාපෘතිය සඳහා ටැබ්ලට් පරිගණක මිලදී ගැනීම. | 2.5 | 2.14 |
| 14 | දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල සඳහා Roller Blinds යෙදීම. | 5 | 3.3 |
| 15 | පරිගණක හා ආශ්‍රිත උපාංග මිලදී ගැනීම. | 4 | 3.1 |

## 3.17 අභ්‍යන්තර විගණන අංශය

2017 වර්ෂයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් ඉටු කළ කාර්යයන්ගේ කාර්යසාධනය පහත පරිදි වේ.

- 2017 වර්ෂය සඳහා මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ වල (නුවර, මාතලේ, කොළඹ, අනුරාධපුරය, පොළොන්නරුව හා හම්බන්තොට) අභ්‍යන්තර විගණන පරීක්ෂාව හා වාර්තා ඉදිරිපත් කිරීම.
- 2016 වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද සමීක්ෂණ වල වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය (වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය 2015, වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය 2015, තේ රබර් පොල් වගාවන් පිළිබඳ නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තු) පරීක්ෂා කිරීම හා අදාල විගණන වාර්තා ඉදිරිපත් කිරීම.
- දත්ත නිකුත් කිරීමේ අංශයේ අභ්‍යන්තර විගණන පරීක්ෂාව හා වාර්තාව ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ මුද්‍රණ අංශයේ අභ්‍යන්තර විගණන පරීක්ෂාව හා වාර්තාව ඉදිරිපත් කිරීම.
- වාහන පිරිවැය වාර්තාව පරීක්ෂා කිරීම, ප්‍රවාහන අංශයේ වාහන ධාවනය පිළිබඳ නියදි පරීක්ෂාව හා විගණන වාර්තාව ඉදිරිපත් කිරීම.
- 2016 දෙසැම්බර් හා 2017 වර්ෂයේ ජනවාරි, මැයි, සැප්තැම්බර් හා ඔක්තොම්බර් මාස වල බැංකු සැසඳුම් වාර්තා පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කිරීම.
- 2016 හා 2017 වර්ෂ වල මාස කිහිපයක වවුචර පත් පරීක්ෂාව හා විගණන වාර්තා ඉදිරිපත් කිරීම.
- සෞඛ්‍ය අමාත්‍යාංශයේ පිහිටි සංඛ්‍යාලේඛන අංශයේ හා රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ පිහිටි සංඛ්‍යාලේඛන අංශයේ අභ්‍යන්තර විගණන පරීක්ෂාව හා වාර්තාව ඉදිරිපත් කිරීම.
- 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂා කිරීම.
- මිල හා වේතන අංශයේ මිල ගණන් රැස් කිරීමට අදාල සුළු මුදල් අග්‍රිම පරීක්ෂා කිරීම.
- 2017 වර්ෂයේ (ප්‍රකාශන අංශය, ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය, ජාතික ගිණුම් අංශය, පර්යේෂණ හා විශේෂ අධ්‍යාන අංශය, පුස්තකාල අංශය, මිල හා වේතන අංශය, කෘෂිකාර්මික හා පාරිසරික අංශය, කර්මාන්ත ඉදිකිරීම් වෙළඳ හා සේවා අංශය හා ගිණුම් අංශය යන අංශ වල) නිවාඩු පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛනය හා ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය, මිල හා වේතන අංශය, පුස්තකාල අංශය, පර්යේෂණ හා විශේෂ අධ්‍යයන අංශය යන අංශ වල බඩු වට්ටෝරු ලේඛන හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා පරීක්ෂාව හා විගණන වාර්තා ඉදිරිපත් කිරීම.
- උද්‍යාන හා සනීපාරක්ෂක සේවාව ඇගයීම හා ඊට අදාල ගෙවීම් පිළිබඳ පරීක්ෂාව හා වාර්තාව ඉදිරිපත් කිරීම.
- ක්ෂේත්‍ර කළමනාකරණ අංශයේ පෞද්ගලික ලිපිගොනු හා රාජකාරි ලැයිස්තු පරීක්ෂාව හා ඊට අදාල වාර්තාව ඉදිරිපත් කිරීම.
- 2017 ක්‍රියාකාරී සැලැස්මේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පරීක්ෂා කිරීම හා වාර්තාව ඉදිරිපත් කිරීම.
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් B ගිණුම පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වූ කරුණු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම.
- ගිණුම් අංශයේ මාසික ගිණුම් සාරාංශ, මුදල් පොත්, වර්ගීකරණ ලේඛන, 2016 විසර්ජන ගිණුම පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කිරීම.
- 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වාර්ෂිකව පවත්වන සමීක්ෂණ හා සංගණන වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය නියදි පරීක්ෂාව හා ඊට අදාල වාර්තාව ඉදිරිපත් කිරීම.
- 2016 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම.
- පුස්තකාල අංශයේ අභ්‍යන්තර විගණන පරීක්ෂාව හා අදාල වාර්තාව ඉදිරිපත් කිරීම.
- 2017 වර්ෂයේ පොදු තැන්පත් ගිණුම නියදි පරීක්ෂාව හා ඊට අදාල වාර්තාව ඉදිරිපත් කිරීම.
- අන්තර්ජාතික මිල සැසඳීමේ සමීක්ෂණයේ මූලික කරුණු පිළිබඳ පරීක්ෂාවක් සිදු කිරීම.
- දෙපාර්තමේන්තුවේ සංචිත වාහන භාවිතය පරීක්ෂාව හා ඊට අදාල වාර්තාව ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ ආරක්ෂක අංශය සම්බන්ධයෙන් විගණන පරීක්ෂාවක් සිදු කර වාර්තාව ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නියදි පරීක්ෂාව හා අදාල විගණන වාර්තාව ඉදිරිපත් කිරීම.
- ගිණුම් අංශයේ වැටුප් ලෙජර හා වැටුප් ලේඛන නියදි පරීක්ෂාව හා විගණන වාර්තාව ඉදිරිපත් කිරීම.

- 2017/11/15 දිනට ක්‍රියාකාරී සැලැස්මේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පරීක්ෂාව.
- දෙපාර්තමේන්තුව තුළ මාසික අභ්‍යන්තර විගණන රැස්වීම් පැවැත්වීම.
- 2017 වර්ෂය සඳහා කළමනාකරණ විගණන කමිටු රැස්වීම් 4ක් පැවැත්වීම.

# 4.0 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන අංශයන්හි කාර්ය සාධනය

## 4.1 වාර්ෂික රැකීරක්ෂා සමීක්ෂණය

මෙමගින් දිවයිනේ පිහිටි පෞද්ගලික හා අර්ධ රාජ්‍ය යන දෙඅංශයෙහි සේවක අර්ථසාධක අරමුදලට දායකවන ව්‍යාපාර සහ සේවා ආයතන සම්බන්ධව වසරේ ජුනි මස අවසන් වැඩ කරන දිනය පදනම්ව තොරතුරු , ස්ථර අනුව ප්‍රමාණයට සමානුපාතිකව තෝරාගත් නියැදියක් ඇසුරින් තැපැල් මගින් වාර්ෂිකව තොරතුරු රැස් කිරීම සිදු කරනු ලැබේ. මෙම වාර්තාව මගින් දිවයිනෙහි සංවිධානය වූ සේවා නියුක්තිය, කර්මාන්ත හා වෘත්තීය වර්ගීකරණ තොරතුරු ඇතුළුව කම්කරු ක්ෂේත්‍රට අදාළ තවත් තොරතුරු රැසක් වාර්ෂිකව පවත්වනු ලබන " Annual Employment Survey " ප්‍රකාශනය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2016 වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත්කරන ලදී.

## 4.2 සාමාන්‍ය ඉපැයීම් සහ වැඩ කල පැය ගණන පිළිබඳ සමීක්ෂණය

මෙම සමීක්ෂණය මගින් පඩි පාලක සභා ආඥා පනත යටතේ වේතන ගෙවනු ලබන ආයතනවල පවතින සේවා තත්ත්ව අනුව සේවකයින්ගේ ඉපැයීම් වල වෙනස්වීමේ ආකාරය අධ්‍යයනය කරනු ලබයි. මෙහිදී පඩිපාලක සභා අනුව තෝරාගත් ආයතන වලින් සෑම වසරකම මාර්තු සහ සැප්තැම්බර් මාස වලදී වර්ෂයකට දෙවරක් තැපැල් මාර්ගිකව තොරතුරු රැස්කරනු ලබයි. එක් එක් සේවා තත්ත්ව අනුව ඉපැයීම් පිළිබද තොරතුරු රැස් කර වාර්ෂිකව ප්‍රකාශයට පත්කරනු ලබන " The Survey on Hours of Actually Worked and Average Earnings " ප්‍රකාශණය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර එමගින් සේවා තත්ත්ව අනුව ඉපැයීම් රටාව විග්‍රහ කරනු ලැබේ. 2016 වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත්කරන ලදී.

## 4.3 පඩිපාලක සභා අවම වැටුප් දර්ශකාංකය ගණනය කිරීම

පඩි පාලක සභා ආඥා පනත යටතේ කම්කරු දෙපාර්තමේන්තුව මගින් පඩි පාලක සභා අනුව නියම කරනු ලබන අවම වැටුප් පදනම් කොට මාසිකව අවම වැටුප් අනුපාත දර්ශකාංකය ගණනය කරනු ලැබේ. මෙම දර්ශකාංකය කෘෂි (වැවිලි අංශය) කර්මාන්ත, වාණිජ, සේවා යන ප්‍රධාන අංශ සඳහා වෙන් වෙන්ව හා ඒකාබද්ධව ගණනය කරනු ලබන අතර එමගින් ආර්ථිකයේ ප්‍රධාන අංශ වල අවම වැටුප් මට්ටම්වල වෙනස්වීම නිරීක්ෂණය කරනු ලැබේ. ඉහත දර්ශකය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇතුළු විවිධ ආයතන වලට මාසිකව, කාර්තුමය සහ වාර්ෂික මට්ටම් වලින් ලබාදෙනු ලැබේ. 2017 ඔක්තෝබර් මාසය දක්වා ලබා දී ඇත.

## 4.4 කම්කරු සංඛ්‍යාති ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීම

දේශීය දත්ත ප්‍රයෝජනයට ගන්නන් සඳහා ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳ පොල ආශ්‍රිත කම්කරු සංඛ්‍යාතීන් හා ඒ සමග සහ සම්බන්ධ වූ ජනගහනය හා ප්‍රජා විද්‍යාත්මක තොරතුරු සහ ශ්‍රම බලකාය, මිල, වැටුප් හා ආදායම් වියදම් සම්බන්ධව සාමාන්‍ය සමාජ ආර්ථික සහ කම්කරු සම්බන්ධතා, කම්කරු ආඥා පනත් ක්‍රියාත්මක කිරීම පිළිබඳව තොරතුරු අඩංගු " කම්කරු සංඛ්‍යාති" ප්‍රකාශනය වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන අතර, මේ සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට අමතරව ශ්‍රී ලංකාවේ විවිධ දෙපාර්තමේන්තු සහ ආයතන වලින් අවශ්‍ය තොරතුරු ලබා ගනු ලැබේ. 2016 වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම සඳහා සකස්කරන ලදී.

## 4.5 සේවක අර්ථසාධක අරමුදලට දායක වන නව ආයතන ලියාපදිංචි කිරීම

සේවක අර්ථසාධක අරමුදලට දායක වන නව ආයතන ශ්‍රී ලංකා සම්මත කර්මාන්ත වර්ගීකරණය (Sri Lanka Standard Industry Classification) මත CSpro දත්ත පද්ධතියක් වෙත ඇතුලත් කර තොරතුරු යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබේ.

## 4.6 අධ්‍යාපන සංඛ්‍යාති

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාපිත කොට ඇති සංඛ්‍යාලේඛන ශාඛාව මඟින් වාර්ෂිකව සිදුකරනු ලබන දිවයින පුරා පිහිටි රජයේ පාසල්, පුද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, පිරිවෙන්, ගුරු අභ්‍යාස විද්‍යාල හා අධ්‍යාපන විද්‍යාපීඨ හා නොවිධිමත් අධ්‍යාපන ආයතන යන අංශයන්හි පාසල් තොරතුරු, ශිෂ්‍ය තොරතුරු හා ගුරු තොරතුරු ඉතාමත් නිවැරදි හා කාලීනව නවීනතම ක්‍රමවේද භාවිතා කරමින් දත්ත රැස් කිරීම හා අදාළ දත්ත පාදකය සකස් කරන ලදී.

සෑම දෙසතියකම අධ්‍යාපන අමාත්‍යාංශයේ එක් එක් ශාඛා මගින් පවත්වන උත්සව හා විශේෂ වැඩසටහන් පිළිබඳ තොරතුරු ලබාගෙන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කිරීමට හා දිනපතා ප්‍රදර්ශන පුවරු හරහා දැනුවත් කිරීමට කටයුතු කිරීම.

2016 හා 2017 වර්ෂවලට අදාළ රජයේ පාසල්, පිරිවෙන්, පෞද්ගලික පාසල්, ගුරු අභ්‍යාස විද්‍යාල හා අධ්‍යාපන විද්‍යාපීඨ පිළිබඳ හා නොවිධිමත් අධ්‍යාපන අංශයන්හි සංගණන කටයුතු අවසන් කර අදාළ දත්ත පද්ධති සකස් කර අවසන් වී ඇති අතර, එම වර්ෂවලට අදාළ මූලික වාර්තා නිකුත් කර ඇත.

## 4.7 රේගු සංඛ්‍යාති

ශ්‍රී ලංකා රේගුවේ ස්වයංක්‍රීය දත්ත සැකසුම් අංශයෙන් පරිගණක ගත කරන ලද ආනයන/අපනයන සම්බන්ධ දත්ත දිනපතාම ලබා ගැනීමත් බාහිර වෙළඳ සංඛ්‍යාති වලට අදාල තොරතුරු සකස් කිරීමත් ආනයන/අපනයන හා ප්‍රති අපනයන ලෙස දත්ත වෙන්කර ගොනු සකස් කිරීමත් දෝෂ සහිත දත්ත නිවැරදි කරමින් මාසික දෝෂ රහිත පරිගණක දත්ත ගොනු සකස් කිරීම හා සංඛ්‍යාන දත්ත අලෙවි අංශය කාර්යක්ෂමව පවත්වාගෙන යාමත් වගකීම් දරන ප්‍රධාන ක්ෂේත්‍ර වේ. බාහිර වෙළඳ සංඛ්‍යාති අදාල මාසය අවසන්ව දින 15 ක කාලය තුලදී මාසිකව සකස් කර ශ්‍රී ලංකා මහ බැංකුවට,මහ භාණ්ඩාගාරයට, ජාතික ගිණුම් සකස් කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට,විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට ,දේශීය හා විදේශීය ආයතන වලට, තානාපති කාර්යාල වලට හා පර්යේෂකයන්ට නිකුත් කර ඇත.

## 4.8 වෛද්‍ය සංඛ්‍යාති

වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශය මඟින් රට පුරා විසිරී ඇති රජයේ රෝහල් පද්ධතියේ, අභ්‍යන්තර රෝගී හා මරණ, රෝගී ඇඳන්, සායන, බාහිර රෝගීන්, මාතෘ හා ළමා, මානව සම්පත්, විශේෂඥ වෛද්‍යවරුන් හා දන්ත වෛද්‍ය සේවා යන ක්ෂේත්‍රයන් පිළිබඳව දත්ත රැස් කරන අතර අදාල ආකෘති පත්‍ර එම ආයතන වෙත නිකුත් කර, සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර නියමිත කාලයේදී ලබා ගනී. 2017 හි අවසාන කාර්තුවට අදාලව අභ්‍යන්තර රෝගීන් පිළිබඳ දත්ත, සායන හා බාහිර රෝගීන් පිළිබඳ දත්ත 2018 ජනවාරි මාසය ඇතුලත ලැබීමට නියමිත අතර, මුළු රෝහල් සංඛ්‍යාවෙන් 75% ක පමණ මාසිකව ලැබෙන මාතෘ හා ළමා සංඛ්‍යාති දත්ත වාර්තා 2017 ඔක්තෝම්බර් මාසය දක්වා අංශය වෙත ලබා දී ඇත. 2017.12.31 ට අදාලව රැස් කරන මානව සම්පත්, විශේෂඥ වෛද්‍ය හා රෝගී ඇඳන් සංඛ්‍යාලේඛන 2018 ජනවාරි මාසය ඇතුලත ලැබීමට නියමිතය. දන්ත වෛද්‍ය සේවා සංඛ්‍යාලේඛන වලට අදාල මාසික වාර්තා මහරගම, මුඛ සෞඛ්‍ය ආයතනය හරහා අංශයට ලැබේ.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 26 ට හා අමාත්‍යාංශය වෙත පසුගිය වසරෙහි ආයතන ලැයිස්තුව ලබා දී 2017 වර්ෂය සඳහා අදාල ආයතන ලැයිස්තුව යාවත්කාලීන කරන ලදි.

2015 හා 2016 වර්ෂයන්ට අදාලව දත්ත පරිසනකගත කිරීම හා දත්ත විශ්ලේෂණය කිරීම අවසන් කර ඇත. 2017 වර්ෂයේ දත්ත වලින්ද 40% ක් පමණ පරිසනකගත කර අවසන් කර ඇත. 2016 වර්ෂයේ දන්ත වෛද්‍ය සේවය පිළිබඳ දත්ත පරිසනකගත කර අවසන් කරන ලද අතර 2017 වර්ෂයේ දත්ත ඇතුලත් කරමින් පවතී.

2017 වර්ෂයේදී 2015 හා 2016 වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහයන් සකස් කිරීම අංශයේ ඉලක්කය විය.

2015 වර්ෂයට අදාල වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහයේ වැඩ කටයුතු අවසන් කර ප්‍රකාශයට පත් කරන ලද අතර එය සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියට ද ඇතුලත් කරන ලදී.

2016 වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහයේ 5 වන හා 6 වන පරිච්ඡේද සඳහා අදාල අංශවලින් ලද ලිපි එකතු කර ප්‍රකාශයට සුදුසු පරිදි සකස් කරමින් පවතී.

eIMMR අභ්‍යන්තර රෝගීන් පිළිබඳ වාර්තා මෘදු පිටපතක් ලෙස ලබා ගැනීම, පද්ධතිය වැඩි දියුණු කිරීම හා තව දුරටත් ව්‍යාප්ත කිරීම සිදු කරන ලදී.2010 වර්ෂයේදී හඳුන්වා දුන් eIMMR ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී රෝහල්වල ස්ථාපනය කිරීම ආරම්භ කළ අතර 2013 වර්ෂයේදී රෝහල් 98 ක සාර්ථකව ස්ථාපනය කිරීමට හැකි විය. එමෙන්ම 2014 වර්ෂයේදී අළුතින් රෝහල් 75 ක්ද, 2015 වර්ෂයේදී අළුතින් රෝහල් 127 ක්ද, 2016 වර්ෂයේදී අළුතින් රෝහල් 124 ක්ද, 2017 වර්ෂයේදී අළුතින් රෝහල් 65 ක්ද ඇතුලත් වූ අතර දැනට මෙම ව්‍යාපෘතිය රට පුරා රෝහල් 489 ක ක්‍රියාත්මක වේ.

2017 වර්ෂය සඳහා සෞ. වෛ. නි. කාර්යාල මට්ටමින් ජනගහන ඇස්තමේන්තු සකස් කර ප්‍රකාශයට පත් කරන ලදි. මේ සඳහා ජන හා නිවාස සංගණනය - 2012 හි අවසාන වාර්තාවෙහි ග්‍රා. නි. කොට්ඨාශ ජනගහනය පාදක කර ගනු ලැබීය. 2018 ජනගහන ඇස්තමේන්තුව පිළියෙළ කිරීමට අවශ්‍ය සෞ.වෛ.නි. කාර්යාල ලැයිස්තුව යාවත්කාලීන කිරීමද නිම කර ඇත.

වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශයේ නිලධාරීන් කණ්ඩායම් 4 ක් දිවයින පුරා ඇති පෞද්ගලික හා රජයේ දේශීය වෛද්‍ය අංශයේ රෝහල් වෙත ගොස් ආයතන රාමුවක් සකස් කරන ලදි. මෙම වැඩසටහන ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද අතර එහිදී ලබා ගත් දත්ත විශ්ලේෂණය කර මූලික වාර්තාවක්ද සකස් කරන ලදි.

වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශය මඟින් ඉටු කරන ලද අමතර රාජකාරි කටයුතු;

- 2017 වර්ෂයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 26 හිම eIMMR පද්ධතිය සම්බන්ධ පුහුණු වැඩසටහන් පවත්වන ලදි.
- කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සිසුන්, වෛද්‍ය සංඛ්‍යාලේඛන පිළිබඳව දැනුවත් කිරීම සඳහා දේශන පවත්වන ලදි.
- එමෙන්ම සෞඛ්‍ය දත්ත භාවිත කරන්නන්ගේ දත්ත ඉල්ලීම් සඳහා ඉතා ඉක්මණින් දත්ත නිකුත් කරන ලදි.
- සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහය ප්‍රතිසංවිධානය කළ යුතු බවට යෝජනා කරන ලද අතර ඒ සඳහා වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශයේ සක්‍රිය දායකත්වය ලබා දෙන ලදි. මේ සඳහා වැඩමුළු කිහිපයක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හා විදේශ නියෝජිතයෙකුගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර එහිදී ලිපි සැකසිය යුතු ආකාරය ගැන උපදෙස් දෙන ලදි. එම උපදෙස් පරිදි අදාළ අංශ මගින් ලිපි සකස් කරමින් පවතින අතර ලිපි ලැබිය යුතු අංශ 9 කින් පමණ තවමත් ලිපි ලැබී නැත.

- සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල ආයතන සඳහා අනන්‍ය අංකයක් ලබා යුතු බවට යෝජනා කරන ලදි. ඒ සඳහා වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශය මගින් වාර්ෂිකව යාවත්කාලීන කරනු ලබන ආයතන ලැයිස්තුව පාදක කර ගත් අතර ඒ සඳහා වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශයේ සක්‍රිය දායකත්වය ලබා දෙන ලදි. එමෙන්ම එසේ සකස් කරන ලද ආයතන ලැයිස්තුව හා එක් එක් ආයතන සඳහා ලබා දුන් අනන්‍ය අංක ඇතුලත් ලැයිස්තුව සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත.

## 4.9 ජීව සංඛ්‍යාති

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය මගින් ශ්‍රී ලංකාවේ වාර්ෂිකව ලියාපදිංචි කරනු ලබන උපත්, විවාහ හා මරණ සංඛ්‍යාව හා ඊට අදාල ප්‍රජා විද්‍යාත්මක තොරතුරු හා මරණයට හේතු යන දත්ත රැස් කොට එම තොරතුරු වාර්තා මගින් ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලබයි.මේ වන විට 2011, 2012, 2014,2015 වසර සඳහා මරණයට හේතු කේත කිරීම හා පරිගණක ගත කිරීම සිදු කරමින් පවතී. එමෙන්ම, 2014 වසර සඳහා උපත් හා මරණ වලට අදාළ අවසන් දත්ත ගොනු සකස් කිරීම නිම කර ඇති අතර 2015 වසර සඳහා එම තොරතුරු පරිගණක ගත කරමින් පවතී. 2016 සහ 2017 වසර වලට අදාල ප්‍රජාවිද්‍යාත්මක දත්ත මේ වන විට දිස්ත්‍රික් කාර්යාල වලින් ලැබෙමින් පවතී.

මීට අමතරව මධ්‍ය වාර්ෂික ජනගහනය ඇස්තමේන්තු කිරීමේ කටයුතු මෙම අංශය මගින් සිදු කෙරෙන අතර 2017 වර්ෂය සඳහා වයස් කාණ්ඩ සහ දිස්ත්‍රික් අනුව මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තු සකස් කර දත්ත භාවිතා කරන්නන්ට ලබා දී ඇත. 2016 වර්ෂයට අදාල ජීව සංඛ්‍යාති දර්ශක (එනම් දළ උපත් අනුපාතිකය, දළ මරණ අනුපාතිකය, ජනගහන ඝනත්වය, උපතේදී පුමිතිරි අනුපාතය, ජනගහන වර්ධන අනුපාතිකය, ස්වභාවික වර්ධන අනුපාතිකය හා යැපුම් අනුපාතය) සකස් කිරීම අවසන් කර ඇත.

එලෙසින්ම, සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව, ලෝක සෞඛ්‍යය සංවිධානය ඇතුළු දේශීය මෙන්ම ජාත්‍යන්තර ආයතන හා පුද්ගලයින් විසින් කරනු ලබන දත්ත ඉල්ලීම් සඳහා දත්ත හා තොරතුරු ලබා දීම ද නිරන්තරයෙන්ම සිදු කරනු ලබයි.

## 4.10 ධීවර සංඛ්‍යාති

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ පිහිටුවා ඇති සංඛ්‍යාලේඛන ශාඛාව මගින් 2017 වර්ෂය තුල පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

I. වෙරළාශ්‍රිත හා ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදන හා පිළිබඳ දත්ත ප්‍රකාශයට පත් කිරීම.
II. මිරිදිය හා ජලජීවී මත්ස්‍ය නිෂ්පාදන පිළිබඳ දත්ත ප්‍රකාශයට පත් කිරීම.
III. මත්ස්‍ය නිෂ්පාදන අලෙවියේ තොග සහ සිල්ලර මිල ගණන් රැස් කොට ප්‍රකාශයට පත් කිරීම.
IV. මත්ස්‍ය ආනයන හා අපනයන දත්ත ප්‍රකාශයට පත් කිරීම.

පහත නම් සඳහන් සමීක්ෂණ වාර්තා ප්‍රකාශයට පත්කොට ඇත.

I. Baseline Survey for Fisheries
II. ටින් මාළු නිෂ්පාදන සමීක්ෂණය

මීට අමතරව දෙපාර්තමේන්තු ප්‍රකාශන සඳහා අවශ්‍ය දත්ත ලබා දී ඇති අතර ශ්‍රී ලංකා මහ බැංකුව, ඉන්දියානු සාගර ටූනා කොමිසම(IOTC) හා ආහාර හා කෘෂිකර්ම සංවිධානය(FAO) යන ආයතන සඳහා ද දත්ත ලබා දෙන ලදී.

**ධිවර සංඛ්‍යාති වාර්තාව- 2017**

මෙම ප්‍රකාශනය පිළියෙල කොට ඇති අතර ඉදිරියේදී මුද්‍රණය කිරීමට නියමිතය.

**වෙරළාශ්‍රිත ධීවර සමීක්ෂණය**

මෙම සමීක්ෂණයට අදාල ප්‍රශ්ණාවලි හා උපදෙස් මාලාව පිළියෙල කරමින් පවතී.